SLECIC

# වාර්ෂික වාර්තාව - 2020
# ஆண்டறிக்கை - 2020
# ANNUAL REPORT - 2020

**ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව**

இலங்கை ஏற்றுமதி கடன் காப்புறுதி கூட்டுத்தாபனம்

**SRI LANKA EXPORT CREDIT INSURANCE CORPORATION**

SLECIC

# වාර්ෂික වාර්තාව 2020

# ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව

අප ආයතනය 1978 අංක 15 දරන ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථා පනත යටතේ ස්ථාපිත කරන ලද ආයතනයකි. එම පනත ආයතනය ක්‍රියාත්මක කලයුතු ක්‍රමවේදයන් පිළිබඳව මගපෙන්වීමක් ඉදිරිපත් කර තිබේ.

# වාර්ෂික වාර්තාව – 2020

## ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව

ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව (SLECIC), එම ආයතනයේ මෙහෙයුම් කටයුතු සඳහා මගපෙන්වනු ලබන්නාවූ අරමුණු සමූහයක් ද නිශ්චිතව දක්වනු ලබන්නාවූ 1978 අංක 15 දරන පනත මගින් පිහිටුවනු ලැබූ ව්‍යවසායක් වේ.



**අපගේ දැක්ම**

“අන්තර්ජාතික වෙළඳාම ප්‍රවර්ධනය කිරීමෙහි සහ සංවර්ධනය කිරීමෙහි පෙර ගමන්කරුවා බවට පත්වීම”

**අපගේ මෙහෙවර**

“අපනයනකරුවන්, බැංකු සහ අනෙකුත් මූල්‍ය ආයතන හා ආනයනකරුවන් වෙත අවශ්‍ය ආරක්ෂණය, සහාය සහ තොරතුරු ලබා දීම අපගේ කාර්යභාරයයිඅපි ඒ ඒ පුද්ගලයින්ට . විශේෂිත අයුරින් උසස් තත්වයේ සේවාවක් ලබා දීම තුළින් පාරිභෝගික අවශ්‍යතාඅභිබවා සේවය සැලසීමට උත්සුක වන්නෙමු”

# වසර පහක විශ්ලේෂණය

කාර්ය සාධන සාරාංශය (රු.මිලියන)

| SLECIC කාර්ය සාධන සාරාංශය 2016 - 2020 (රු. මිලියන) | | | | | |
|---|---|---|---|---|---|
| | **2016** | **2017** | **2018** | **2019** | **2020** |
| රක්ෂිත ව්‍යාපාර | 24,503 | 32,523 | 35,751 | 35,740 | 37,157 |
| දළ රක්ෂණ වාරික ආදායම | 179 | 238 | 224 | 226 | 204 |
| දළ හිමිකම් | 90 | 551 | 129 | 171 | 157 |
| මෙහෙයුම් වියදම් | 183 | 631 | 164 | 180 | 177 |
| මෙහෙයුම් අතිරික්තය/(පාඩු) | 194 | (161) | 419 | 277 | 288 |
| ආයෝජන ආදායම | 160 | 182 | 187 | 217 | 215 |
| ශුද්ධ අතිරික්තය/(පාඩු) | 156 | (179) | 309 | 242 | 223 |
| ප්‍රාග්ධනය හා සංචිත | 2153 | 1975 | 2386 | 2624 | 2826 |
| බදු සහ අයකිරීම් | 53 | 19 | 136 | 38 | 90 |













මෙහෙයුම් අතිරික්තය/(පාඩු) 2016 - 2020 රු. (මි)
600
400
200
0
-200
2016
2017
2018
2019
2020


ආයෝජන ආදායම 2016 - 2020 රු. (මි)
250
200
150
100
50
0
2016
2017
2018
2019
2020


ශුද්ධ අතිරික්තය/(පාඩු) 2016 - 2020 රු. (මි)
400
300
200
100
0
-100
-200
-300
2016
2017
2018
2019
2020


බදු හා අයකිරීම් 2016 - 2020 රු. (මි)
150
100
50
0
2016
2017
2018
2019
2020


ප්‍රාග්ධනය හා සංචිත 2016 - 2020 රු. (මි)
3000
2500
2000
1500
1000
500
0
2016
2017
2018
2019
2020

# සභාපතිවරයාගේ සමාලෝචනය



**ගෝලීය ආර්ථිකය**

2020 වර්ෂයෙන් ඇරඹුණු නව දශකය, දෙවන ලෝක සංග්‍රාමයෙන් පසු ඇති වූ දරුණුතම ගෝලීය අවපාතයත් සමඟ ආරම්භ වූ අතර, පෙර පැවති දරුණු ආර්ථික කඩාකප්පල් කිරීම් හා සමානවම කොවිඩ්-19 වසංගතය විසින් දිගුකාලීන ආර්ථික හා මූල්‍ය කැළැල් ඇති කරනු ඇත.

සැපයුම සහ ඉල්ලුම යන දෙඅංශයේම කම්පනයන් පිළිබිඹු කරමින්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (IMF) ලෝක ආර්ථික ඉදිරි දැක්මෙහි (ඔක්තොම්බර් 2020) ඉස්මතු කරනු ලබන්නේ 2020 වර්ෂයේ දී ලෝක ආර්ථිකය සියයට 4.4කින් පමණ කඩා වැටෙනු ඇතැයි අපේක්ෂා කරන බවත්, එක්සත් ජනපදය එහි ආර්ථිකයේ හැකිලීම් සියයට 4.3කින් ද, යුරෝපීය ආර්ථිකයන් සාමාන්‍ය වශයෙන් සියයට 8.3කින් ද, එහි විශාලතම ආර්ථිකය වන ජර්මනිය පමණක් සියයට 6.0ක හැකිලීමක් ද අත්විඳිනු ඇතැයි අපේක්ෂා කෙරෙන බවයි. ඉන්දියාව සියයට 10.3ක හැකිලීමක් ද, ජපානය සියයට 5.3ක් ද අපේක්ෂා කරන අතර, චීනය සියයට 1.9ක ධනාත්මක වර්ධනයක් අපේක්ෂා කරයි.

ගෝලීය භාණ්ඩ වෙළඳාම බොහෝ දුරට යථා තත්ත්වයට පත් වුවද, සේවා වෙළඳාම දුර්වල මට්ටමක පවතී. ජාත්‍යන්තර ගමන් සහ සංචාරක ව්‍යාපාරයට ඇති අඛණ්ඩ අවහිරතා සේවාවල නිරන්තර දුර්වලතාවයට දායක වේ. ගෝලීය මූල්‍ය තත්ත්වයන් සඳහා මුදල් ප්‍රතිපත්ති අනුග්‍රහය දක්වනු ලබන නමුත් බොහෝ රටවල පවත්නා මූල්‍ය පද්ධති දුර්වල ලක්ෂණ පෙන්වයි. ඉල්ලුම ස්ථාවර වීමත්, විශේෂයෙන් චීනයෙන් ඉහළ යන ඉල්ලුමත්, තෙල් මිලෙහි ප්‍රකෘතිමත් වීම වඩා මධ්‍යස්ථ මට්ටමක පැවතීමත් සමඟ වසරේ දෙවන භාගයේදී බොහෝ භාණ්ඩ මිල ගණන්, විශේෂයෙන්ම මූලික ලෝහවල මිල, යළි ඉහළ ගියේය.

කොවිඩ්-19 සීඝ්‍ර ලෙස නැවත නැඟී සිටීම හේතුවෙන් 2020 දෙවන භාගයේ දී දියුණු ආර්ථිකයන් තුළ ආරම්භ වූ ආර්ථිකය ප්‍රකෘතිමත් වීම හදිසියෙන්ම නතර විය. 2021 සහ ඉන් ඔබ්බට අපේක්ෂිත ප්‍රතිසාධනය, වසංගතයේ පරිණාමය මත දැඩි ලෙස රඳා පවතිනු ඇති අතර, පුලුල්ව පැතිරුනු එළදායී එන්නත්කරණය කිරීමේ හැකියාව ඒ කෙරෙහි බලපානු ඇත.

චීන ආර්ථිකය යථා තත්ත්වයට පත්වීම වේගවත්වී ඇති නමුත්, පාරිභෝගික සේවා කාර්මික නිෂ්පාදන පසුපස හඹා යාමත් සමඟ අසමාන වී ඇත.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදල පුරෝකථනය කරනුයේ, නැගී එන වෙළෙඳපොළ සහ සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන්ගෙන් (EMDEs) සියයට 80කට ආසන්න ප්‍රමාණයක්, විශේෂයෙන්ම සංචාරක ව්‍යාපාරය මත දැඩි ලෙස රඳා පවතින, ගෝලීය අගය දාමයන් තුළ ගැඹුරින් කාවැදී ඇති සහ ප්‍රධාන වශයෙන් කාර්මික භාණ්ඩ අපනයනය කරනු ලබන ආර්ථිකයන් සෘණාත්මක වර්ධනයක් අත්විඳිනු ඇති බවය.

2009 ගෝලීය පසුබෑම තුළ ඇති වූ පරිහානියට සාපේක්ෂව, 2020 දී සියයට 9.5කින් ගෝලීය වෙළඳාම හැකිලෙනු ඇතැයි පුරෝකථනය කර ඇති අතර, 2021-22 දී සියයට 5.1 සාමාන්‍යයකින් වර්ධනය වීමට පෙර ආර්ථිකයේ සැලකිය යුතු කොටසකට බලපානු ඇත.

**ශ්‍රී ලංකාවේ ආර්ථිකය**

ගෝලීය වශයෙන් අනෙකුත් බොහෝ ආර්ථිකයන් මෙන්ම ශ්‍රී ලංකා ආර්ථිකය ද වසංගතය පැතිරීම සීමා කිරීම සඳහා, විශේෂයෙන් මෙරට ඇතිවූ පළමු රැල්ල අතරතුර පනවන ලද සංචරණ සීමා හේතුවෙන් දැඩි බලපෑමට පත් විය.

මාර්තු අග වන විට ශ්‍රී ලංකාව මුළුමනින්ම අගුලු දැමීමට ලක්වූ අතර මැයි වන විට එය ක්‍රමයෙන් ඉවත් කර රට “නව සාමාන්‍යකරණය” යටතේ ක්‍රියාත්මක විය. කෙසේ වෙතත්, 2020 ඔක්තෝම්බර් මස අග භාගයේදී මිනුවන්ගොඩ සහ පෑලියගොඩ වශයෙන් ප්‍රධාන පොකුරු දෙකක් හඳුනා ගැනීමත් සමඟ සීමා කිරීම් යළි පනවන ලදී.

ව්‍යාපාරවලට පහසුකම් සැලසීමට සහ සමාජයේ අවදානමට ලක්විය හැකි කණ්ඩායම්වලට සහන සැලසීමට රජය විසින් රාජ්‍ය මූල්‍ය හා මුදල් ප්‍රතිපත්ති උත්තේජක ඇතුළු සහන ක්‍රියාමාර්ග මාලාවක් ක්‍රියාත්මක කරන ලදී. 2019 වසරේ අග භාගයේදී ආරම්භ කරන ලද රාජ්‍ය මූල්‍ය ප්‍රතිසංස්කරණ, විපතට පත් ජනතාවට ලබා දී ඇති අනෙකුත් සහන ක්‍රියාමාර්ගවලට අමතරව කොවිඩ්-19 ට එරෙහිව සටන් කිරීම සඳහා සපයන ලද මූල්‍ය උත්තේජනයක් ලෙස සලකනු ලැබේ.

සේවා අංශයේ වර්ධනයක් තිබියදීත්, කර්මාන්ත හා කෘෂිකාර්මික අංශවල පසුබෑම පිළිබිඹු කරමින්, ආර්ථිකය 2019 පළමු කාර්තුවේ සියයට 3.7ක වර්ධනයට සාපේක්ෂව 2020 එම කාර්තුවේ දී සියයට 1.6ක හැකිලීමක් පෙන්නුම් කළේය. ඉදිකිරීම් කටයුතු සහ නිෂ්පාදන ක්‍රියාකාරකම් මන්දගාමී වීම හේතුවෙන් කර්මාන්ත අංශය 2019 පළමු කාර්තුවේ සියයට 3.9ක වර්ධනයේ සිට 2020 පළමු කාර්තුව වන විට සියයට 7.8කින් සංකෝචනය විය. තේ, පොල් සහ ධීවර ක්ෂේත්‍රවල සීමිත වර්ධනය හේතුවෙන් 2019 පළමු කාර්තුවේ සියයට 5.0ක වර්ධනයට සාපේක්ෂව කෘෂිකාර්මික අංශය 2020 එම කාර්තුවේ දී සියයට 5.6කින් හැකිලී ගියේය. කෙසේ වෙතත්, පළමු කාර්තුවේදී සේවා අංශය සියයට 3.1කින් ප්‍රසාරණය විය.

2020 මුල් මාස අට තුළ තේ, රබර් සහ පොල් නිෂ්පාදනය පහත වැටුණි. අයහපත් කාලගුණික තත්ත්වයන් සහ කොවිඩ්-19 වසංගතය මගින් එම අංශයට ඇති වූ බලපෑම හේතුවෙන් 2020 මුල් මාස අට තුළ තේ නිෂ්පාදනය කිලෝග්‍රෑම් මිලියන 177.3 දක්වා සියයට 16.0කින් පහත වැටුණි.

2021 දී ආර්ථික වර්ධනය යළි යථා තත්ත්වයට පත් වීමක් අපේක්ෂා කරන අතර, රජයේ හිතකර ප්‍රතිපත්තිවල සහාය ඇතිව එය එලෙසින් පවත්වා ගැනීමට හැකි වනු ඇතැයි අපේක්ෂා කෙරේ. දේශීය නිෂ්පාදනය නංවාලීමේ ප්‍රතිපත්ති මගින් ආර්ථිකයේ විදේශීය අංශය මත එල්ල වී ඇති පීඩනය, තිරසාර පදනමක් මත ලිහිල් කෙරෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. එසේ වුවද, ඉදිරි කාලය තුළ දේශීය ආර්ථිකය ප්‍රතිසාධනය වීමේ සහ පුනර්ජීවනය වීමේ වේගය සහ ප්‍රමාණය තීරණය කිරීමේ දී දේශීයව සහ ගෝලීය වශයෙන් කොවිඩ්-19 මැඩපැවැත්වීමේ සාර්ථකත්වය තීරණාත්මක වේ.

**අපනයන කාර්ය සාධනය**

වසර තුළදී, ශ්‍රී ලංකාවේ විදේශීය අංශය මිශ්‍ර කාර්ය සාධනයක් පෙන්නුම් කරන ලදී. කොවිඩ්-19 වසංගතයේ ආරම්භක අදියරේදී දැඩි ලෙස බලපෑමට ලක් වූ විදේශීය අංශය, 2020 දෙවන භාගයේ සිට කැපී පෙනෙන ප්‍රතිසාධනයක් පෙන්නුම් කරන ලදී.

වසරේ දෙවන භාගයේදී, 2020 ජනවාරි මාසයෙන් පසු ප්‍රථම වතාවට ජූලි මාසයේ දී වෙළඳ භාණ්ඩ අපනයනය ඇ.එ.ජ. ඩොලර් බිලියනය ඉක්මවා ගිය අතර, 2020 පෙබරවාරි මාසයෙන් පසු ප්‍රථම වතාවට පෙර වසරට සාපේක්ෂව ධනාත්මක වර්ධනයක් වාර්තා කරන ලදී.

2020 සැප්තැම්බර් මාසයේදී වෙළඳ භාණ්ඩ අපනයනය පෙර වර්ෂයට සාපේක්ෂව මෙන්ම පෙර මාසයට සාපේක්ෂව ද ඉහළ ගිය අතර, ලෝකයේ වත්මන් වෙළෙඳපොළ තත්ත්වයන් මධ්‍යයේ වුව ද අපනයන අංශයේ ඔරොත්තු දීමේ හැකියාව පෙන්නුම් කරන ලදී. 2020 සැප්තැම්බර් මාසයේදී ඇමරිකානු ඩොලර් මිලියන 1000ක් වූ වෙළඳ භාණ්ඩ අපනයනය, 2019 සැප්තැම්බර් මාසයේදී ඇමරිකානු ඩොලර් මිලියන 954ක් වූ අපනයනයට සාපේක්ෂව සියයට 4.8ක වැඩි වීමකි. තවද, මෙය 2020 අගෝස්තු මාසයේදී වාර්තා වූ ඇ.එ.ජ.ඩොලර් මිලියන 947ක අපනයනයට වඩා සියයට 5.6ක වැඩි වීමකි.

2020 ඔක්තොම්බර් මාසයේදී කොවිඩ් 19 වසංගතය නැවතත් හිස එසවීමෙන් ඇතිවූ බලපෑම හේතුවෙන් වෙළඳ භාණ්ඩ අපනයනයෙන් ඉපැයීම් අඩු විය. වසංගතයේ දෙවන රැල්ල හදිසියේ පැතිරී යාම හේතුවෙන් රට තුළ, විශේෂයෙන් ඇඟලුම් කර්මාන්තයේ සැලසුම්ගත නිෂ්පාදන සහ ආධාරක සේවාවන්ට බාධා ඇති වීම හේතුවෙන් 2020 ඔක්තොම්බර් මාසයේදී වෙළඳ භාණ්ඩ අපනයනයෙන් ලද ඉපැයීම් 2019 ඔක්තොම්බර් සහ 2020 සැප්තැම්බර් මාස වලට සාපේක්ෂව අඩු විය. තවද, බොහෝ රටවල් අත්විඳින ලද කොවිඩ්-19 වසංගතයේ දෙවන රැල්ල හේතුවෙන් ශ්‍රී ලංකාවේ ප්‍රධාන අපනයන සඳහා අහිතකර ගෝලීය වෙළෙඳපොළ තත්ත්වයන් උග්‍ර වූ අතර, එය ශ්‍රී ලංකාවේ අපනයන සඳහා අඩු ඉල්ලුමක් ඇති කිරීමට හේතු විය. එහි ප්‍රතිඵලයක් ලෙස, 2020 ඔක්තෝබර් සහ 2020 නොවැම්බර් මාසවල අපනයන ආදායම ඇ.එ.ජ.ඩොලර් මිලියන 1667ක් වූ අතර එය 2019 ඔක්තෝබර් සහ නොවැම්බර් මාසවලට වඩා සියයට 14.7ක අඩු වීමකි.

පසුගිය වසරට සාපේක්ෂව සියයට 15.6ක පහත වැටීමක් වාර්තා කරමින්, වසර තුළ වෙළඳ භාණ්ඩ අපනයනයෙන් ඉපැයීම් ඇ.එ.ජ.ඩොලර් මිලියන 10,077ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

සමස්ත අපනයනයෙන් සියයට 23.2ක් වූ කෘෂිකාර්මික අපනයනවල කාර්යසාධනය 2020 වර්ෂයේදී තවදුරටත් පිරිහීමට පත්විය. තේ, නිෂ්පාදනය නොකළ දුම්කොළ සහ මුහුදු ආහාර අපනයන වල අඩු ඉපැයීම් හේතුවෙන්, 2019ට සාපේක්ෂව 2020 දී කෘෂිකාර්මික අපනයන වලින් ඉපැයීම් ඇ.එ.ජ.ඩොලර් මිලියන 2,336.2ක් දක්වා සියයට 5.1කින් අඩු විය. ශ්‍රී ලංකාවේ සමස්ත අපනයන ඉපැයීම් සඳහා දෙවන විශාලතම දායකත්වය සපයන, සියයට 12.3ක් වන තේ අපනයනයෙන් ඉපැයීම්, 2020 දී ඇ.එ.ජ.ඩොලර් මිලියන 1,240.9ක් දක්වා සියයට 7.5කින් අඩු විය. 2019 ජනවාරි-දෙසැම්බර් මාසවල කිලෝ මිලියන 292.6ක් වූ ශ්‍රී ලංකා තේ අපනයනයට සාපේක්ෂව 2020 ජනවාරි-දෙසැම්බර් කාලය සඳහා එය කිලෝ මිලියන 265.5ක් වූ අතර එය කිලෝ මිලියන 27.0ක අඩු වීමකි. අපනයන කාණ්ඩ අනුව සියලුම අංශවල අපනයන විශ්ලේෂණය කිරීමේ දී, එනම් තොග තේ, පැකට් කරන ලද තේ, බෑග්වල අසුරන ලද තේ, හරිත තේ සහ ක්ෂණික තේ, 2020 දී පහත වැටී ඇත.

කුරුඳු සහ සගන්ධ තෙල් අපනයන ප්‍රමාණය ඉහළ යෑම හේතුවෙන් කුළුබඩු අපනයන ආදායම ඇමෙරිකානු ඩොලර් මිලියන 333.5 දක්වා සියයට 6.7කින් ඉහළ ගියේය. මුහුදු ආහාර අපනයන ආදායම සියයට 27.7කින් පහත වැටුණු අතර ඊට ප්‍රධාන වශයෙන් හේතු වූයේ ඇමෙරිකා එක්සත් ජනපද වෙළඳපොළේ ඒ සඳහා ඉල්ලුම සැලකිය යුතු ලෙස පහත වැටීමයි. ඊට හාත්පසින්ම වෙනස්ව, පොල් මද නිෂ්පාදනවලින් පොල් තෙල් අපනයනය සහ පොල් මද නොවන නිෂ්පාදනවලින් පොල් කෙඳි අපනයනය ඉහළ යාම හේතුවෙන් පොල් නිෂ්පාදනවලින් ඉපැයීම් ඩොලර් මිලියන 345.2 දක්වා සියයට 4.8කින් ඉහළ ගියේය.

සමස්ත අපනයන ආදායමෙන් සියයට 76.5ක් පමණ වූ කාර්මික අපනයනවලින් ඉපැයීම් 2020 දී අඩු වූ අතර, ප්‍රධාන වශයෙන් රෙදිපිළි හා ඇඟලුම් අපනයන පහත වැටීම ඊට හේතු විය. ඒ අනුව, 2019 දී ඇ.එ.ජ. ඩොලර් මිලියන 9426.3 සිට 2020 දී ඇ.එ.ජ. ඩොලර් මිලියන 7701.7 දක්වා සියයට 18.3කින් කාර්මික අපනයන අඩු විය.

ඒ හා සමානව, ප්‍රධාන වශයෙන් නැව් සහ ගුවන්යානා ඉන්ධන වලින් සමන්විත වන ඛනිජ තෙල් නිෂ්පාදන අපනයනයෙන් ඉපැයීම් 2020 දී ඇ.එ.ජ. ඩොලර් මිලියන 373.6 දක්වා සියයට 28.3කින් අඩු විය. කොවිඩ්-19 හේතුවෙන් ගුවන් තොටුපළ වසා දැමීම සහ ගුවන් ගමන් අවලංගු කිරීම හේතුවෙන් සිදු වූ අඩු අපනයන පරිමාවන් නැව් සහ ගුවන් ඉන්ධන අපනයන ආදායම පහත වැටීමට හේතු විය. රබර් අත්වැසුම් අපනයනයෙන් ඉපැයීම් ඉහළ ගියද, ටයර් අපනයනය අඩු වීම හේතුවෙන් 2020 වසර තුළ රබර් නිෂ්පාදන අපනයන ආදායම ඇ.එ.ජ. ඩොලර් මිලියන 786.1 දක්වා සියයට 9.2කින් අඩු විය.

**සංචාරක ව්‍යාපාරයෙන් ඉපැයීම්**

කොවිඩ්-19 වසංගතය පැතිරීම සහ එහි ගෝලීය ව්‍යාප්තිය 2020 පෙබරවාරි මාසයේ සිට ගෝලීය සංචාරක කර්මාන්තයට සැලකිය යුතු ලෙස බලපෑවේය. ශ්‍රී ලංකාව ද එම ප්‍රවණතාවය අත්විඳි අතර, මාර්තු මස මැද සිට ශ්‍රී ලංකාවට සියලුම මගී ගුවන් ගමන් සහ නැව් ගමන් අත්හිටුවීමත් සමඟ 2020 අප්‍රේල් සිට නොවැම්බර් දක්වා සංචාරක පැමිණීම් වාර්තා නොවීය. කෙසේ වෙතත්, සංචාරක ව්‍යාපාරය නැවත ආරම්භ කිරීමේ නියමු ව්‍යාපෘතිය දියත් කිරීමත් සමඟ 2020 දෙසැම්බර් මාසයේදී යුක්රේන සංචාරකයින් 393 දෙනෙකු ශ්‍රී ලංකාවට පැමිණියහ. එහි ප්‍රතිඵලයක් ලෙස, 2019 වසරේ සංචාරක පැමිණීම් 1,913,702ට සාපේක්ෂව 2020 දී එම අගය 507,704ක් ලෙස වාර්තා විය. 2019 වසරේ ඇ.එ.ජ. ඩොලර් මිලියන 3607ට සාපේක්ෂව 2020 දී සංචාරක කර්මාන්තයෙන් සමුච්චිත ඉපැයීම් ඇ.එ.ජ. ඩොලර් මිලියන 957 ක් විය.

**සේවක ප්‍රේෂණ**

ජාත්‍යන්තර ඛනිජ තෙල් මිලෙහි අස්ථාවරත්වය මධ්‍යයේ බොහෝ ශ්‍රමිකයන්ගේ ප්‍රේෂණ උත්පාදනය වන මැදපෙරදිග රටවල භූ දේශපාලන වර්ධනයන් විසින් ශ්‍රමිකයන්ගේ ප්‍රේෂණවලට බලපෑම් එල්ල විය. 2020 මාර්තු, අප්‍රේල් සහ මැයි මාසවල වසංගතය පැතිරීම හේතුවෙන් 2020 මාර්තු මාසයේදී ගුවන් තොටුපළ වසා දැමීමට පෙර දකුණු කොරියාව සහ ඉතාලිය වැනි රටවලින් ආපසු පැමිණි සැලකිය යුතු සංඛ්‍යාවක් හේතුවෙන් ද සේවක ප්‍රේෂණ බලපෑමට පත්විය. කෙසේ වෙතත්, සමුච්චිත පදනමක් මත, 2019 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව 2020 මුල් මාස හය තුළ සේවක ප්‍රේෂණ ඇ.එ.ජ. ඩොලර් මිලියන 2980 දක්වා සියයට 8.9කින් අඩුවීමක් වාර්තා කළේය.

2020 නොවැම්බර් සහ දෙසැම්බර් මාසවල සේවක ප්‍රේෂණ කැපී පෙනෙන වර්ධනයක් වාර්තා කළේය. 2020 වසරේ දී සියයට 5.8ක වාර්ෂික වර්ධනයක් වාර්තා කරමින්, වසර තුළදී සේවක ප්‍රේෂණ ඇ.එ.ජ.

ඩොලර් මිලියන 7104 දක්වා ළඟා වීමට 2020 ජූනි මාසයේ සිට නිරීක්ෂණය කරන ලද වැඩිදියුණු වීම් උපකාරී විය.

කොවිඩ්-19 පැතිරීම මධ්‍යයේ විදේශීය අංශයේ වර්ධනයන්. ගෝලීය සහ දේශීය වෙළෙඳපොළ අවිනිශ්චිතතාවයන් විසින් නිර්මාණය කරන ලද ආරම්භක පීඩනය දේශීය විදේශ විනිමය වෙළෙඳපොළ තුළ, විශේෂයෙන්ම 2020 මාර්තු මාසයේ දෙවන භාගයේ දී දැනුණි. මූලික වශයෙන් සමපේක්ෂණ වෙළඳපල හැසිරීම් සහ රජයේ සුරැකුම්පත් වෙළඳපොලෙන් විදේශ ආයෝජන පිටතට ගලායාම හේතුවෙන් ශ්‍රී ලංකා රුපියලෙහි කැපී පෙනෙන අවප්‍රමාණය වීමක් දක්නට ලැබුණි. දේශීය විදේශ විනිමය වෙළෙඳපොළ තුළ යම් ප්‍රමාණයකට මැදිහත් වීම, සියලුම පුද්ගලික මෝටර් රථ සහ අත්‍යවශ්‍ය නොවන පාරිභෝගික භාණ්ඩ ආනයනය අත්හිටුවීම, ප්‍රවාහන දීමනාවක් ලෙස නිකුත් කරනු ලබන විදේශ මුදල් නෝට්ටු උපරිම වශයෙන් ඇමෙරිකානු ඩොලර් 5,000 දක්වා සීමා කිරීම හා ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී බැංකු විසින් ශ්‍රී ලංකා ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර මිලදී ගැනීම අත්හිටුවීම ඇතුළු හදිසි මෙහෙයුම් සහ ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග රැසක් මහ බැංකුව විසින් ගන්නා ලදී. විශේෂයෙන් සමපේක්ෂණ වෙළඳපල හැසිරීම් මගින් මෙහෙයවනු ලබන එවැනි විටින් විට පැවති අස්ථාවර කාලපරිච්ඡේද මධ්‍යයේ වුවද, රුපියලේ සමස්ත අවප්‍රමාණය 2020 දී ඇ.එ.ජ. ඩොලරයට සාපේක්ෂව සියයට 2.6කට සීමා විය.

## SLECIC හි කාර්ය සාධනය

ශ්‍රී ලාංකික අපනයනකරුවන්ගේ විශ්වාසනීය ව්‍යාපාරික හවුල්කරුවෙකු ලෙස, සංස්ථාව ණය උපදේශන සේවා සහ රක්ෂණාවරණ සපයයි. වෙන කවරදාටත් වඩා, කොවිඩ්-19 වසංගතය හේතුවෙන් වියදම් අවම කර ඇති කාල වලදී, මෙය සැමවිටම සාර්ථක එහෙත් විචක්ෂණශීලී ව්‍යවසායක අත්‍යවශ්‍ය අංගයක් වේ.

2020 දී අපනයන ආදායම සැලකිය යුතු ලෙස හැකිලීමකට ලක්වුවද, "විකිණුම්කරුගේ අවදානම" ණය රක්ෂණය යටතේ ආවරණය වූ නැවිගත කිරීම්, 2019 දී වාර්තා කල රු.බිලියන 35.74ට වඩා රු.මිලියන 1400ක පමණ වර්ධනයක් පෙන්නුම් කරමින් එම කාල සීමාව සඳහා රු.බිලියන 37.15ක් දක්වා ළඟාවිය.

තම රක්ෂණ හිමියන් සමඟ දිගු කාලීන සබඳතා වර්ධනය කර ගැනීම පිළිබඳව සංස්ථාව දැඩි ලෙස විශ්වාස කරන අතර එමඟින් තම ව්‍යාපාර සඳහා සැලකිය යුතු ස්ථාවර බවක් ඇති වී තිබේ.

### මූල්‍ය ප්‍රතිඵල

එවකට ජාතික අයවැය මඟින් යෝජනා කරන ලද අවසාන ආදායම් බදු අනුපාතය තීරණය කිරීමට පෙර 2018 දී සිදු කරන ලද ආදායම් බදු විශාල ලෙස වැඩි කිරීම හේතුවෙන්, අඩු ආදායම් බදු අඩුකිරීම් වලට භාජනය වූ පසුගිය වසරේ රු.මිලියන 242.25ක ලාභයට සාපේක්ෂව 2020 දෙසැම්බර් 31න් අවසන් වූ වසරේ සංස්ථාවේ ශුද්ධ ලාභය රු.මිලියන 223.35ක් විය. බදු අනුපාතය, පෙර පැවති සියයට 28ට සාපේක්ෂව සියයට 14 දක්වා අඩකින් අඩු විය. වර්ෂය අවසානයේ දී, සංස්ථාවේ මුළු වත්කම් හා සම කොටස් පිළිවෙලින් රු.මිලියන 3194ක් සහ රු.මිලියන 2934ක් විය.



**2020 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵල (රු.මිලියන)**

| | **2019** | **2020** |
|---|---|---|
| දළ වාරික ආදායම | 226.07 | 204.18 |
| වෙනත් මෙහෙයුම් ආදායම | 15.34 | 12.83 |
| මෙහෙයුම් අතිරික්තය | 276.90 | 288.37 |
| ශුද්ධ හිමිකම් | 87.74 | 95.13 |
| ආයෝජන ආදායම | 216.94 | 215.39 |
| මුළු වියදම | 180.06 | 177.10 |
| මුළු ආදායම | 456.97 | 465.47 |
| ප්‍රාග්ධනය හා සංචිත | 2624.18 | 2825.69 |
| ශුද්ධ අතිරික්තය | 242.25 | 223.35 |
| බදු සහ අයකිරීම් | 37.82 | 89.87 |

**වාරික ආදායම**

වාරික අනුපාත ව්‍යුහය ලාභ පාඩු නොමැති ප්‍රතිපත්තිය මත පදනම් වේ. ප්‍රධාන වෙළඳපොළවල් සමග සීග්‍රයෙන් දුර්වල වෙමින් පවතින ව්‍යාපාරික වාතාවරණයක් තිබියදී වුවද, වසංගතය තුළ දේශීය අපනයන සේවාදායකයන් හට තරඟකාරී වීමට උපකාර කිරීමේ අදහසින් යුතුව සංස්ථාව විසින් රට එකම වර්ගීකරණයක පවත්වා ගෙන යන ලදී.

පසුගිය වසරේ අනුරූප රු.මිලියන 226.07ට සාපේක්ෂව 2020 වසරේදී රු.මිලියන 204.18ක වාරික ආදායමක් ලබා ගැනීමට සංස්ථාව සමත් විය. කෙසේ වෙතත්, සංස්ථාව විසින් 2020 වසර සඳහා අයවැයගත වාරිකය වන රු.මිලියන 201 ඉක්මවන ලදී.

**වාරික සංයුතිය**

| සේවා කාණ්ඩය | 2019 – (රු.මිලියන) | 2020 අයවැයගත (රු.මිලියන) | 2020 සත්‍ය (රු.මිලියන) |
|---|---|---|---|
| ණය ආරක්ෂණය | 208.97 | 187.80 | 196.88 |
| ණය ඇපකර | 17.10 | 13.20 | 7.30 |
| එකතුව | 226.07 | 201.00 | 204.18 |

අපගේ මූලික නිෂ්පාදනය වන විකුණුම්කරුගේ අවදානමෙහි වාරික ආදායම, 2020 දී අයවැයගත රු.මිලියන 187.8ක වාරිකයට සාපේක්ෂව 2020 දී රු.මිලියන 196.88ක් විය. අපගේ ඇපකර යටතේ අපනයන මූල්‍ය පහත වැටීම සහ වර්ෂය තුළදී වසංගතය හේතුවෙන් සෙසු ණය ඇපකර සඳහා ඉල්ලුම අඩු වීම හේතුවෙන් ණය ඇපකර ආදායම විශාල ලෙස පහත වැටිණි.



**ආයෝජන ආදායම**

සංස්ථාවේ ආයෝජන කළඹ කළමනාකරණය කරනු ලබන්නේ ඉතා සීමිත නියාමන රාමුවක් තුළ වන අතර එහිදී සංස්ථාවේ සියලුම ආයෝජන රාජ්‍ය බැංකුවලින් එකක් හරහා සිදු කලයුතු අතර, භාණ්ඩාගාර මාර්ගෝපදේශයන් අනුව ආයෝජන සිදු කිරීම සඳහා ඇති උපකරණ ගණන සීමිතය. එබැවින්, ආයෝජන කළඹෙන් සැලකිය යුතු ප්‍රමාණයක් රාජ්‍ය බැංකු ස්ථාවර තැන්පතු වල සහ ණයකර වල පවතී. පසුගිය වසරේ රු.මිලියන 216.94ක ආයෝජන ආදායමට සාපේක්ෂව 2020 වර්ෂයේ දී එය රු.මිලියන 215.69ක් විය.




**ශුද්ධ හිමිකම්**

වත්මන් වර්ෂය, ඇතැම් අපනයන වෙළඳපොළ තුළ, විශේෂයෙන්ම සාම්ප්‍රදායික සිල්ලර වෙළඳාම තුළ වැඩි හිමිකම් ප්‍රමාණයක් දක්නට ලැබූ අභියෝගාත්මක වසරක් විය. දිගුකාලීන පැහැර හැරීම් සහ ගැණුම්කරුවන්ගේ බංකොලොත්භාවය හිමිකම් ගෙවීම් සැලකියයුතු ලෙස වැඩිවීමට හේතු විය. 2019 වසරේ රු.මිලියන 87.73ක් වූ ශුද්ධ හිමිකම් හා සැසඳීමේ දී මෙම වසරේ දී එය රු.මිලියන 95.13ක් විය.




**වෙනත් මෙහෙයුම් ආදායම**

අපගේ පහසුකම් මත අයකරනු ලබන සියළුම ආකාරයේ ගාස්තු, බිස්ඉන්ෆො ආදායම සහ ගෙවන ලද හිමිකම් ආපසු ගෙවීම් වලින් අනෙකුත් මෙහෙයුම් ආදායම සමන්විත වේ. පසුගිය වසරේ ආදායම වූ රු.මිලියන 15.34ට සාපේක්ෂව මෙම වසරේ මුළු ආදායම රු.මිලියන 12.84ක් විය. කොවිඩ්-19 වසංගතය හේතුවෙන් මෙහෙයුම් පරිමාණය අඩු වීම හේතුවෙන් ගාස්තු ආදායම සහ බිස්ඉන්ෆො ආදායම සුළු පහත වැටීමක් පෙන්නුම් කර ඇත.




**මුළු ආදායම**

වාරික ආදායම, අනෙකුත් මෙහෙයුම් ආදායම, ආයෝජන ආදායම සහ වෙනත් ආදායම් වලින් සමන්විත වන මුළු ආදායම, 2019 වසරේ රු.මිලියන 456.97ට සාපේක්ෂව 2020 වසරේ දී රු.මිලියන 465.46 ක් විය. LKAS 21 ට අනුව ලාභ හා අලාභ ගිණුමේ විනිමය



ලාභ/පාඩු සංස්ථාව විසින් හඳුනා ගත යුතුය. වර්ෂය තුළ දේශීය ව්‍යවහාර මුදල් අගය ක්ෂය වීම හේතුවෙන් වර්ෂය තුළ සංස්ථාවේ විනිමය ලාභය රු.මිලියන 30.29 කි.

**මුළු වියදම**

සෘජු වියදම් හා අනෙකුත් කළමනාකරණ වියදම් වලින් මුළු වියදම සමන්විත වේ. හිමිකම් වියදම් සහ තත්ත්ව වාර්තා පිරිවැය වලින් සෘජු වියදම සමන්විත වේ. 2019 වර්ෂයේ රු.මිලියන 96.12ට සාපේක්ෂව 2020 වර්ෂයේ දී සමස්ත සෘජු වියදම රු.මිලියන 102.36 ක් විය.




සමස්ත කළමනාකරණ වියදම 2019 වර්ෂයේ රු.මිලියන 83.91ට සාපේක්ෂව 2020 වර්ෂයේ දී රු.මිලියන 74.74ක් විය. එබැවින් පාලනය කළ හැකි පිරිවැය සැලකිය යුතු ලෙස සීමා කර ඵලදායී ලෙස කළමනාකරණය කර ගැනීමට සංස්ථාව සමත් වී තිබේ.




**රජයේ ආදායම සඳහා දායකත්වය**

අභියෝගාත්මක ව්‍යාපාර තත්ත්වයන් නොතකා, සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළදී රජයේ ආදායම සඳහා SLECIC අඛණ්ඩව දායක වී තිබේ. SLECIC හි අනාගත වගකීම් ආරක්ෂා කිරීම සඳහා පසුගිය වසර ගණනාවක් පුරා ස්වකීය ඉපැයීම් වලින් ප්‍රමාණවත් අරමුදලක් ගොඩනගා ගැනීම අවශ්‍ය විය. මෙම අරමුණ සඳහා පහසුකම් සැලසීමේ අරමුණින් යුතුව එවක නීති සම්පාදකවරුන් විසින් රජයට විවිධ බදු ගෙවීම් වලින් SLECIC ආයතනය නිදහස් කරන ලදී.




රාජ්‍ය ආයතනවල තාවකාලික අතිරික්ත භාර අරමුදල (SITSTF) නිමා කිරීමත් සමඟ සංස්ථාවේ රු.24,848,072.67ක් වටිනා ඉතිරි ආයෝජනය (උපචිත පොළිය ද ඇතුළුව) ඒකාබද්ධ අරමුදල හා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත මාරු කරන ලද අතර, ඉහත මුදල 1971 අංක 38 දරන මුදල් පනත යටතේ 2020 දී මහා භාණ්ඩාගාරයට ප්‍රේෂණය කරන ලද විශේෂ බද්දක් ලෙස සලකන ලෙසට සංස්ථාවෙන් ඉල්ලා සිටින ලදී. මීට අමතරව, සමාලෝචිත වර්ෂය තුළ ගෙවූ බදු 2019 වසරේ රු.මිලියන 37.82ට සාපේක්ෂව රු.මිලියන 65.02 දක්වා වැඩි වී ඇත. බදු බැදීම් අඩුවීම රු.මිලියන 23.08ක මූල්‍ය සේවා මත වැට් බද්ද සහ රු.මිලියන 41.94ක ආදායම් බදු වලින් සමන්විත වේ. එබැවින්, 2020 දී විශේෂ බද්ද ඇතුළුව සම්පූර්ණ බදු බැදීම රු.මිලියන 89.87 ක් විය.

**නව මුල පිරීම්**

ජාත්‍යන්තර වෙළඳාමේ වැඩිවන අවදානම් සමඟ, රක්ෂණකරුවන් විසින් ඔවුන් අනුගමනය කරන ප්‍රතිරක්ෂණ ක්‍රමවේද නිරන්තරයෙන් වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ. රක්ෂණකරුවන්ට අවදානම වඩාත් යථාර්ථවාදීව තක්සේරු කිරීමට සහ ජාත්‍යන්තර වෙළඳාමේ ඉල්ලීම් සපුරාලීම සඳහා ඉක්මනින් තීරණ ගැනීමට ප්‍රතිරක්ෂණ ක්‍රමවේදය උපකාර විය යුතුය.

- **ගැනුම්කරු ලකුණු කාඩ්පත් ආකෘතිය හඳුන්වාදීම (Buyer Score Card Model)**

  පොදුරාජ්‍ය මණ්ඩලීය ලේකම් කාර්යාලයේ තාක්ෂණික සහාය ඇතිව, සංස්ථාව විසින් 2019 වසරේ අග භාගයේ දී ගැනුම්කරුවන් ප්‍රතිරක්‍ෂණය සඳහා ලකුණු කාඩ්පත් ආකෘතියක් සකස් කිරීම ආරම්භ කළ අතර මේ වන විට ණය සීමාවන් නියම කිරීම සහ තීරණ ගැනීමේදී අනුකූලතාව සහතික කිරීම සඳහා ලකුණු කාඩ්පත් ආකෘතිය අනුගමනය කරයි.

- **හිමිකම් අත්පොත සංවර්ධනය කිරීම (Claim Manual)**

  පොදුරාජ්‍ය මණ්ඩලීය ලේකම් කාර්යාලයේ අර්ධ තාක්ෂණික සහාය ඇතිව හිමිකම් අත්පොත සැකසීම 2018 වසරේ අග භාගයේදී ආරම්භ කරන ලද අතර 2019 දෙසැම්බර් මාසයේදී එම කාර්යය අවසන් කිරීමට සංස්ථාවට හැකි වූ අතර 2020 දී හිමිකම් සැකසීම සඳහාද එය ක්‍රියාත්මක කරන ලදී.

## 2021 වර්ෂය සඳහා ඉදිරි දැක්ම

කොවිඩ්-19 වසංගතය හේතුවෙන් 2020 දී ඇති වූ බිඳවැටීමෙන් පසුව, ගෝලීය ආර්ථික නිමැවුම් 2021 දී සියයට 4 කින් විකාශනය වනු ඇතැයි අපේක්ෂා කරන නමුත්, එය පූර්ව වසංගත ප්‍රක්ෂේපණවලට වඩා සියයට 5 කට වඩා අඩු මට්ටමක තවමත් පවතී. ගෝලීය වර්ධනය 2022 දී සියයට 3.8 දක්වා මධ්‍යස්ථ වනු ඇතැයි පුරෝකථනය කර ඇති නමුත්, විභව වර්ධනය කෙරෙහි වසංගතය මඟින් ඇති වූ කල්පවත්නා හානිය හේතුවෙන් අඩු වී ඇත.

පුළුල්ව පැතිරුණු එන්නත්කරණයේ ආධාරයෙන් වසංගතය පාලනය වීමත්, තිරසාර මූල්‍ය ප්‍රතිපත්තිවල අනුග්‍රහයත් හේතුවෙන් 2021 සහ 2022 දී පිළිවෙළින් සියයට 3.3 සහ සියයට 3.5 දක්වා වර්ධනයක් සමඟ දියුණු ආර්ථිකයන් යථා තත්ත්වයට පත් වනු ඇතැයි පුරෝකථනය කර ඇති අතර එය මූල්‍ය ආධාරය අර්ධ වශයෙන් ලිහිල් කිරීම හිලව් වීමට වඩා වැඩි වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

නැගී එන වෙළෙඳපොළ සහ සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන්හි (EMDEs) වර්ධනය 2021 දී සියයට 5 දක්වා ස්ථාවර වනු ඇතැයි අපේක්ෂා කෙරෙන නමුත් EMDE නිමැවුම එහි පූර්ව වසංගත ප්‍රක්ෂේපණයට වඩා බෙහෙවින් අඩු මට්ටමක පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ. වසංගතය විසින්, දශකයක් පමණ දීර්ඝ කාලයක් පුරා පවතින ගෝලීය ණය සමුච්චිත වීම හා සම්බන්ධ අවදානම් උග්‍ර කර ඇත. ගෝලීය ආර්ථිකය, විශේෂයෙන් මූල්‍ය වෙළඳපොල ආතතියට ගොදුරු කර ගනිමින් ණය මට්ටම ඉතිහාසගත ඉහලම මට්ටම් කරා ළඟා වී ඇත. දරිද්‍රතාවය අඩු කිරීමේ අපේක්ෂාවන් යටපත් කරමින්, වසංගතය විසින් ඉදිරි දශකය තුළ විභව වර්ධනයේ දිගුකාලීන අපේක්ෂිත මන්දගාමීත්වය තවත් තියුණු කිරීමට ඉඩ ඇත. චීනයේ ශක්තිමත් ප්‍රබෝධය හේතුවෙන් නැගෙනහිර ආසියා සහ පැසිෆික් කලාපය 2021 දී කැපී පෙනෙන ලෙස ශක්තිමත් වනු ඇතැයි අපේක්ෂා කෙරෙන අතර මැද පෙරදිග සහ උතුරු අප්‍රිකාව හා උප සහරා අප්‍රිකානු කලාපවල ක්‍රියාකාරකම් දුර්වලම වනු ඇතැයි පුරෝකථනය කර ඇත.

ඉදිරි වසර තුළදී, සංස්ථාව විසින් අවදානම් ඥානාන්විත ලෙස ප්‍රතිරක්ෂණය කරනු ලබන අතර අපනයනකරුවන්ට බියකින් තොරව සුරක්ෂිතව වෙළඳාම් කිරීමට හැකි වන පරිදි උපදෙස් ලබා දෙනු ඇත. එහි අවදානම් අධීක්ෂණ පද්ධතිය තවදුරටත් ශක්තිමත් කිරීම, ණය තොරතුරු ජාලය ඒකාබද්ධ කිරීම, ප්‍රතිරක්ෂකයන් අතර ධාරිතාව ගොඩනැගීම සහ වැඩිදියුණු කළ වැඩ ක්‍රම හා තාක්ෂණික පද්ධති හරහා කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සඳහා ද අපේක්ෂා කෙරේ.

# ස්තූතිය

වසර ගණනාවක් පුරා අඛණ්ඩව SLECIC කෙරෙහි තැබූ විශ්වාසය වෙනුවෙන් ශ්‍රී ලංකාවේ අපනයනකරුවන්ගේ ප්‍රජාව, විශේෂයෙන්ම SLECIC සේවාලාභීන් සහ වාණිජ බැංකු වෙත මම ස්තූතිවන්ත වෙමි. අද අප සිටින තත්ත්වයට අප වර්ධනය කර ඇත්තේ ඔබ විසිනි.

SLECIC හි ක්‍රියාකාරකම් සහ වර්ධනය කෙරෙහි මුදල් අමාත්‍යවරයා විසින් දක්වන ක්‍රියාශීලී ප්‍රවේශය, ඔහුගේ මඟ පෙන්වීම, කැපවීම සහ දැඩි උනන්දුව පිළිබඳව මම අවංකවම ස්තූතිවන්ත වෙමි.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ප්‍රවීණ අදහස් හා නව්‍ය සිතුවිලි සහිතව විවිධාකාරයෙන් වසර පුරාම අඛණ්ඩව සංස්ථාවට මඟපෙන්වන ලදී. SLECIC වෙත ඔවුන්ගේ ඇති කැපවීම හා බැඳීම ඉතා අගය කොට සලකමි.

SLECIC කර්තව්‍ය සම්පූර්ණ කිරීම සඳහා ලබාදුන් සහයෝගය සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයා, අතිරේක ලේකම්වරුන් සහ අනෙකුත් නිලධරයන් හට මාගේ ස්තූතිය පළ කරමි. තවද, SLECIC වෙත නන් අයුරින් සහාය දැක්වීම පිළිබඳ ශ්‍රී ලංකා මහ බැංකුවේ නිලධරයන්, වාණිජ දෙපාර්තමේන්තුවේ නිලධරයන් සහ නොයෙක් වෙළඳ මණ්ඩලවල සාමාජිකයන් හා නිලධරයන් වෙත මාගේ ස්තූතිය පළ කරමි. විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩල සහ විශේෂයෙන් වෙළඳ සහායකයන් විසින් SLECIC වෙත දක්වන ලද සහයෝගය වෙනුවෙන් මාගේ විශේෂ ස්තූතිය පළ කරමි.

අප විසින් ඉල්ලා සිටින සෑම අවස්ථාවකදීම අප හට නිරන්තරයෙන්ම සහාය ලබා දුන් බර්නෝ සංගම් ලේකම් කාර්යාලයේ නිලධරයන් හා අපගේ විදේශීය හවුල්කරුවන් සහ අනෙකුත් ව්‍යාපාරික කොටස්කරුවන් වෙත මාගේ අවංක ස්තූතිය පිරිනමමි. අපනයන ණය රක්ෂණයේ තාක්ෂණික ක්ෂේත්‍රවල ඔවුන්ගේ ඒකාබද්ධ දැනුම හා සම්පත් SLECIC හට ඉමහත් ශක්තියක් වී ඇත.

කළමනාකාරිත්වයේ සහ කාර්ය මණ්ඩලයේ නොසැලෙන විශ්වාසවන්තභාවය සහ විශිෂ්ටත්වය සඳහා වූ කැපවීම පිළිබඳව මාගේ බලවත් ස්තූතිය පල කිරීමට කැමැත්තෙමි. සම්පත් මත පීඩනයක් පැවතිය ද, අවශ්‍ය අවස්ථාවන්හි දී අපගේ රක්‍ෂණ හිමියන්ට සහ අපනයනකරුවන්ට වඩාත් හොඳ සේවාවන් සැපයීම වෙනුවෙන් ඔවුන් පසුගිය වසර පුරා වෙහෙස නොබලා වැඩ කළහ. ඔවුන්ගේ මෙම කැපවීමේ ගුණය, සංස්ථාවේ සාර්ථකත්වය කෙරෙහි ඉතා වැදගත් කාර්යභාරයක් ඉටුකරන ලදී.



ජේ.එච්.විජේසිරි අඹවත්ත

**සභාපති හා කළමණාකාර අධ්‍යක්ෂ**

# අධ්‍යක්ෂ මණ්ඩලය

ඒ.එච්.විජේසිරි අඹවත්ත මහතා - **සභාපති හා කළමණාකාර අධ්‍යක්ෂ**
නීතිඥ
(2020.01.02 දින සිට බලපැවැත්වෙන පරිදි පත් කර ඇත)

කේ.එස්.එම්. ද සිල්වා මහතා
නියෝජ්‍ය අධ්‍යක්ෂ
රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව
(2020.01.11 දින සිට බලපැවැත්වෙන පරිදි පත් කර ඇත)

ටී.ඒ. ඒකනායක මිය
සහකාර අධ්‍යක්ෂ
අභ්‍යන්තර වෙළඳ, ආහාර සුරක්ෂිතතාව සහ පාරිභෝගික සුභසාධන අමාත්‍යාංශය
(2020.02.21 දින සිට බලපැවැත්වෙන පරිදි පත් කර ඇත)

එස්.එම්. පරණවිතාන මහතා
ප්‍රධාන නිලධාරී - ජීවිත රක්ෂණය
ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව
(2020.05.29 දින සිට බලපැවැත්වෙන පරිදි පත් කර ඇත)

ඒ.ඒ.එම්. තසිම් මහතා
සහකාර අධිපති
ශ්‍රී ලංකා මහ බැංකුව
(2020.07.06 දින සිට බලපැවැත්වෙන පරිදි පත් කර ඇත)

# SLECIC ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය

| | | |
|---|---|---|
| ඒ.එච්.විජේසිරි අඹවත්ත මහතා | - | සභාපති හා කළමණාකාර අධ්‍යක්ෂ |
| ඩී.එච්.ජේ. රණසිංහ මහතා | - | සාමාන්‍යාධිකාරී |
| ආර්.එම්.ශ්‍රූ.එන්. පීරිස් මිය | - | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිනී |
| ධම්මික අලුත්ගේ මහතා | - | සහකාර සාමාන්‍යාධිකාරී |
| මොහාන් සිල්වා මහතා | - | සහකාර සාමාන්‍යාධිකාරී |
| මයුරි මුදලිගේ මිය | - | සහකාර සාමාන්‍යාධිකාරිනී |

# SLECIC නිෂ්පාදන සහ සේවා

විකුණුම්කරුගේ අවදානම වශයෙන් සන්නාම් තැබූ අපනයන ණය රක්ෂණය සහ බැංකුකරුවන් සඳහා වූ ණය ඇපකර මඟින් මෙරට අපනයන ප්‍රජාවේ සුබසිද්ධිය උදෙසා SLECIC විසින් ලබාදෙන සේවාවල ප්‍රධාන කොටස සමන්විත වේ. අවහිරයකින් සහ අපහසුතාවයකින් තොරව වාණිජ බැංකුවලින් ණය මුදල් ලබා ගැනීම වඩාත් පහසුකරමින් අපනයනකරුවන්ගේ මෙහෙයුම් කටයුතුවල විෂය පථය පුළුල් කිරීම සඳහා ඔවුන්ට හැකියාව ලබාදෙමින් අපගේ සේවා මඟින් අපනයනකරුවන්ගේ මූල්‍ය සුරක්ෂිතභාවය ආරක්ෂා කරනු ලබයි.

| විකුණුම්කරුගේ අවදානම |
|---|

විකුණුම්කරුගේ අවදානම යනු අපනයන ප්‍රජාව වෙත ලබාදෙන අපගේ නිෂ්පාදන සහ සේවාවල මූලික පාදකය වේ. විකුණුම්කරුගේ අවදානම මඟින් වාණිජ සහ දේශපාලන අවදානම් හේතුවෙන් විදේශීය ගැණුම්කරුවන් විසින් ගෙවීම් පැහැර හැරීමේ හෝ ප්‍රමාද වී ගෙවීම් කිරීමේ අවදානමෙන් ආරක්ෂා කිරීමේ කාර්යය ඉටු කරනු ලබයි.

**වාණිජ අවදානම්**

- බුන්වත්භාවය හා බංකොලොත්භාවය
- ගෙවීම් පැහැර හැරීම
- ගිවිසුම් ප්‍රතික්ෂේප කිරීම

**දේශපාලන අවදානම්**

- විදේශ විනිමය ප්‍රේෂණය කිරීම ප්‍රමාද කිරීම
- ආනයන බලපත්‍ර අවලංගු කිරීම
- ආනයන තහනම් කිරීම
- ගෙවීම් තාවකාලිකව නතර කිරීම
- යුද්ධ, විප්ලව, කැරලි සහ ස්වභාවික විපත්

සංස්ථාව විසින් පිරිනමනු ලබන පුළුල් පරාසයක රක්ෂණ ඔප්පු අතරින් සම්පූර්ණ පිරිවැටුම් ආවරණ රක්ෂණ ඔප්පු වඩාත් ජනප්‍රිය වේ. විශේෂිත අංශවල අද්විතීය අවශ්‍යතා සඳහා සැපයීම් සිදුකිරීමට විශේෂ කාර්යයක් සඳහා සකස් කරන ලද පහසුකම් ද පවතී.

අපනයනකරුවන් සඳහා පිරිනමනු ලබන අපනයන ණය රක්ෂණ ප්‍රභේද පහත දැක්වේ.

**විකුණුම්කරුගේ අවදානම් රක්ෂණ ඔප්පුව - සමස්ත පිරිවැටුම - සියලු ගැණුම්කරුවන්**

වාණිජ අවදානම් සහ දේශපාලන අවදානම් වලින් අපනයනකරු ආරක්ෂා කිරීම සඳහා වූ රක්ෂණයකි. විලම්භනය කරන ලද ගෙවීම් නියමයන් මත පවතින නැව් භාණ්ඩ තොග මේ යටතේ අප විසින් ආවරණය කරනු ලැබේ.

**විකුණුම්කරුගේ අවදානම් රක්ෂණ ඔප්පුව - නිශ්චිත ගැණුම්කරු**

එක් හෝ වැඩි නිශ්චිත ගැණුම්කරුවන්ගේ වාණිජ අවදානමෙන් සහ දේශපාලන අවදානමෙන් අපනයනකරු ආරක්ෂා කිරීම සඳහා වූ රක්ෂණයකි.

**විකුණුම්කරුගේ අවදානම් රක්ෂණ ඔප්පුව - නිශ්චිත රට**

යම් නිශ්චිත රටක ගැණුම්කරුවන්ගේ වාණිජ අවදානම් වලින් සහ දේශපාලන අවදානම් වලින් අපනයනකරු ආරක්ෂා කිරීම සඳහා වූ රක්ෂණයකි.

**විකුණුම්කරුගේ අවදානම් රක්ෂණ ඔප්පුව - දේශපාලන අවදානම**

යම් නිශ්චිත රටක දේශපාලන අවදානමෙන් අපනයනකරු ආරක්ෂා කිරීම සඳහා වූ රක්ෂණයකි.

**විකුණුම්කරුගේ අවදානම් රක්ෂණ ඔප්පුව - ගෝලීය රක්ෂණ ආවරණය**

ශ්‍රී ලංකාවේ පිහිටා ඇති අක් වෙරළ අපනයන සමාගම් සඳහා සපයනු ලබන රක්ෂණයකි.

**විකුණුම්කරුගේ අවදානම් රක්ෂණ ඔප්පුව - පාලිත සමාගම් අවදානම**

මව් සමාගම ශ්‍රී ලංකාවේ පිහිටා ඇති, වෙනත් රටක පිහිටි පාලිත සමාගමක අපනයනකරුවන්ගේ අවදානම් ආවරණය කරනු ලබන රක්ෂණයකි.

**විකුණුම්කරුගේ අවදානම් රක්ෂණ ඔප්පුව - අවසාන ගැණුම්කරුවන් ආවරණය කිරීම**

ගැණුම්කරුගේ රටෙහිදී සම්පූර්ණයෙන්ම හිමිකම් දරන පාලිත සමාගමක් සඳහා නැව් භාණ්ඩ තොගය සකස් කරනු ලබන්නාවූ අවස්ථාවකදී අවසාන ගැණුම්කරුවන්ගේ වාණිජ සහ දේශපාලන අවදානම ආවරණය කරමින් ශ්‍රී ලාංකික අපනයනකරුවන් ආරක්ෂා කරනු ලබන රක්ෂණයකි.

**විකුණුම්කරුගේ අවදානම් රක්ෂණ ඔප්පුව - භාණ්ඩ තොග ප්‍රේෂණය**

භාණ්ඩ තොග ප්‍රේෂණයේ වාණිජ සහ දේශපාලන අවදානම් වලින් ශ්‍රී ලාංකික අපනයනකරුවන් ආරක්ෂා කරනු ලබන රක්ෂණ ආවරණයකි.

**විකුණුම්කරුගේ අවදානම් රක්ෂණ ඔප්පුව - අන්තරාල වෙළඳාම**

අන්තරාල වෙළඳාමේ දී ඇතිවිය හැකි වාණිජ සහ දේශපාලන අවදානම් වලින් ශ්‍රී ලාංකික අපනයනකරුවන් ආරක්ෂා කරනු ලබන රක්ෂණ ආවරණයකි.

**විකුණුම්කරුගේ අවදානම් රක්ෂණ ඔප්පුව - විකුණුම්කරුගේ අවදානම් අවබෝධතා සේවා රක්ෂණ ඔප්පුව**

සේවා අංශයේ අපනයනකරුවන් වාණිජ සහ දේශපාලන අවදානම් වලින් ආරක්ෂා කරනු ලබන රක්ෂණයකි.

**විකුණුම්කරුගේ අවදානම් රක්ෂණ ඔප්පුව - දේශීය ණය රක්ෂණය**

ශ්‍රී ලංකාවේ සිටින ස්වකීය ගැණුම්කරුවන් වෙත භාණ්ඩ භාරදීම සහ සේවා සිදුකිරීම ආශ්‍රිත වාණිජ අවදානමෙන් රක්ෂණ ඔප්පු හිමියා ආරක්ෂා කරනු ලබන රක්ෂණයකි.

**බැංකු වෙත පිරිනමනු ලබන අපනයන ණය ඇපකර**

අපනයනකරුවන්ගේ කල්ගත වූ පැහැර හැරීම් සහ බුන්වත්භාවය හේතුවෙන් අපනයනකරු විසින් අත්තිකාරම් මුදල් නොගෙවීම හේතුවෙන් බැංකු විසින් දරනු ලබන පාඩු මෙම ණය ඇපකර මඟින් ලිහිල් කරනු ලබයි. බැංකු සඳහා වූ අපගේ ණය ඇපකර විසින් අතිරේක සහ මිල අධික තැන්පතු ලබාදීම සඳහා වූ අවශ්‍යතාවය ඉවත් කිරීම තුළින් අපනයනකරුවන්ගේ මූල්‍ය අවශ්‍යතා සඳහා පහසුකම් සලස්වනු ලබයි. අපනයනකරුවන්ගේ බුන්වත්භාවය හෝ ඔවුන්ගේ පාර්ශ්වයෙන් සිදුවන කල්ගත වූ පැහැර හැරීම හේතුවෙන් බැංකු විසින් දරනු ලබන පාඩු වලින් 66.66% සිට 85% දක්වා ප්‍රමාණයක් ප්‍රතිපූරණය කිරීමට SLECIC ආයතනය භාරගෙන සිටිනු ලැබේ.

බැංකු වෙත පිරිනමනු ලබන අපනයන ණය ඇපකර ප්‍රභේද පහත දැක්වේ.

**පූර්ව නැව්ගත කිරීම් ණය ඇපකර (තනි පුද්ගල)**

තනි පුද්ගල ප්‍රතිපාර්ශ්ව අවදානම රුපියල් වලින් සහ අනෙකුත් විදේශ ව්‍යවහාර මුදල් වලින් 66.66% දක්වා ආවරණය කරනු ලැබිය හැකිවේ. ණයවර ලිපි සහ තහවුරු කිරීමේ ඇණවුම් වලට එරෙහිව අමුද්‍රව්‍ය මිලදී ගැනීම, භාණ්ඩ නිෂ්පාදනය හා සකස් කිරීම සහ අපනයන ඇසුරුම් කිරීම වෙනුවෙන් අපනයනකරුවන් හට පූර්ව නැව්ගත කිරීම් පහසුකම් ප්‍රදානය කිරීම සඳහා මෙම ඇපකර මඟින් මූල්‍ය ආයතන වෙත පහසුකම් සලස්වනු ලබයි.

**පශ්චාත් නැව්ගත කිරීම් ණය ඇපකර (තනි පුද්ගල)**

වාණිජ බැංකු වෙත මෙම ඇපකර පිරිනමනු ලබයි. පශ්චාත් නැව්ගත කිරීමේ අවස්ථාවේදී අපනයන බිල්පත් මිලදී ගැනීම, ගනුදෙනු කිරීම හෝ වට්ටම් කිරීම වෙනුවෙන් අපනයනකරුවන්ගේ කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාගැනීම සඳහා මුදල් ලබා ගැනීමට අපනයනකරුවන් හට බැංකු වෙත ප්‍රවේශ වීමේ හැකියාව මෙම ඇපකර මඟින් සහතික කරනු ලබයි.

**සම්පූර්ණ පිරිවැටුම - පූර්ව / පශ්චාත් නැව්ගත කිරීම් ණය ඇපකර**

මෙම ඇපකර මඟින් ඉහළ ආවරණයක් සහ අඩු රක්ෂණ වාරික අනුපාතිකයක් යටතේ අපනයනකරු සඳහා හෝ වක්‍ර අපනයනකරුවෙකු සඳහා පූර්ව / පශ්චාත් නැව්ගත කිරීම් අත්තිකාරම් ආකාරයෙන්

ප්‍රදානය කරනු ලබන සම්පූර්ණ අපනයන ණය ප්‍රමාණය ආවරණය කිරීම සඳහා බැංකු වෙත පහසුකම් සලස්වනු ලබයි.

**අපනයන නිෂ්පාදන ණය ඇපකර**

අතිරේක ඇප පිළිබඳ වැඩි අවධාරණය කිරීමකින් තොරව අපනයනකරුවන් වෙනුවෙන් භාණ්ඩ හා සේවා නිෂ්පාදනයේ යෙදී සිටින නිෂ්පාදකයන් හට කාරක ප්‍රාග්ධනය සපයා ගැනීමට මෙම යෝජනා ක්‍රමය මඟින් මූල්‍ය ආයතන වෙත පහසුකම් සලස්වනු ලබයි.

**අපනයන කාර්ය සාධන ඇපකර**

මෙය ශ්‍රී ලංකාවෙන් භාණ්ඩ සහ සේවා අපනයනය කිරීම සඳහා ඇතුලත් වී ඇති ගිවිසුම් නියමිත පරිදි ඉටු කිරීම සඳහා විදේශීය ගැණුම්කරුවන් හෝ රජයේ අධිකාරීන් හට ස්වකීය සේවාදායකයන් වෙනුවෙන් වාණිජ බැංකු විසින් නිකුත් කරනු ලබන ඇපකර සහ බැඳුම්කර වලට එරෙහිව වාණිජ බැංකු වෙත නිකුත් කරනු ලබන ප්‍රති ඇපකරයක් වේ. මේ සඳහා ඉදිකිරීම් කටයුතු හරහා සම්මත කාර්යසාධන අපනයන ගිවිසුම් ක්ෂේත්‍ර මෙන්ම භාණ්ඩ සහ සේවා අපනයනය කිරීමේ ක්ෂේත්‍ර ඇතුළත් වේ.

**භාණ්ඩ ප්‍රවාහකයන්ගේ නිසි කාර්යසාධන ආවරණය කරනු ලබන අපනයන කාර්ය සාධන ණය ඇපකරය**

මෙය භාණ්ඩ ප්‍රවාහකයෙකු සඳහා ණය පහසුකම් ලබාදෙන යම් ගුවන් යානා සමාගමක් සඳහා බැංකුවක් විසින් නිකුත් කරනු ලබන ඇපකර සැලකිල්ලට ගනිමින්, බැංකුව වෙත නිකුත්කරනු ලබන ප්‍රතිඇපකරයකි.

**ATA කාර්නෙට් පද්ධතිය ආවරණය කරනු ලබන අපනයන කාර්ය සාධන ඇපකර**

අපනයනකරුවන් හට ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර වාණිජ මණ්ඩලය (ICC) මඟින් ATA කාර්නෙට් ලේඛණ ලබාගැනීම සඳහා ශ්‍රී ලංකාවේ ICC වෙත මෙම ඇපකර නිකුත් කරනු ලැබේ. ATA කාර්නෙට් යනු යම් නිශ්චිත කාලසීමාවක් සඳහා යම් නිශ්චිත කාර්යයක් වෙනුවෙන්, බදු ගෙවීමෙන් තොරව තාවකාලිකව භාණ්ඩ ආනයනය කිරීම සඳහා අවසර දෙනු ලබන ජාත්‍යන්තර රේගු ලේඛනයක් වේ.

**රැකියා සඳහා විදේශගත වන ශ්‍රී ලාංකිකයන් සඳහා සංක්‍රමණ අත්තිකාරම් පිරිවැය ආවරණය කරනු ලබන සම්පූර්ණ පිරිවැටුම් ඇපකරය "APARA"**

මෙම ඇපකර යෝජනාක්‍රමය මඟින් රැකියා සඳහා විදේශගත වන ශ්‍රී ලාංකිකයන් සඳහා බැංකු විසින් ප්‍රදානය කරනු ලබන සම්පූර්ණ පූර්ව පිටත්වීම් ණය සඳහා ආවරණයක් ලබාදේ.

**වෙනත් සේවා**

**Biz Info – ණය සහ මූල්‍ය තොරතුරු**

මෙම සේවය මඟින් ශ්‍රී ලාංකික අපනයනකරුවන්ගේ සහ ආනයනකරුවන්ගේ විදේශීය ගනුදෙනුකරුවන් පිළිබඳ ණය සහ තත්ත්ව වාර්තා බැංකු අංශය වෙත සපයනු ලබයි. ලෝකය පුරා

පවතින නියෝජක ජාලයක් හරහා ණය සහ තත්ත්ව වාර්තා සපයන්නෙකු වශයෙන් SLECIC ආයතනය ක්‍රියාත්මක වේ.

# අපනයන ණය රක්ෂණය

## SLECIC ආවරණය

වර්තමානයේ දී, ශ්‍රී ලාංකික අපනයනකරුවන් හට සහාය වීම උදෙසා, මැදපෙරදිග කලාපයේ දේශපාලන අවිනිශ්චිතතාවන් මධ්‍යයේ වුවද එම රටවල් ද ඇතුලුව රටවල් 162ක දේශපාලන අවදානම් "විකුණුම්කරුගේ අවදානම් රක්ෂණ ඔප්පුව" යටතේ SLECIC විසින් ආවරණය කරනු ලබයි.

2020 වන විට කලාප 8 ක ආවරණ ව්‍යාප්තිය වගුවේ දක්වා ඇත.

| කලාපය | රටවල් සංඛ්‍යාව |
|---|---|
| අප්‍රිකාව | 39 |
| ආසියාව | 25 |
| නැ. යුරෝපය | 25 |
| බ. යුරෝපය | 23 |
| ම. ඇමෙරිකාව | 19 |
| මැදපෙරදිග | 14 |
| උ. ඇමෙරිකාව | 12 |
| ශාන්තිකර | 5 |
| **එකතුව** | **162** |




ඉහත ප්‍රස්ථාරය දෙස බැලීමෙන්, විශේෂයෙන් ඉහළ අවදානම් සහිත අප්‍රිකානු සහ මැද පෙරදිග කලාපය තුළ SLECIC හට හොඳ ආවරණයක් ඇති බව පෙනේ. අප විසින් අප්‍රිකානු කලාපයේ රටවල් 39ක්, ආසියාවේ රටවල් 25ක්, නැගෙනහිර යුරෝපයේ රටවල් 24ක් සහ මැද පෙරදිග රටවල් 13ක් ආවරණය කරනු ලබයි. ඉහළ ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා විශ්වාසයෙන් යුතුව අවදානම් වෙළෙඳපොළට පිවිසීමට කැමති ශ්‍රී ලාංකික අපනයනකරුවන්ට මෙය හිතකර සලකුණක් ලෙස සැලකිය හැකිය.

### රක්ෂණ ව්‍යාපාරය

2020 මුල් භාගයේ දී කොවිඩ්-19 වසංගතය හා සමඟම ඇති වූ ව්‍යාපාර තරඟය හේතුවෙන් හටගත් කල් පවතින අවිනිශ්චිතතාවයන් ගෝලීය ඉල්ලුමට සහ අපනයන වර්ධනයට, විශේෂයෙන් වෙළඳ භාණ්ඩ අපනයනයට බලපා ඇත. අභියෝගාත්මක වෙළෙඳපොළ පරිසරය තුළ, සංස්ථාව විසින් 2020 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලය සඳහා රු.බිලියන 37.19ක රක්ෂණ ව්‍යාපාරයක් වාර්තා කළ අතර එය පෙර වසරට වඩා රු.1400 (හෝ 3.96 %) ක වර්ධනයකි.

| රක්ෂණ ව්‍යාපාරය රු.(මි) | |
|---|---|
| වර්ෂය | එකතුව |
| 2019 | 35,740.58 |
| 2020 | 37,189.91 |



2020 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලය තුළ SLECIC හි මාසික රක්ෂණ ව්‍යාපාරය පහත ප්‍රස්ථාරය මගින් පෙන්නුම් කෙරේ.




**ඉහළම වෙළඳපොල 5**

සමාලෝචිත වර්ෂය තුළ සංස්ථාවේ සමස්ත රක්ෂණ ව්‍යාපාරයෙන් සියයට 13.5ක කොටස් හිමි ඇමෙරිකා එක්සත් ජනපදය සංස්ථාවේ විශාලතම රක්ෂණ වෙළෙඳපොළ ලෙස තවදුරටත් රැඳී සිටින අතර 2019 වර්ෂයේ දී සියයට 16ක සෘණ වර්ධනයක් වාර්තා කර ඇත. මෙම සෘණ වර්ධනය සඳහා දායක වූ නිෂ්පාදන අතරට වියළන ලද පොල්, පොල් තෙල්, කාර්මික බුරුසු, රබර් රොටි, රබර් කළාල, ටයර් සහ රබර් අත්වැසුම් ඇතුළත් වේ. වෝල් ටයිල්, සක්‍රීය කළ කාබන්, කොහු කෙඳි, කොහු මෙට්ට, සෙරමික් භාණ්ඩ සහ පෝසිලේන් ප්‍රතිමා රක්ෂණ ඔප්පු හිමියන් හට සමාලෝචිත වර්ෂය තුළ වෙළඳපොල ගැනුම්කරුවන්ගෙන් වැඩි ව්‍යාපාර ප්‍රමාණයක් අත්පත් කර ගැනීමට හැකි විය.

| **රක්ෂණ ව්‍යාපාරය ඉහළම වෙළඳපොල 5** | | | |
|---|---|---|---|
| | රට | **2020** | % |
| 1 | ඇ.එ.ජ. | රු.මි.4,845.38 | 13.5% |
| 2 | චීනය | රු.මි.4,641.50 | 13.1% |
| 3 | එ.රා. | රු.මි.2,402.21 | 6.8% |
| 4 | බ්‍රසීලය | රු.මි.1,893.55 | 5.3% |
| 5 | ප්‍රංශය | රු.මි.1,876.70 | 5.3% |
| 6 | වෙනත් | රු.මි.21,497.39 | 56.0% |
| | එකතුව | රු.මි.37,156.73 | **100.0%** |

සියයට 13.1ක කොටස් හිමිකාරීත්වයක් ඇති චීනය දෙවන විශාලතම රක්ෂණ වෙළඳපොල බවට පත්වූ අතර එය සියයට 13.1ක සැලකිය යුතු වර්ධනයක් වාර්තා කර ඇත. සක්‍රීය කළ කාබන්, රබර් අත්වැසුම් සහ අගය එකතු කළ තේ රක්ෂණ ඔප්පු හිමියන් මෙම වෙළඳපොළ තුළ ඉහළ ධාරිතාවන් වාර්තා කර ඇත.

සියයට 6.8ක කොටස් හිමිකාරීත්වයක් ඇති එක්සත් රාජධානිය තෙවැනි විශාලතම රක්ෂණ වෙළඳපොල ලෙස තවදුරටත් පවතින අතර, එය පසුගිය වසරට සාපේක්ෂව සියයට 2ක වර්ධනයක් පෙන්නුම් කර ඇත.

සියයට 5.3ක කොටස් හිමි සිව්වන විශාලතම වෙළඳපොල බ්‍රසීලය වන අතර සමාලෝචනයට භාජනය වූ කාල සීමාව තුළ සියයට 26ක සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කර ඇත. රබර් අත්වැසුම් සහ සක්‍රිය කළ කාබන් රක්ෂණ ඔප්පු හිමියන් වසර තුළ මෙම කැපී පෙනෙන වැඩිවීමට දායක විය.




සියයට 5.2ක කොටස් හිමි ප්‍රංශය පස්වන විශාලතම වෙළඳපොල වන අතර පසුගිය වසරට වඩා සියයට 77.49ක ඉතා ඉහළ වර්ධනයක් වාර්තා කර ඇත. රබර් අත්වැසුම් අපනයනය කරන රක්ෂණ ඔප්පු හිමියන් මෙම වෙළඳපොළ ව්‍යාපාර වර්ධනයට හේතු විය. 2020 වර්ෂය තුළ, රක්ෂණ ව්‍යාපාරයෙන් සියයට 44ක්ම ඉහළම වෙළඳපලවල් 5ට හිමි වී ඇත.

ඉහත වෙළඳපලවලට අමතරව ජපානය, ඉතාලිය, තුර්කිය, අයර්ලන්තය, දකුණු කොරියාව, චෙක් ජනරජය, බෙල්ජියම, ස්වීඩනය, හොංකොං, කැනඩාව, පෝලන්තය, කටාර්, ඩෙන්මාර්කය, මැලේසියාව, කොලොම්බියාව, නෝර්වේ, ජෝර්දානය, ක්‍රොඒෂියාව, බහරේන්, තායිවානය, තායිලන්තය, මොරොක්කෝව සහ වියට්නාමය වැනි රටවල් ද අප විසින් නිරීක්ෂණය කල අතර වසර තුළ රක්ෂණ ව්‍යාපාර වැඩි වී ඇති බව වාර්තා විය. ඒ හා සමානව ඉන්දියාව, රුසියාව, නවසීලන්තය, ස්පාඤ්ඤය, දකුණු අප්‍රිකාව, එක්සත් අරාබි එමීර් රාජ්‍යය, සිංගප්පූරුව, සෞදි අරාබිය, ඉන්දුනීසියාව, කුවේට්, ටියුනීසියාව, ඊශ්‍රායලය, පේරු, ෆින්ලන්තය, පිලිපීනය, ස්ලෝවේනියාව, සැම්බියාව, ඕමානය, බල්ගේරියාව, මෙක්සිකෝව, ඉරානය, සයිප්‍රසය, ලෙබනනය, කෙන්යාව, මාලදිවයින සහ මියන්මාරය වැනි රටවල රක්ෂණ ව්‍යාපාරවල සැලකිය යුතු අඩුවීමක් නිරීක්ෂණය කරන ලදී.

අපගේ අවදානම් ප්‍රතිරක්ෂණ ව්‍යාපාරයේ දී, සංස්ථාව විසින් රටවල් 162 ක් සඳහා දේශපාලන අවදානම් ආවරණය ප්‍රදානය කරන අතර, ඒවා ඔවුන්ගේ කේවල අවදානම් පැතිකඩ මත පදනම්ව A1, A2, A3, A4, B, C සහ D ලෙස කාණ්ඩ 7 කට වර්ග කර ඇත.

| රටවල් වර්ගීකරණය අනුව රක්ෂණ ව්‍යාපාරය - 2015 | | |
|---|---|---|
| වර්ගය | රක්ෂණ ව්‍යාපාරය | % |
| A1 | රු.මි.613.39 | 2.21% |
| A2 | රු.මි.8,522.64 | 30.66% |
| A3 | රු.මි.4,009.30 | 14.42% |
| A4 | රු.මි.6,101.53 | 21.95% |
| B | රු.මි.2,602.19 | 9.36% |
| C | රු.මි.3,371.82 | 12.13% |
| D | රු.මි.2,573.57 | 9.26% |
| | රු.මි.27,794.44 | 100.00% |



සංස්ථාව ස්ථිර පදනමක් මත ක්‍රියාත්මක වන බවට සහ කිසිදු සිදුවීමකින් බරපතල අලාභයක් සිදු නොවන බවට සහතික කිරීම සඳහා හැකිතාක් දුරට කාලයත් සමග රටවල් වෙත අවදානම් පුළුල් ලෙස ව්‍යාප්ත කිරීම අත්‍යවශ්‍ය වේ.

2015 වසරේ සියයට 2.21ට සාපේක්ෂව 2020 දී A1 කාණ්ඩයේ රටවල් රක්‍ෂිත ව්‍යාපාරයෙන් සියයට 4.75කට දායක වී ඇත. ඒ හා සමානව, A3 කාණ්ඩයේ රටවල් 2015 වසරේ සියයට 14.42ට සාපේක්ෂව 2020 දී රක්‍ෂිත ව්‍යාපාරයෙන් සියයට 19.97කට දායක වී ඇත.

එසේම, D කාණ්ඩයේ රටවල් 2015 වසරේ සියයට 9.26ට සාපේක්ෂව 2020 දී මුළු රක්‍ෂණ ව්‍යාපාරයෙන් සියයට 0.77කට දායක වී ඇත. ඒ හා සමානව, C කාණ්ඩයේ රටවල් 2015 දී සියයට 12.13ට සාපේක්ෂව 2020 දී මුළු රක්ෂණයෙන් සියයට 11.79කට දායක වී ඇත.

| **රටවල් වර්ගීකරණය අනුව රක්ෂණ ව්‍යාපාරය - 2020** | | |
|---|---|---|
| වර්ගය | රක්ෂණ ව්‍යාපාරය | % |
| A1 | රු.මි.1,801.17 | 4.85% |
| A2 | රු.මි.11,173.51 | 30.07% |
| A3 | රු.මි.7,421.73 | 19.97% |
| A4 | රු.මි.7,778.09 | 20.93% |
| B | රු.මි.4,315.39 | 11.61% |
| C | රු.මි.4,380.50 | 11.79% |
| D | රු.මි.286.36 | 0.77% |
| **මුලු එකතුව** | **රු.මි.37,156.73** | **100.00%** |




**ණය සීමා**

ගැණුම්කරුවන් හා රටවල් ප්‍රතිරක්ෂණය කිරීම සඳහා විකුණුම්කරුගේ අවදානම් රක්ෂණ ඔප්පු නිකුත් කිරීම මඟින් සහ ණය දීමට සුදුසු ගැණුම්කරුවන් සඳහා ණය සීමාවන් නිකුත් කිරීම මඟින් සංස්ථාව අපනයනකරුවන්හට අඛණ්ඩවම සහාය දක්වා ඇත. ප්‍රතිරක්ෂණ තීරණ මූලික වශයෙන් ගනු ලබන්නේ ගැනුම්කරුගේ තොරතුරු විශ්ලේෂණය කිරීමෙනි.

විශ්ලේෂණයේ ප්‍රධාන අරමුණ වන්නේ විදේශීය ගැනුම්කරුවන් පිළිබඳ ප්‍රතිරක්ෂණ තීරණ පහසු කරවීමයි. අවදානම් සංජානනය මත පදනම්ව ගැනුම්කරුගේ ප්‍රතිග්‍රාහ්‍යතාව හඳුනා ගැනීමටත්, ගැනුම්කරුට ඇති අවදානමේ සංසන්දනාත්මක මට්ටම අනුව ශ්‍රේණිගත කිරීමේදී සහ ගැනුම්කරුට ගත හැකි නිරාවරණය තීරණය කිරීමට විශ්ලේෂණය උපකාර විය යුතුය.

ප්‍රවේශය වෙත සංගතභාවයක් ගෙන ඒම සඳහා සහ තීරණ ගැනීමේ ක්‍රියාවලිය සෑම අවස්ථාවකදීම විෂය මූලික වීම සඳහා, ගැනුම්කරුවන්ගේ සමස්ත ණය සීමාව නියම කිරීම සඳහා ලකුණු කාඩ්පත් ආකෘතියක් සකස් කර ඇත. රක්‍ෂිත පාර්ශ්වය මෙන්ම විශේෂිත වෙළඳ භාණ්ඩ යන දෙකෙහිම අවදානම් මට්ටම හඳුනා ගැනීම සඳහා ප්‍රතිරක්ෂණ කටයුතු සිදු කිරීමේදී පුළුල් පරාසයක තොරතුරු ප්‍රභවයන් භාවිතා කරනු ලැබේ. රක්ෂණකරුවෙකු රක්ෂණය කිරීමට කැපවී ඇති මුදල ණය සීමාවන් මඟින් නියෝජනය කෙරේ.

කොරෝනා වසංගතය සහ එහි ප්‍රතිවිපාක ආර්ථික හා වෙළඳ ක්‍රියාකාරකම්වල ගෝලීය පරිහානියක් ඇති කර තිබේ. නිෂ්පාදන නතරවීම, සැපයුම් දාමය බාධා වීම සහ කම්හල් අගුලු දැමීම්, වෙළඳපොළවල් කඩා වැටීම සහ නව ආයෝජන කල් දැමීමත් සමඟ ලොව පුරා ආර්ථික බලපෑම අතිමහත් ය. ශක්තිමත් ව්‍යාපාර ආකෘති සහිත බුන්වත් නොවූ සමාගම් පවා කොරෝනා වසංගතය හමුවේ පීඩනයට පත්වී ඇත.




රක්ෂණ ඔප්පු හිමියන්ට යාවත්කාලීන තොරතුරු ලබා දීමෙන්, අපනයනකරුවන්ට හොඳ ව්‍යාපාරික තීරණ ගැනීමට SLECIC උපකාර වන අතර, එමඟින් පාඩු අවම කරගත හැකිවනු ඇත. ඵලදායී ණය පාලනය, පාඩු අවම කිරීම සහ ගැනුම්කරුවන්ගේ ගෙවීම් පැහැර හැරීම් හැසිරවීමේ ක්‍රම පිළිබඳව අපනයන ප්‍රජාව දැනුවත් කිරීම ඔවුන්ගේ අවදානම් මඟහරවා ගැනීම සඳහා රක්ෂණ ආවරණයක් සැපයීම මෙන්ම වැදගත් බව SLECIC තවදුරටත් විශ්වාස කරනු ලබයි. නිවැරදි දැනුම ලබාදීම මඟින්, ගෙවීම් පැහැර හරින ගැණුම්කරුවන් සමඟ ගනුදෙනු කිරීමේදී අපනයනකරුවන් වඩාත් හොඳ තත්වයකට පත්වනු ඇත.

සමතුලිත අවදානම් කළඹක් සහතික කිරීම සඳහා සංස්ථාවේ ප්‍රතිරක්ෂණ උපායමාර්ගය විවිධත්වයක් අපේක්ෂා කරයි. එසේම, එමඟින් ප්‍රතිඵලයේ විචල්‍යතාවය අඩු කෙරෙන බව විශ්වාස කෙරේ. ඔවුන්ගේ තරාතිරම හා පළපුරුද්ද අනුව නිකුත් කළ හැකි සීමාවන් නියම කිරීම සඳහා ප්‍රතිරක්ෂණ බලධාරීන්හට බලය පවරා ඇත. කෙසේ වෙතත්, විවිධ රටවල අහිතකර දේශපාලන හා ආර්ථික තත්ත්වයන් සහ ගැනුම්කරුවන්ගේ බංකොලොත්භාවය සහ වෙනත් කරුණු හේතුවෙන් විශාල ප්‍රමාණයේ ණය සීමා සඳහා වන සමහර අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට සිදුවිය.

2019 දී රු.බිලියන 4.93ට සාපේක්ෂව, 2020 දී රු.බිලියන 5.3ක් වටිනා ගැනුම්කරුවන්ගේ නව ණය සීමා (BLL) 368ක් නිකුත් කරන ලදී.

| | 2019<br>රු.බිලියන | 2020<br>රු.බිලියන |
|---|---|---|
| ණය සීමා | 4.93 | 5.3 |

**අපනයන ණය ඇපකර**

SLECIC හි අපනයන ණය ඇපකරයන් අපනයනකරුවන්ට සත්‍ය වශයෙන්ම අරමුදල් සැපයීම හා සම්බන්ධ නොවේ. එය අපනයනකරුවන්ට මුදල් යෙදවීමේ ප්‍රතිඵලයක් ලෙස සිදු වන පාඩු වලින් අපනයන මූල්‍ය බැංකු ආරක්ෂා කිරීම සඳහා වේ. මූල්‍ය ආයතනවලට අවශ්‍ය සහය ලබා දීම මඟින්, අපනයන අංශයට මුදල් යෙදවීම සඳහා වඩාත් සක්‍රියව සහභාගී වීමට ඔවුන් දිරිමත් කරනු ලැබේ.

**ATA කාර්නේට් පද්ධතිය ආවරණය කරනු ලබන සෘජු අපනයන කාර්ය සාධන ඇපකර**

ATA කාර්නේට් යනු වෙළඳ ප්‍රදර්ශන, ප්‍රදර්ශන සහ වෙළඳ ප්‍රවර්ධන අරමුණු වෙනුවෙන් ඵලදායී ලෙස භාවිතා කිරීම සඳහා තීරුබදු සහ බදු රහිතව නිශ්චිත කාලයක් සඳහා භාණ්ඩ සහ වාණිජ සාම්පල තාවකාලිකව ආනයනය කිරීමට අවසර දෙන ජාත්‍යන්තර රේගු ලේඛනයකි.

ATA කාර්නේට් විසින් වාණිජ සාම්පල, වෘත්තීය උපකරණ සහ භාණ්ඩ ඉදිරිපත් කිරීම් සඳහා හෝ වෙළඳ ප්‍රදර්ශන, දැක්ම, ප්‍රදර්ශන වැනි දෑ වෙනුවෙන් භාවිතා කිරීම සඳහා ආවරණය කරනු ලබයි. අපනයනකරුවෙකු විසින් වෙළඳ ප්‍රදර්ශන සඳහා වාණිජ සාම්පල සහ ප්‍රදර්ශන භාණ්ඩ සමඟ දේශසීමා තරණය කිරීමට අපේක්ෂා කරන්නේ නම්, ATA කාර්නේට් විසින් රේගු නිෂ්කාශනය සඳහා වැයවන ඔහුගේ හෝ ඇයගේ කාලය ඉතිරි කර ගමන වේගවත් කරදෙනු ලබයි.

**ATA කාර්නේට් පරිශීලකයන්**

ATA කාර්නේට් පරිශීලකයන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි පුද්ගලයෙකු හෝ සමාගමක් විය හැක.

- සංචාරක ව්‍යාපාර/විකුණුම් විධායකයින්
- කාර්මික ශිල්පීන්
- වෙළඳ ප්‍රදර්ශකයින් සහ චිත්‍රපට කණ්ඩායම්, ශල්‍ය වෛද්‍යවරුන්, කලා ශිල්පීන්, ගෘහ නිර්මාණ ශිල්පීන්, ඉංජිනේරුවන්, අධ්‍යාපනඥයින්, විනෝදාස්වාදය සපයන්නන් වැනි වෘත්තිකයන් සහ කණ්ඩායම්
- වෙනත් ඕනෑම පුද්ගලයෙකු විසින් කාර්නේට් භාවිතා කරන්නේ නම්, ඔහු වෙත බලය පවරා දෙමින් කාර්නේට් දරන්නා විසින් නිකුත් කරන ලද ලිපියක් රැගෙන යා යුතුය.

අපනයනකරුවන්හට, විශේෂයෙන්ම මැණික් හා ස්වර්ණාභරණ අපනයනකරුවන් හට, අතිරේක සුරැකුමකින් තොරව ATA 'කාර්නේට්' රේගු ලේඛණ ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ අන්තර්ජාතික වාණිජ මණ්ඩලය - (ICC-SL) වෙත සෘජු අපනයන කාර්ය සාධන ඇපකර අඛණ්ඩවම නිකුත් කෙරේ. මෙම රේගු ලේඛනය අපනයනකරුවන්ට විදේශයන්හි වෙළඳ ප්‍රදර්ශන සහ ප්‍රදර්ශන සඳහා සහභාගී වීමට සහ ලාභය උපරිම කර ගැනීම සඳහා අපනයන කොන්ත්‍රාත්තු දිනා ගැනීමට හැකියාව ලබා දෙයි.

සමාලෝචිත කාලසීමාව තුළදී, කොවිඩ්-19 වසංගතය හේතුවෙන් බොහෝ අපනයනකරුවන්ට සංචාරය කිරීමට නොහැකි වූ බැවින්, ස්වර්ණාභරණ අපනයනකරුවන් වෙත කිසිදු ATA කාර්නේට් ලේඛණයක් නිකුත් කිරීමට ශ්‍රී ලංකාවේ අන්තර්ජාතික වාණිජ මණ්ඩලයට (ICC Sri Lanka) නොහැකි විය. එබැවින්, ICC Sri Lanka වෙත කිසිදු සෘජු ඇපකරයක් නිකුත් කිරීමට සංස්ථාවට නොහැකි විය.

**සංක්‍රමණ පිරිවැය** - APARA

ශ්‍රී ලංකාවේ විදේශ විනිමය ඉපැයීම්වලින් සැලකිය යුතු කොටසක් සඳහා රැකියා සඳහා විදේශගත වන ශ්‍රී ලාංකිකයන් දායක වන බැවින් සේවා අපනයනය ඉතා වැදගත් ක්ෂේත්‍රයකි. SLECIC විසින් 1992 මැයි මාසයේ දී මෙම බැංකු ඇපකර යෝජනාක්‍රමය හඳුන්වා දෙන ලද්දේ සංක්‍රමණික සේවකයන්ගේ ගුවන් ටිකට්පත්වල පිරිවැය පමණක් ආවරණය වන පරිදි වන අතර සහතික කළ පාඩුවෙන් සියයට 60ක ආවරණයක් සහිතව ක්‍රියාත්මක විය. කලින් කලට, මෙම යෝජනා ක්‍රමය වෙනස් කරන ලද අතර මේ වන විට සහතික කළ පාඩුවෙන් සියයට 85ක ඉහළ ආවරණයක් සහිතව සම්පූර්ණ පූර්ව පිටත්වයාමේ ණය ආවරණය කෙරෙන අතර අවම ලියකියවිලි සමඟ සම්පූර්ණ පිරිවැටුම් ණය ඇපකර යෝජනා ක්‍රමයක් ලෙස ක්‍රියාත්මක වන අතරම, මෙම අංශයට පහසුකම් ලබාදීමේදී බැංකුවට ඇති අවදානම අවම කරයි.

මෙරට මහත් අපේක්ෂා සහිත සහ අධිෂ්ඨානශීලී පුරවැසියන් හට විදේශයන්හි රැකියා ලබා ගැනීමට සහ දරිද්‍රතාවයෙන් මිදීමට මෙම සංක්‍රමණ පිරිවැය යෝජනාක්‍රමය මඟින් පහසුකම් සලසා දෙනු ලබයි. මෙම අධිෂ්ඨානශීලී ශ්‍රී ලාංකිකයින්ගේ ජීවන තත්ත්වය නඟා සිටුවීමට සහ ප්‍රේෂණ වැඩි කරගැනීම හා විදේශ මුදල් සංචිත ඉහළ නැංවීම තුළින් ආර්ථිකයේ යහපැවැත්ම සුරැකීමට දායක වීම SLECIC හට ඉමහත් සතුටකි.

SLECIC විසින් ආරම්භයේ සිට 2020 අවසානය දක්වා, මූල්‍ය ආයතන වෙතින් රු.මිලියන 2752.36ක් වටිනා බැංකු ණය ලබා ගැනීම සඳහා අයදුම්කරුවන් 23,916 දෙනෙකු හට සහාය ලබා දී ඇති අතර දිවයින පුරා ශ්‍රී ලාංකිකයන් බොහොමයක්හට රැකියා සඳහා විදේශගත වීමට පහසුකම් සපයා ඇත.

ලෝකයේ බොහෝ ප්‍රදේශවල සියලුම කුසලතා මට්ටම්වලට අදාලව විවිධ වෘත්තීන්හි රැකියා ඇත. සංස්ථාව විසින් අග්නිදිග ආසියාව තුළ ආවරණය කිරීම් බහුලව සිදු කර ඇත. රු.මිලියන 2752.36ක බැංකු ණය ලබා ගැනීම සඳහා සංස්ථාව විසින් APARA ණය ඇපකර 23,916 ක් නිකුත් කර ඇත. ආරම්භයේ සිට මේ දක්වා අයදුම්කරුවන් 586 දෙනෙකු විසින් මූල්‍ය ආයතන වෙත බැංකු ණය ගෙවීම පැහැර හැර ඇත.

| වර්ෂය | නිකුත් කළ සංඛ්‍යාව | වටිනාකම (රු) |
|---|---|---|
| 1992-2005 | 7115 | 374.46 |
| 2006-2020 | 16801 | 2,377.90 |
| **එකතුව** | **23,916** | **2,752.36** |




සමාලෝචිත වර්ෂය තුළ, මූල්‍ය ආයතනවලින් රු.මිලියන 7.8ක බැංකු ණය ලබා ගැනීම සඳහා අයදුම්කරුවන් 27 දෙනෙකුට පමණක් සහය වීමට සංස්ථාවට හැකි විය.

**ජාත්‍යන්තර සබඳතා**

බාහිරට වැඩි අවධානයක් යොමු කරමින්, ජාත්‍යන්තර ණය සහ ආයෝජන රක්ෂණකරුවන්ගේ සංගමය (බර්නේ සංගමය) සහ කලාපීය සහයෝගිතා සමූහය (RCG) වැනි වැදගත් විදේශීය ණය රක්‍ෂණ රැස්වීම් සහ සම්මන්ත්‍රණ වලට සහභාගී වෙමින් සංස්ථාව 2020 දී ජාත්‍යන්තරකරණය සඳහා වූ සිය කැපවීම පවත්වාගෙන යන ලදී. මේවාට සහභාගී වීම මඟින් සංස්ථාවට සිය ගතික කර්මාන්තය යාවත්කාලීනව පවත්වාගෙන යාමට සහ අනෙකුත් ණය රක්‍ෂණකරුවන් සමඟ අඛණ්ඩව තොරතුරු සහ අත්දැකීම් හුවමාරු කර ගැනීමට හැකි විය.

**ණය සහ ආයෝජන රක්ෂණකරුවන්ගේ ජාත්‍යන්තර සංගමය**

සංස්ථාව, අපනයන ණය සහ ආයෝජන රක්ෂණ කර්මාන්තය සඳහා ප්‍රමුඛ ජාත්‍යන්තර සම්බන්ධතාවක් පවතින ජාත්‍යන්තර ණය සහ ආයෝජන රක්ෂණකරුවන්ගේ සංගමයේ (බර්නේ සංගමය) සාමාජිකයෙකු වේ. ලෝක ව්‍යාප්ත අවදානම් කළමනාකරණ විසඳුම් ඉදිරිපත් කරනු ලබන පෞද්ගලික සමාගම් සහ ජාතික අපනයන හා බාහිර ආයෝජන සඳහා සහාය ලබාදීම අරමුණු කරගනු ලැබූ රාජ්‍ය

අනුග්‍රහය ලබන අපනයන ණය නියෝජිත ආයතන යන දෙයාකාරයේ ආයතන එම සංගමයේ සාමාජිකයන් වේ.

රටෙහි අපනයන සංවර්ධනය සහ ප්‍රවර්ධනය සඳහා බලය සහිතව ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන රජයේ එකම අපනයන ණය නියෝජිත ආයතනය (ECA) වන ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව (SLECIC) විසින් අපනයන ණය රක්ෂණයේ සහ ආයෝජනයේ මෑත කාලීන සංවර්ධන සහ වඩාත් හොඳ පරිචයන් වෙත ප්‍රවේශවීමේ අරමුණින් යුතුව 1983 වර්ෂයේ දී බර්නේ සංගමයේ පූර්ණ සාමාජිකත්වය ලබාගන්නා ලදී. කොවිඩ් 19 හි පළමු රැල්ල හේතුවෙන් කාරක සභා රැස්වීම අවලංගු කරන ලද අතර වාර්ෂික මහා සභා රැස්වීම 2020 ඔක්තෝබර් 12-16 සතිය තුළ මාර්ගගතව පැවැත්විණි. SLECIC හි සභාපති සහ කළමනාකාර අධ්‍යක්ෂ සහ සාමාන්‍යාධිකාරීවරයා බර්නේ සංගමයට සහභාගී වූ අතර වාර්ෂික මහා සභා රැස්වීමට මාර්ගගතව සහභාගී විය.

**කලාපීය සහයෝගිතා සමූහය (RCG)**

කලාපීය සහයෝගිතා සමූහය (RCG) යනු ආසියානු කලාපයේ සාමාජිකයන් අතර ජාත්‍යන්තර සම්බන්ධතා ප්‍රවර්ධනය කිරීම සඳහා 1991 වර්ෂයේ පිහිටුවනු ලැබූ බර්නේ සංගමයේ සාමාජික ආයතන 12ක සමූහයක් වේ.

ඔස්ට්‍රේලියාව, ඉන්දියාව, චීනය, ඉන්දුනීසියාව, ජපානය, මැලේසියාව, සිංගප්පූරුව, ශ්‍රී ලංකාව, දකුණු කොරියාව, තායිවානය, තායිලන්තය සහ හොංකොං යන රටවලින් සමන්විත වූ ආසියානු අපනයන ණය නියෝජිත ආයතන වලින් බර්නේ සංගමයේ කලාපීය සහයෝගිතා සමූහය (RCG) සංයුක්ත වේ.

ආසියානු කලාපයේ සාමාජිකයන් අතර ජාත්‍යන්තර සබඳතා වර්ධනය කිරීම සඳහා SLECIC ඇතුළු ආරම්භක සාමාජිකයන් පස් දෙනෙකු සමඟ 1986 දී RCG පිහිටුවන ලදී. HKEC, ECGC, MECIB සහ ECICS එහි අනෙකුත් සාමාජිකයින් වන අතර එහි පළමු රැස්වීම 1986 පෙබරවාරි 15 වන දින සිංගප්පූරුවේදී පැවැත්විණි.

RCG හි සභාපතිත්වය එහි සාමාජිකයන්හට මාරුවෙන් මාරුවට හිමිවන අතර, SLECIC විසින් 1993/1994 සහ 2007/2008 කාලය සඳහා මෙහි සභාපතිත්වය දැරිය. SLECIC විසින් දෙවන වරට RCG හි සභාපතිධූරය දැරූ කාල සීමාව තුළ ආසියානු අපනයන ණය නියෝජිතායතන සියල්ලම එකට ගෙන ඒමට අපට හැකි වූ අතර, කලාපීය සාමාජිකයින්ගේ වඩාත් උපායමාර්ගික කරුණු කෙරෙහි අවධානය යොමු කිරීමට සහ කණ්ඩායම තුළින්ම විසඳුම් සෙවීම සඳහා බර්නේ සංගමයේ සහභාගීත්වයෙන් යුතුව ප්‍රධානීන්ගේ වාර්ෂික රැස්වීමක් පවත්වන ලදී. සාමාජිකයින් සම්බන්ධ ගැටළු සාකච්ඡා කරන බැවින් මෙම සංසදය සාමාජිකයින්ට ඉතා ප්‍රයෝජනවත් විය. මේ වන විට, ශ්‍රී ලංකාව ඇතුළු විවිධ සාමාජික රටවල වාර්ෂික ප්‍රධානීන්ගේ රැස්වීම් 12 ක් පවත්වන ලදී.

මෙම වසරේ මාර්ගගත RCG රැස්වීම 2020 දෙසැම්බර් 1 වන දින Thai Exim බැංකුව විසින් සංවිධානය කරන ලද අතර සභාපති සහ කළමනාකාර අධ්‍යක්ෂ සහ සාමාන්‍යාධිකාරීවරයා රැස්වීමට සහභාගී විය.

**ආසියානු ණය පරිපූරක ආයතන සමඟි සන්ධානය (ACSIC)**

ආසියානු ණය පරිපූරක ආයතන සමඟි සන්ධානය (ACSIC) 1987 වර්ෂයේ සිට සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් (SMEs) සඳහා විශාලතම ආසියානු සමූපකාර සමාගම වේ. මේ වන විට, ශ්‍රී ලංකා අපනයන

ණය රක්ෂණ සංස්ථාව ඇතුළුව රටවල් 11 ක සාමාජික ආයතන 16 ක් ඊට ඇතුළත් වේ. SLECIC විසින් 2016 වර්ෂයේ දී මෙම සංගමයේ සාමාජිකත්වය ලබා ගන්නා ලදී.

ACSIC හි පරමාර්ථය වනුයේ ආසියාවේ සුළු ව්‍යාපාර ණය පරිපූරක ආයතන අතර තොරතුරු හුවමාරු කිරීම, සාකච්ඡා කිරීම සහ පිරිස් හුවමාරු කර ගැනීම තුළින් ආසියානු කලාපයේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා ණය පරිපූරක පද්ධතියේ මනා සංවර්ධනය ප්‍රවර්ධනය කිරීමයි. කොවිඩ්-19 වසංගතය හේතුවෙන්, ජපානය විසින් ප්‍රධාන නියෝජිත හමුව අවලංගු කරන ලදී.

# අලෙවිකරණය සහ දැනුවත් කිරීම

සංස්ථාව, එහි මූලික ව්‍යාපාරය වන අපනයන ණය අවදානම් රක්ෂණය කෙරෙහි අවධානය යොමු කිරීමට අමතරව, අපනයන ප්‍රවර්ධන ආයතන, වෙළඳ මණ්ඩල සහ සංගම් සමඟ සමීප සම්බන්ධීකරණයෙන් ක්‍රියා කරයි. සංස්ථාවේ අලෙවිකරණ ව්‍යායාමවල කොටසක් ලෙස, අපනයනකරුවන්ගේ සහ බැංකුකරුවන්ගේ ප්‍රයෝජනය සඳහා රක්ෂණ අධ්‍යාපන/දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීමට අමතරව, 2020 වසරේ පළමු මාස 2 තුළ ගනුදෙනුකරුවන් පුද්ගලිකව බැහැදැකීම සිදු කර ඇත.

කොවිඩ්-19 වසංගතයේ ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලාංකීය අපනයනකරුවන්ට බලපෑමක් ඇති කරමින් ලොව පුරා වෙළඳාම කඩාකප්පල් වී ඇත. කොවිඩ් 19 වසංගතය අතරතුර තම පාරිභෝගිකයින්ට සහය ලබා දීමට සංස්ථාව විවිධ පියවර ගෙන ඇත.

2020 මාර්තු මැද සිට මැයි දෙවන සතිය දක්වා අගුලු දැමීමෙන් පසු, කාර්ය මණ්ඩලය නිවසේ සිට රාජකාරි කිරීමට හුරු වූ අතර අපගේ රක්ෂණ ඔප්පු හිමියන්ට ඔවුන්ගේ අපනයන පහසු කිරීම සඳහා නව ණය සීමාවන් නිකුත් කිරීම සහ ඊමේල් හරහා වැඩි දියුණු කිරීම් ඇතුළු සියලුම අවශ්‍යතා සඳහා සේවා සපයන ලදී. නැව්ගත කිරීමේ ප්‍රකාශ ඉදිරිපත් කිරීම සරල කර තාර්කිකකරණය කර ඇති අතර රක්ෂණ වාරික සෘජුවම බැංකුවට ප්‍රේෂණය කිරීමට විධිවිධාන සලසා ඇති අතර අගුලු දැමීමේ කාල සීමාව තුළ ප්‍රමාදවී ඉදිරිපත් කරන ලද සියලුම ප්‍රකාශන භාර ගන්නා ලදී.

SLECIC හි අපනයන ණය රක්ෂණ සහ ඇපකර නිෂ්පාදනවල ප්‍රතිලාභ පිළිබඳව කරුණු පැහැදිලි කිරීම සහ විස්තර කිරීම සඳහා අපගේ විධායකයින් සහ බොහෝ අපනයනකරුවන් අතර සාකච්ඡා මාලාවක් සූම් තාක්ෂණය ඔස්සේ පවත්වන ලදී.

තීරණ ගැනීමේ ක්‍රියාවලීන් කෙටි කර ඇති අතර ගනුදෙනුකරුවන්ට සේවා සැපයීමේ දී ව්‍යවසායකත්ව හැසිරීම් උත්තේජනය කිරීම සඳහා ඉහළ මට්ටම වෙත වගකීම් පවරා ඇත.

අපගේ අපනයන සහාය සේවාවන් ප්‍රවර්ධනය කිරීම, ඔවුන්ගේ ක්‍රියාකාරකම් සඳහා අනුග්‍රාහකත්වය ලබා දීම සහ සාමාජිකයන් අතර අපගේ ප්‍රතිරූපය ප්‍රවර්ධනය කිරීම සඳහා වෙළඳ සහ කර්මාන්ත මණ්ඩල හා අපනයන ප්‍රවර්ධන ආයතන සමඟ අප සමීපව බැඳී සිටී. නමුත් 2020 අවසන් ගිණුම් වල අවශ්‍ය අනුමැතීන් සහිතව එවැනි වෙන් කිරීම් සිදු කළ බැවින් NCE සම්මාන උළෙල වැනි අවස්ථාවන් 2021 ට කල් දමන ලදී.

# ගෙවන ලද හිමිකම්

ගෙවන ලද හිමිකම්, අපගේ අපනයනකරුවන් හට තම අපනයන කටයුතු නොකඩවා කරගෙන යාමට උපකාර වූ අතර එවැනි අපනයනකරුවන්ට ගෙවූ හිමිකම් ප්‍රතිපූරණය කිරීමට බැංකු සූදානම්ව සිටියහ. අලාභ සිදුවීම් විශ්ලේෂණය කිරීමේදී, ණය රක්ෂණය යටතේ ගෙවන ලද මුළු හිමිකම් සඳහා අලාභ වීමට ප්‍රධාන හේතුව කල්ගතවූ පැහැර හැරීම් බව අනාවරණය වී ඇත.

සංස්ථාව අඛණ්ඩව ඥාණාන්විත සංචිත කළමනාකරණයක් සිදු කර ඇති අතර එහි දිගුකාලීන මූල්‍ය ස්ථාවරත්වයේ ප්‍රධාන ප්‍රතිෂ්ඨාව වූ එවැනි ප්‍රතිපත්තියකට අනුගත වේ. අනපේක්ෂිත අවදානම් වලින් පැන නගින බැඳීම් ඉටු කිරීම සඳහා සංස්ථාව වසර ගණනාවක් පුරා හදිසි සංචිතයක් පවත්වා ගෙන ගොස් ඇත.

2019 රු.මිලියන 87.73ට සාපේක්ෂව, වසර සඳහා ශුද්ධ හිමිකම් රු.මිලියන 95.13ක් විය.

ආරම්භයේ සිට වත්මන් මූල්‍ය වර්ෂය දක්වා, සංස්ථාව විසින් රු.මිලියන 1399ක වටිනාකමින් යුත් හිමිකම් ගෙවා ඇති අතර, වාණිජ අවදානම් අවම කිරීම සඳහා SLECIC හි කැපවීම එමඟින් පෙන්නුම් කරයි. කිසිදු මහජන අරමුදලක් උපයෝජනය කිරීමකින් තොරව අභ්‍යන්තරව උත්පාදනය වූ අරමුදල් මගින් මෙම හිමිකම් ගෙවීම් සිදු කෙරිනි.

# ආයතනික සංස්කෘතිය, පුහුණුව සහ සංවර්ධනය

මානව සම්පත් කාර්ය මණ්ඩලයේ කැපවීම සහ ප්‍රවීණතාවය සහ ජනතාව පදනම් කරගත් ආයතනික සංස්කෘතිය, අපනයන ප්‍රජාවට සේවය කිරීමේදී සංස්ථාවේ සාර්ථකත්වයට දායක වේ. සිය ව්‍යාපාරික අරමුණු වලට සහය වීම සඳහා සහ වෙළඳපොලේ නව මුලපිරීම් සහ වෙනස්වීම් වලට ප්‍රතිචාර දැක්වීම සඳහා සංස්ථාව අඛණ්ඩව සම්පත් සහ උත්සාහය කැප කර, ඉහළ වෘත්තික, අභිප්‍රේරිත සහ නියැලුණු කණ්ඩායමක් සංවර්ධනය කර පවත්වාගෙන යනු ලබයි.

තීරණ ගැනීමේදී සහ සේවා ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීමේ මාර්ග සඳහා නව මූලාරම්භයන් සංවර්ධනය කිරීමේදී සේවක මණ්ඩලයේ දායකත්වය සඳහා සංස්ථාවේ සංස්කෘතිය අනුබල දෙනු ලබයි. එවැනි මූලාරම්භයන් මඟින් සමස්තයක් ලෙස සංස්ථාවේ සුභසිද්ධිය සඳහා කැපවීම සහ පෞද්ගලික මැදිහත්වීම ඇති කෙරේ.

අපේක්ෂිත මට්ටමේ ඵලදායීතාවයකින් සහ ක්‍රියාකාරීත්වයකින් යුතුව සංස්ථාවේ නිසි කෘත්‍ය සඳහා අප ජනතාවගේ සුබසාධනය සහ තෘප්තිය නිසැකයෙන්ම අත්‍යාවශ්‍ය වේ. එබැවින්, සංස්ථාව ඔවුන්ගේ රාජකාරි ජීවිතය හා පමණක් නොව විනෝදය/විවේකය කෙරෙහි ද නෛසර්ගිකව සම්බන්ධ වී ඇත. එබැවින් කාර්ය මණ්ඩලයේ සුබසාධන ක්‍රියාකාරකම් සඳහා, බොහෝ විට මූල්‍ය ආධාර ලබා දීම මඟින් සහාය වන සංස්ථාව මෙම අංශයෙහි ප්‍රමුඛස්ථානයෙහි සිටී.

හිමිකම් අත්පොත සහ ගැනුම්කරුවන්ගේ ලකුණු කාඩ්පත් ආකෘතිය වඩාත් හොඳින් ක්‍රියාත්මක කිරීම සඳහා ඒ පිළිබඳව සාකච්ඡා කිරීම පිණිස ECGC Ltd හි හිටපු සාමාන්‍යාධිකාරී එම්. වෛද්‍යනාදන් මහතා සමඟ බොහෝ බුද්ධිමය සංවාද සැසි මාර්ගගතව සංවිධානය කරන ලදී. මෙමගින් කාර්ය මණ්ඩල

සාමාජිකයින් විසින් නිර්මාණාත්මක සහ ප්‍රායෝගික අදහස් මතු කර ඇති අතර, එමගින් ආයතනික ප්‍රතිපත්ති සහ අරමුණු නිර්ණය කිරීමේදී ධනාත්මක කාර්ය මණ්ඩල සහභාගීත්වය ඇතිව විවෘත සහ වගවීම සහිත කළමනාකරණ ශෛලියක් අඛණ්ඩව වර්ධනය කිරීමට දායක වේ.

සංස්ථාව ද්විස්ථර උපායමාර්ගයක් අනුගමනය කරන ලද අතර, එහි මූලික පරමාර්ථය වූයේ සියලුම සේවකයින්ගේ ආරක්ෂාව සහ දෙවනුව සීමාවන් සමඟ වුවද ව්‍යාපාර සාමාන්‍ය පරිදි සිදු වන බව සහතික කිරීමයි. එහි දී, සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් බලාත්මක කරන ලද සියලුම රෙගුලාසි සහ නියෝග සේවානියුක්තියන් විසින් පිළිපැදීම ප්‍රධාන ඉලක්කයක් ලෙස පැවති අතර, සේවක ආරක්ෂාව සහ මෙහෙයුම් අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා වන ස්වකීය මුලපිරීම් ඊට අනුපූරක වේ.

සේවකයින් නිරෝධායන කිරීමේ පටිපාටිය සඳහා වන සියලුම වියදම් සංස්ථාව විසින් දරනු ලැබේ. සියලුම සේවකයින් සඳහා පුද්ගලික ආරක්ෂක උපකරණ (PPE) සැපයීම වැනි අත්‍යවශ්‍ය දෑ සැපයීමට අමතරව, සංස්ථාව සිය කාර්ය මණ්ඩලයේ ආරක්ෂාව සහතික කිරීම සඳහා කොරෝනා පළමු රැල්ලේදී වැඩ වාර සටහන් ක්‍රමයක් අනුගමනය කළ අතර නොමිලේ ප්‍රවාහන පහසුකම් ලබා දෙන ලදී.

ආවරණයන් සඳහා වන දැඩි ඉල්ලුම විසින් ඇති කරනු ලබන සුවිසල් වැඩ ප්‍රමාණයේ ප්‍රතිඵලයක් වශයෙන් වර්ෂය තුළදී සේවක පීඩනයට අඛණ්ඩව මුහුණ පෑමට සංස්ථාවට සිදු වේ.

# ඉදිරි දැක්ම

**ව්‍යාපාර අත්කර ගැනීම සහ රඳවා තබා ගැනීම**

පවතින වෙළඳ පරිසරය අභියෝගාත්මක වන අතර, සෑම අවස්ථාවක්ම ග්‍රහණය කර ගැනීමට සහ පීඩාවකින් තොරව තම ව්‍යාපාර වර්ධනය කර ගැනීමට අපනයනකරුවන්ට සහය වීමට සංස්ථාව බලාපොරොත්තු වේ. නව වසරේ දී, සංස්ථාව විසින් බැංකු, වෙළඳ අනුග්‍රාහක සංවිධාන සහ වෙළඳ සහ කර්මාන්ත සංගම් ඇතුළු එහි ව්‍යාපාරික හවුල්කරුවන් සමඟ සබඳතා සහ සහයෝගීතාව තවදුරටත් ශක්තිමත් කරනු ඇති අතර වැඩි අපනයනකරුවන් සංඛ්‍යාවක් ළඟාකර ගැනීම සඳහා ප්‍රචාරණ සහ අලෙවිකරණ කටයුතු සිදු කරනු ඇත.

සහනශීලී වෙළඳ භාණ්ඩ මිල ගණන්, ප්‍රධාන ආර්ථිකයන්හි වේගයෙන් වෙනස් වන මුදල් ප්‍රතිපත්ති සහ යූරෝ කලාපය, ජපානය සහ චීනය ආදී රටවල අඩු උද්ධමනය සමඟ දුර්වල වර්ධනය යනාදිය ගෝලීය ආර්ථිකයට සැලකිය යුතු ලෙස බලපායි.

මෙම පසුබිම තුල, අපනයනකරුවන්හට අභියෝගවලට සාර්ථකව මුහුණ දීමට සහ ඔවුන්ගේ අවදානම් කළඹ කළමනාකරණය කිරීමට උපකාර කිරීම සඳහා සංස්ථාව අඛණ්ඩවම සම්පත් යොදවනු ඇත.

සිය ණය තොරතුරු ජාලය ශක්තිමත් කිරීම සඳහා සහ ප්‍රතිරක්ෂණ ක්‍රියාවලිය වේගවත් කිරීම සඳහා ලැබෙන තොරතුරුවල වේගය සහ විශ්වසනීයත්වය වැඩි දියුණු කිරීම සඳහා පවත්නා වඩාත් ඵලදායී ණය තොරතුරු ප්‍රභවයන් පිළිබඳව එළඹෙන වර්ෂයේදී සංස්ථාව දිගටම සොයා බලනු ඇත.

අනාගත තොරතුරු තාක්ෂණ පද්ධති සංවර්ධනය සහ නඩත්තු කිරීමේදී, පාරිභෝගිකයින්ට වඩාත් කාර්යක්ෂම සහ විශ්වාසදායක සේවාවන් සැපයීම සඳහා සංස්ථාව එහි අන්තර්ජාල වේදිකාව සහ එහි අභ්‍යන්තර යෙදුම් යන දෙකෙහිම වැඩිදියුණු කිරීම් සිදු කරනු ඇති අතර ව්‍යාපාර බාධාවකින් තොරව කරගෙන යාමට හැකිවන පරිදි සංස්ථාවේ ජාලකරණ යටිතල පහසුකම් වැඩිදියුණු කරනු ඇත.

# 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන විගණන කමිටු වාර්තාව

ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාවේ (SLECIC) විගණන සහ කළමනාකරණ කමිටුව 2002 වර්ෂයේ නොවැම්බර් මාසයේදී ක්‍රියාවට නැංවූ අතර මුදල් අමාත්‍යාංශය නියෝජනය කරන විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු විසින් එම කමිටුවේ සභාපතිත්වය දරන ලදී. කමිටුව, සංස්ථාවේ විධායක නොවන අධ්‍යක්ෂවරුන් වන සාමාජිකයන් සිව් දෙනෙකුගෙන් සමන්විත වේ. ආරාධනය මත, නිරීක්ෂකයෙකු වශයෙන් විගණකාධිපති දෙපාර්තමේන්තුවෙන් නියෝජිතයෙකු මෙම රැස්වීම්වලට සහභාගී වේ.

කමිටුවේ සාමාජිකයන් වූයේ; කේ.එස්.එම්. ද සිල්වා මහතා - කමිටුවේ සභාපති, SLECIC හි අධ්‍යක්ෂ, ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ (වැ.බ.), මුදල් අමාත්‍යාංශය, ඊ.ඒ.ඒකනායක මිය - SLECIC හි අධ්‍යක්ෂ, වෙළඳ අමාත්‍යාංශයේ සහකාර අධ්‍යක්ෂ සහ එස්. පරණවිතාන මහතා - SLECIC හි අධ්‍යක්ෂ, ප්‍රධාන නිලධාරී - ජීවිත රක්ෂණ, සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව.

2020 වර්ෂය තුළදී විගණන කමිටුව විසින් රැස්වීම් තුනක් පවත්වන ලදී. රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව විසින් එවැනි කමිටු වෙනුවෙන් නියම කරනු ලැබූ නිර්ණේය විෂයයන්ට අනුකූලව එම විගණන කමිටුව ක්‍රියාත්මක විය. මූල්‍ය ප්‍රකාශවල විශ්වසනීයත්වය හා සුපිලිපන්භාවය ප්‍රකාරව, අභ්‍යන්තර පාලනයන්හි ප්‍රමාණවත් බව හා කාර්යක්ෂමතාවය සහ ව්‍යවස්ථාපිත හා නියාමන අවශ්‍යතාවන්ට අනුකූලව සංස්ථාවේ ගිණුම්කරණ සහ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සහ මූල්‍ය ප්‍රකාශ විගණනය කිරීම පිළිබඳ ස්වකීය වගකීම් ඉටුකිරීමේ දී කමිටුව විසින් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සහාය දක්වනු ලැබීය.

සලකා බලනු ලැබූ කාලසීමාව තුළදී, විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් ලබාදුන් බාහිර වාර්තා නිතිපතා සමාලෝචනය කරනු ලැබූ අතර එකී වාර්තාවල අන්තර්ගත නිර්දේශ මත පදනම්ව සංස්ථාවේ අභ්‍යන්තර පාලනයන් වැඩි දියුණු කිරීම සඳහා පියවර රැසක් ගනු ලැබීය. අභ්‍යන්තර විගණක විසින් පවත්වනු ලැබූ විගණනයන් ද කමිටුව විසින් සමාලෝචනය කරනු ලැබූ අතර නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ගයන් ගැනීම සඳහා එම නිර්දේශ අනුගමනය කරන ලදී.

සංස්ථාවට අදාළ වන SLECIC නීති, රීති සහ රෙගුලාසි වලට එකඟව කමිටුව විසින් විශේෂ අවධාරණය කිරීම් සිදු කරනු ලැබූ අතර සෑහීමට පත්විය හැකි මට්ටමින් එකඟව ක්‍රියාකර ඇද්ද යන්න සහතික කිරීම පිණිස භාණ්ඩාගාරය විසින් නිශ්චිතව දක්වනු ලැබූ නියමයන්ට සහ අදාළ රජයේ ආයතන විසින් නිකුත් කරන ලද වෙනත් අදාළ චක්‍රලේඛ මගින් නිශ්චිතව දක්වනු ලැබූ නියමයන්ට එකඟව ක්‍රියාකිරීමේ මට්ටම අධීක්ෂණය කරන ලදී.

**කේ.එස්.එම්. ද සිල්වා**
සභාපති
විගණන කමිටුව
ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව

# ශ්‍රී ලංකා අපනයන ණය රක්‍ෂණ සංස්ථාව
# (SLECIC)
# 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වාර්ෂික මූල්‍ය ප්‍රකාශයන්

# ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව (SLECIC)

## අන්තර්ගතය


| | |
|---|---|
| පරිපූර්ණ ආදායම් ප්‍රකාශය | 35 |
| මූල්‍ය තත්ව ප්‍රකාශය | 36 |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 37 |
| සමකොටස් වෙනස්වීම් ප්‍රකාශය | 38 |
| ගිණුම් පිළිබඳ සටහන් | 39-48 |
| ගිණුම්කරණ ප්‍රතිපත්ති | 49-56 |

# ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව

## වාර්ෂික මූල්‍ය ප්‍රකාශන - 2020

### ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා

| | සටහන | 31.12.2020 | 31.12.2019 |
|---|---|---|---|
| | | රු. | රු. |
| ආදායම | | | |
| දළ ලිඛිත වාරික ආදායම | 1 | 204,184,325.34 | 226,066,266.58 |
| උපයා නොගත් වාරික සඳහා සංචිතයේ ශුද්ධ වෙනස්වීම | 1අ | 1,987,999.94 | 3,678,463.98 |
| දළ ඉපැයුම් වාරික ආදායම | | 206,172,325.28 | 229,744,730.56 |
| වෙනත් මෙහෙයුම් ආදායම | 2 | 12,837,220.42 | 15,337,726.67 |
| මුළු ශුද්ධ මෙහෙයුම් ආදායම | | 219,009,545.70 | 245,082,457.23 |
| වෙනත් ආදායම | | | |
| ආයෝජන ආදායම | 3 | 215,395,334.99 | 216,940,848.72 |
| වෙනත් ආදායම | 4 | 31,065,746.79 | -5,057,448.22 |
| | | 246,461,081.78 | 211,883,400.50 |
| මුළු ශුද්ධ ආදායම | | 465,470,627.48 | 456,965,857.73 |
| හිමිකම් සහ මෙහෙයුම් වියදම් | | | |
| ශුද්ධ හිමිකම් | 5 | 95,128,166.10 | 87,735,173.54 |
| තත්ත්ව වාර්තා | | 7,237,809.53 | 8,394,438.04 |
| ආයතන වියදම් | 6 | 19,769,909.03 | 21,009,402.72 |
| පරිපාලන වියදම් | 7 | 50,811,906.12 | 50,778,765.93 |
| විකුණුම් සහ අලෙවිකරණ වියදම් | 8 | 4,059,648.82 | 8,828,537.09 |
| මූල්‍ය ගාස්තු | 9 | 89,456.28 | 3,314,284.54 |
| ශුද්ධ හිමිකම් සහ මෙහෙයුම් වියදම | | 177,096,895.88 | 180,060,601.86 |
| එකතු කළ අගය මත බද්දට පෙර (VAT) ලාභ/අලාභ | | 288,373,731.60 | 276,905,255.87 |
| මූල්‍ය සේවා මත VAT | | 23,083,663.00 | 23,858,646.00 |
| ආදායම් බද්දට පෙර ලාභය | | 265,290,068.60 | 253,046,609.87 |
| ආදායම් බදු | 9අ | 41,941,136.57 | 10,795,764.44 |
| වසර සඳහා ශුද්ධ ලාභය/අලාභය | | 223,348,932.03 | 242,250,845.43 |
| වෙනත් විස්තීර්ණ ආදායම් | | - | - |
| වසර සඳහා මුළු විස්තීර්ණ ආදායම | | 223,348,932.03 | 242,250,845.43 |

## ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව

## වාර්ෂික මූල්‍ය ප්‍රකාශන - 2020

### මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

| | සටහන | 2020.12.31 දිනට | 2019.12.31 දිනට | 2019.01.01 දිනට |
|---|---|---|---|---|
| | | රු. | රු. | රු. |
| **වත්කම්** | | | | |
| මුදල් හා මුදල් සමාන දෑ | 10 | 5,289,429.42 | 8,270,323.86 | 4,866,533.09 |
| විදේශ ව්‍යවහාර මුදල් ඉතිරිකිරීමේ ගිණුම | 11 | 682,942.81 | 1,987,326.53 | 4,791,507.19 |
| භාණ්ඩාගාර භාර අරමුදල | | 0.00 | 23,658,844.17 | 22,267,906.93 |
| ආයෝජන අරමුදල | | 32,497.95 | 1,054,937.04 | 103,044.61 |
| කෙටි කාලීන මූල්‍ය ආයෝජන | 12 | 2,387,549,984.30 | 1,845,825,066.60 | 1,671,180,433.02 |
| දීර්ඝ කාලීන මූල්‍ය ආයෝජන | 13 | 445,663,577.72 | 687,134,191.76 | 687,134,191.76 |
| ලැබිය යුතු පොළිය | 14 | 186,666,576.27 | 184,881,509.57 | 185,545,699.84 |
| වෙළඳ ණයකරුවන් | | 5,564,833.73 | 5,490,208.97 | 5,689,790.59 |
| විවිධ ණයකරුවන්, තැන්පතු සහ පූර්ව ගෙවීම් | 15 | 8,324,841.89 | 8,685,474.40 | 12,641,693.83 |
| දේපළ, පිරියත හා උපකරණ | 16 | 153,919,384.79 | 167,193,203.23 | 180,497,369.83 |
| ලිපිද්‍රව්‍ය හා පාරිභෝගික ද්‍රව්‍ය තොග | | 333,982.95 | 341,088.05 | 299,180.14 |
| පුස්තකාල ද්‍රව්‍ය | | 39,527.50 | 39,527.50 | 39,527.50 |
| **මුළු වත්කම්** | | 3,194,067,579.33 | 2,934,561,701.68 | 2,775,056,878.33 |
| **වගකීම්** | | | | |
| ගෙවීමට පවතින හිමිකම් | 17 | 295,073,784.16 | 243,615,705.53 | 246,681,605.15 |
| වාරික අත්තිකාරම් | | 13,444,971.76 | 8,508,652.96 | 11,711,685.41 |
| විවිධ ණයහිමියන්, උපචිත වූ වියදම් සහ වෙන්කිරීම් | 18 | 46,629,068.77 | 46,688,020.95 | 121,209,377.58 |
| ගෙවිය යුතු කාර්ය මණ්ඩල පාරිතෝෂික | 19 | 13,228,994.16 | 11,571,417.60 | 9,848,687.00 |
| **මුළු වගකීම** | | 368,376,818.85 | 310,383,797.04 | 389,451,355.14 |
| **සම කොටස්** | | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 20 | 30,000,000.00 | 30,000,000.00 | 30,000,000.00 |
| සංචිත | 21 | 2,795,690,760.48 | 2,594,177,904.64 | 2,355,605,523.19 |
| **මුළු සම කොටස්** | | 2,825,690,760.48 | 2,624,177,904.64 | 2,385,605,523.19 |
| **මුළු වගකීම සහ සම කොටස්** | | 3,194,067,579.33 | 2,934,561,701.68 | 2,775,056,878.33 |

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ගිණුම් සඳහා වන සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය අංගයකි.
මෙම මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලය වගකියනු ලැබේ.
අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මූල්‍ය ප්‍රකාශ අනුමත කරනු ලැබූ අතර ඔවුන් වෙනුවෙන් අත්සන් යොදන ලදී.

**ඩී පී අලුත්ගේ**
**සහකාර සාමාන්‍යාධිකාරී - මූල්‍ය**

**ඒ එච් ඩබ්ලිව් අඹවත්ත**
**සභාපති සහ කළමනාකාර අධ්‍යක්ෂ**
25.02.2021

**කේ එස් එම් ද සිල්වා**
**අධ්‍යක්ෂ**

## ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව
## වාර්ෂික මූල්‍ය ප්‍රකාශන - 2020

### 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රවාහය පිළිබඳ ප්‍රකාශය

| | 2020.12.31 දිනෙන් අවසන් වන වර්ෂය රු. | 2019.12.31 දිනෙන් අවසන් වන වර්ෂය රු. |
|---|---|---|
| මෙහෙයුම් කටයුතු වලින් ගැලීම් | | |
| බදුකරණයට පෙර ලාභය | **265,290,069** | **253,046,610** |
| මූල්‍ය නොවන අයිතම සඳහා ගැලපීම් | | |
| ක්ෂය වීම | 13,357,874 | 13,404,291 |
| පාරිතෝෂිකය සඳහා වෙන් කිරීම් | 1,844,827 | 1,882,031 |
| හිමිකම් සඳහා වෙන් කිරීම් | 95,128,166 | 87,735,173 |
| මූල්‍ය සේවා මත VAT බදු | 23,083,663 | 23,858,646 |
| සංචිත වලින්/(වෙත) පැවරීම් | -21,836,076 | -3,678,464 |
| කාරක ප්‍රාග්ධන වෙනසට පෙර මෙහෙයුම් ලාභය | 376,868,523 | 376,248,287 |
| වෙළඳ හා වෙනත් ලැබීම් අඩුවීම/(වැඩිවීම) | 286,008 | 4,155,801 |
| භාණ්ඩ ලැයිස්තු අඩුවීම/(වැඩිවීම) | 7,105 | -41,908 |
| වෙළඳ හා වෙනත් ගෙවීම් වැඩිවීම/(අඩුවීම) | 972,011 | -22,189,895 |
| මෙහෙයුම් වලින් උත්පාදනය වූ මුදල් | **378,133,647** | **358,172,285** |
| හිමිකම් ගෙවීම් | -43,670,087 | -90,801,073 |
| මූල්‍ය සේවා මත VAT බදු ගෙවීම් | -26,201,907 | -34,053,671 |
| ගෙවන ලද ආදායම් බදු | -34,917,537 | -56,135,233 |
| ගෙවන ලද පාරිතෝෂික | -187,250 | -159,300 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලැබෙන ශුද්ධ මූල්‍ය ප්‍රවාහ | **273,156,866** | **177,023,008** |
| ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලැබෙන මූල්‍ය ප්‍රවාහ | | |
| ස්ථාවර වත්කම් මිලදී ගැනීම | -84,056 | -100,125 |
| දීර්ඝ/කෙටි කාලීන ආයෝජන සඳහා පැවරීම් | -302,039,371 | -173,980,443 |
| විදේශ ව්‍යවහාර මුදල් ඉතුරුම් ගිණුමෙන්/ගිණුමට පැවරීම | 1,304,383 | 2,804,180 |
| භාණ්ඩාගාර භාර අරමුදලෙන් පැවරීම | 23,658,844 | -1,390,937 |
| ආයෝජන අරමුදලින්/අරමුදලට පැවරීම | 1,022,439 | -951,892 |
| ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලැබෙන ශුද්ධ මූල්‍ය ප්‍රවාහ | **-276,137,761** | **-173,619,217** |
| මුදල් සහ මුදල් සමාන දෑ වල ශුද්ධ වැඩිවීම/(අඩුවීම) | -2,980,895 | 3,403,791 |
| කාලසීමාව ආරම්භයේ දී මුදල් සහ මුදල් සමාන දෑ | 8,270,324 | 4,866,533 |
| කාලසීමාව අවසානයේ දී මුදල් සහ මුදල් සමාන දෑ | **5,289,429** | **8,270,324** |

## ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව
### වාර්ෂික මූල්‍ය ප්‍රකාශන - 2020
### 2020 දෙසැම්බර් 31 දිනට සංචිත

| | දායක කරන ලද ප්‍රාග්ධනය<br>රු. | පොදු සංචිත<br>රු. | ප්‍රත්‍යාගණන සංචිත<br>රු. | ආයෝජන අරමුදල<br>රු. | උපයා නොගත් වාරික<br>රු. | එකතුව<br>රු. |
|---|---|---|---|---|---|---|
| 2019 ජනවාරි 01 දිනට ශේෂය | 30,000,000.00 | 2,131,527,483.35 | 141,710,389.74 | 58,507,949.05 | 23,859,701.05 | 2,385,605,523.19 |
| ප්‍රත්‍යාගණන සංචිත වලින් පැවරීම | | 7,888,946.00 | -7,888,946.00 | | | 0.00 |
| 2019 වර්ෂය සඳහා ශුද්ධ ලාභය | | 242,250,845.43 | | | | 242,250,845.43 |
| 2019 වසර තුළ පැවරීම් | | | | | -3,678,463.98 | -3,678,463.98 |
| | | | | | | 0.00 |
| | | | | | | 0.00 |
| **2019 දෙසැම්බර් 31 දිනට ශේෂය** | 30,000,000.00 | 2,381,667,274.78 | 133,821,443.74 | 58,507,949.05 | 20,181,237.07 | 2,624,177,904.64 |
| ප්‍රත්‍යාගණන සංචිතයෙන් පැවරීම් | | 8,154,758.82 | -8,154,758.82 | | | 0.00 |
| 2020 වර්ෂය සඳහා ශුද්ධ ලාභය | | 223,348,932.03 | | | | 223,348,932.03 |
| 2020 වර්ෂය තුළදී පැවරීම් | | | | | -1,987,999.94 | -1,987,999.94 |
| 2020 සඳහා විශේෂ අයකිරීම් | | -19,848,076.25 | | | | -19,848,076.25 |
| **2020 දෙසැම්බර් 31 දිනට ශේෂය** | 30,000,000.00 | 2,593,322,889.38 | 125,666,684.92 | 58,507,949.05 | 18,193,237.13 | 2,825,690,760.48 |

ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව

වාර්ෂික මූල්‍ය ප්‍රකාශන - 2020

## 2020 වර්ෂය සඳහා වූ වාර්ෂික මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන්

| සටහන | | | 31.12.2020 | 31.12.2019 |
|---|---|---|---|---|
| | | | රු. | රු. |
| 1 | **දළ ලිඛිත වාරික ආදායම** | | | |
| | පූර්ව නැව්ගත කිරීම් ණය ඇපකරය | | 5,558,367.59 | 13,174,701.41 |
| | පශ්චාත් නැව්ගත කිරීම් ණය ඇපකරය | | 1,131,874.39 | 1,390,434.65 |
| | අපනයන කාර්යසාධන ඇපකර | | 0.00 | 1,055,082.00 |
| | ගුවන් ගමන් වියදම් ඇපකර (APARA) | | 613,442.56 | 1,477,700.32 |
| | අපනයන ගෙවීම් රක්ෂණ ඔප්පු (විකුණුම්කරුගේ අවදානම) | | 196,880,640.80 | 208,968,348.20 |
| | | | 204,184,325.34 | 226,066,266.58 |
| | උපයා නොගත් වාරික අඩුවීම | 1a. | 1,987,999.94 | 3,678,463.98 |
| | දළ ඉපැයූ වාරික | | 206,172,325.28 | 229,744,730.56 |
| 1අ | **උපයා නොගත් වාරික** | | | |
| | අපනයන ගෙවීම් රක්ෂණ ඔප්පු දළ උපයා නොගත් වාරික | | | |
| | ජනවාරි 1 වන දිනට ශේෂය | | 17,616,549.32 | 21,350,717.58 |
| | වසර තුළදී ප්‍රකාශිත වාරික | | 196,880,640.80 | 208,968,348.20 |
| | වසර තුළදී උපයාගත් වාරික | | 197,399,505.66 | 212,702,516.46 |
| | දෙසැම්බර් 31 දිනට ශේෂය | | 17,097,684.46 | 17,616,549.32 |
| | ණය ඇපකර දළ උපයා නොගත් වාරික | | | |
| | ජනවාරි 1 දිනට ශේෂය | | 2,564,687.76 | 2,508,983.47 |
| | වසර තුළදී ප්‍රකාශිත වාරික | | 7,303,684.54 | 17,097,918.38 |
| | වසර තුළදී උපයාගත් වාරික | | 8,772,819.62 | 17,042,214.10 |
| | දෙසැම්බර් 31 දිනට ශේෂය | | 1,095,552.68 | 2,564,687.75 |
| | දෙසැම්බර් 31 දිනට මුළු සංචිත | | 18,193,237.14 | 20,181,237.07 |
| | ජනවාරි 1 දිනට මුළු සංචිත | | 20,181,237.08 | 23,859,701.05 |
| | උපයා නොගත් වාරික සංචිතයේ ශුද්ධ වෙනස | | -1,987,999.94 | -3,678,463.98 |
| 2 | **වෙනත් මෙහෙයුම් ආදායම** | | | |
| | ඇපකර, රක්ෂණ ඔප්පු, පරිපාලන, සැකසුම් සහ BLL ගාස්තු | | 8,771,612.74 | 9,983,380.07 |
| | බිස්ඉන්ෆො ආදායම | | 4,065,607.68 | 5,354,346.60 |
| | ගෙවන ලද හිමිකම් ආපසු ගෙවීම් | | - | - |
| | | | 12,837,220.42 | 15,337,726.67 |
| 3 | **ආයෝජන ආදායම** | | | |
| | භාණ්ඩාගාර බිල්පත්/බැඳුම්කර | | 9,350,251.46 | 16,485,538.11 |
| | ඇමතුම් තැන්පතු | | 713,085.35 | 519,323.28 |
| | SMIB තැන්පතු | | 23,792.80 | 22,966.02 |
| | ණයකර | | 62,511,910.51 | 66,236,873.90 |
| | එ.ජ. ඩොලර් ස්ථාවර තැන්පතු | | 60,181,337.24 | 46,588,801.66 |
| | එ.ජ. ඩොලර් ඉතුරුම් | | 50,580.35 | 85,700.95 |
| | යූරෝ ස්ථාවර තැන්පතු | | 1,066,463.63 | 862,470.97 |
| | තාවකාලික අතිරික්ත භාර අරමුදල | | 455,412.82 | 1,436,457.38 |
| | ලාභාංශ | | 320,000.00 | 280,000.00 |
| | SLR ස්ථාවර තැන්පතු | | 80,666,592.92 | 84,390,517.04 |
| | ආයෝජන අරමුදල මත පොලිය | | 55,907.91 | 32,199.41 |
| | | | 215,395,334.99 | 216,940,848.72 |

ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව

වාර්ෂික මූල්‍ය ප්‍රකාශන - 2020

## 2020 වර්ෂය සඳහා වූ වාර්ෂික මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන්

| සටහන | | | 31.12.2020 | 31.12.2019 |
|---|---|---|---|---|
| | | | රු. | රු. |
| 4 | වෙනත් ආදායම් | | | |
| | කාර්ය මණ්ඩල ණය මත පොළිය | | 153,959.43 | 145,030.91 |
| | ස්ථාවර තැන්පතු බැහැර කිරීම මත ලාභය | | 0.00 | 0.00 |
| | පාරිතෝෂික අරමුදල මත භාණ්ඩාගාර බිල්පත් පොළිය | | 609,295.05 | 755,616.20 |
| | පාරිතෝෂික ඉතුරුම් ගිණුම මත පොළිය | | 4,862.94 | 5,113.98 |
| | විවිධ ආදායම් | | 5,880.00 | 520.00 |
| | විනිමය ලාභය/පාඩුව | | 30,291,749.37 | -5,963,729.31 |
| | | | 31,065,746.79 | -5,057,448.22 |
| 5 | ගෙවන ලද ශුද්ධ හිමිකම් | | | |
| | වසර අවසානයේ හිමිකම් වෙන්කිරීම් - නිශ්චිත | | 264,467,319.79 | 209,762,232.23 |
| | පසුගිය වර්ෂ වලදී ලබාදුන් හිමිකම් | | 112,486,887.81 | 75,353,828.30 |
| | 2020 වර්ෂය සඳහා හිමිකම් | | 151,980,431.98 | 134,408,403.93 |
| | අඩු කිරීම් : පෙර වර්ෂයේදී සිදුකරන ලද අතිරේක වෙන්කිරීම් | | 61,881,941.46 | 82,936,418.02 |
| | 2020 වර්ෂය සඳහා ශුද්ධ හිමිකම් - නිශ්චිත | | 90,098,490.52 | 51,471,985.91 |
| | අනිශ්චිත වෙන්කිරීම් - 2020 (කරුණාකර 17 වන සටහන බලන්න) | | 5,029,675.58 | 36,263,187.63 |
| | | | 95,128,166.10 | 87,735,173.54 |
| 6 | ආයතනික වියදම් | | | |
| | වරිපනම් | | 762,300.00 | 762,300.00 |
| | ජලය | | 86,080.14 | 109,807.77 |
| | විදුලිය | | 1,160,093.54 | 1,486,222.77 |
| | දුරකථන | | 788,789.91 | 869,754.72 |
| | ඊ මේල් සහ අන්තර්ජාලය, වෙබ්අඩවිය | | 762,102.70 | 646,004.90 |
| | ආරක්ෂාව | | 512,207.00 | 412,644.98 |
| | ක්ෂයවීම් | ගොඩනැගිලි | 8,825,000.00 | 8,825,000.00 |
| | | මෝටර් වාහන | 2,680,000.00 | 2,680,000.00 |
| | | කාර්යාල උපකරණ | 296,217.37 | 272,843.37 |
| | | පරිගණක සහ මුද්‍රණ යන්ත්‍ර | 1,355,863.07 | 1,343,408.08 |
| | | ගෘහභාණ්ඩ සහ උපාංග | 140,923.00 | 140,923.00 |
| | | මෘදුකාංග | 59,871.00 | 142,117.15 |
| | රක්ෂණය - | ගොඩනැගිලි - කාර්යාල පරිශ්‍ර (නවම් මාවත) | 115,238.48 | 116,940.12 |
| | | මෝටර් වාහන | 249,862.95 | 249,788.37 |
| | | කාර්යාල උපකරණ, ගෘහභාණ්ඩ සහ උපාංග | 14,863.22 | 12,091.21 |
| | අලුත්වැඩියා සහ නඩත්තුව - | ගොඩනැගිලි | 0.00 | 0.00 |
| | | මෝටර් වාහන | 516,284.29 | 1,503,083.98 |
| | | කාර්යාල උපකරණ, ගෘහභාණ්ඩ | 58,471.89 | 9,299.22 |
| | | පරිගණක සහ මුද්‍රණ යන්ත්‍ර | 469,215.00 | 546,525.27 |
| | | මෘදුකාංග | 113,995.78 | 121,327.54 |
| | කාර්යාල පරිශ්‍ර නඩත්තුව | | 802,529.69 | 759,320.27 |
| | | | 19,769,909.03 | 21,009,402.72 |

ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව

වාර්ෂික මූල්‍ය ප්‍රකාශන - 2020

## 2020 වර්ෂය සඳහා වූ වාර්ෂික මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන්

| සටහන | | 31.12.2020 | 31.12.2019 |
|---|---|---|---|
| | | රු. | රු. |
| 7 | **පරිපාලන වියදම්** | | |
| | වැටුප් සහ දීමනා | 24,173,770.78 | 24,094,489.11 |
| | වෙනත් කාර්ය මණ්ඩල ප්‍රතිලාභ | 11,521,046.98 | 12,130,912.18 |
| | බඳවා ගැනීම්, දේශීය පුහුණු සහ අධ්‍යාපන ආයතන සඳහා දායකත්වය | 20,975.00 | 531,703.10 |
| | තේ පැන් සහ ආශ්‍රිත වියදම් | 417,885.04 | 778,605.40 |
| | සේවා නියුක්තියන්ගේ අර්ථසාධක අරමුදල | 6,248,583.39 | 6,131,827.10 |
| | සේවා නියුක්තියන්ගේ භාරකාර අරමුදල | 781,073.10 | 766,478.56 |
| | පාරිතෝෂික | 1,844,826.56 | 1,882,030.60 |
| | විදේශ පුහුණුව | 0.00 | 157,118.47 |
| | අධ්‍යක්ෂකවරුන්ගේ ගාස්තු | 320,000.00 | 80,000.00 |
| | ගමනාගමන, ප්‍රවාහන සහ යැපීම් | 1,192,706.00 | 445,558.10 |
| | තැපැල් ගාස්තු | 33,325.00 | 53,176.00 |
| | වාර්ෂික වාර්තාව සහ වෙනත් මුද්‍රණය කිරීම් | 994,022.00 | 112,586.05 |
| | ලිපි ද්‍රව්‍ය | 202,884.27 | 163,875.44 |
| | ඉන්ධන | 755,603.00 | 830,639.00 |
| | බාහිර විගණන ගාස්තු | 364,320.00 | 901,037.84 |
| | අභ්‍යන්තර විගණන ගාස්තු | 616,480.00 | 542,543.83 |
| | වෘත්තීය, නීති සහ උපදේශන ගාස්තු | 130,435.00 | 143,383.45 |
| | පොදු වියදම් | 15,415.00 | 21,255.00 |
| | මුද්දර ගාස්තු | 10,025.00 | 10,125.00 |
| | පුවත්පත්, පොත් සහ සඟරා | 21,982.00 | 48,770.00 |
| | සංවත්සර වියදම් | 739,500.00 | 952,651.70 |
| | සේවක ආරක්ෂණ වියදම් (COVID) | 407,048.00 | 0.00 |
| | | 50,811,906.12 | 50,778,765.93 |
| 8 | **විකුණුම් සහ අලෙවිකරණ වියදම්** | | |
| | ප්‍රවර්ධන ආයෝජන | 540,000.00 | 1,524,814.04 |
| | වෙළඳ ප්‍රචාරණය - මුද්‍රිත සහ විද්‍යුත් මාධ්‍ය | | |
| | පුවත්පත්, සඟරා, ජර්නල් සහ ගුවන්විදුලියේ ප්‍රචාරණය | 0.00 | 227,625.98 |
| | අත්පොත්, පත්‍රිකා, ඉල්ලුම්පත්‍ර යනාදිය මුද්‍රණ වියදම් | 30,943.83 | 44,692.71 |
| | ව්‍යාපාර සංචාර (විදේශ) සහ සම්මේලන | 2,414.19 | 2,386,964.89 |
| | වෙළඳ ප්‍රදර්ශන, සේවාදායක රැස්වීම්, සුහද හමුවීම් | 0.00 | 777,153.66 |
| | ඉන්ධන පිරිවැය | 212,877.00 | 271,153.00 |
| | වාර්ෂික සුභපැතුම්, සුභ පැතුම්පත් සහ ත්‍යාග | 0.00 | 20,189.08 |
| | විනෝද උත්සව | 6,085.00 | 176,944.13 |
| | ආයතනික සාමාජිකත්වය | 167,628.80 | 195,049.60 |
| | අන්තර්ජාතික වෘත්තීය සහ අපනයන ආශ්‍රිත සංවිධාන සඳහා දායකවීම | 3,099,700.00 | 3,203,950.00 |
| | | 4,059,648.82 | 8,828,537.09 |

## ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව

## වාර්ෂික මූල්‍ය ප්‍රකාශන - 2020

## 2020 වර්ෂය සඳහා වූ වාර්ෂික මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන්

| සටහන | | 31.12.2020 | 31.12.2019 |
|---|---|---|---|
| | | රු. | රු. |
| 9 | මූල්‍ය ගාස්තු | | |
| | බැංකු ගාස්තු | **65,624.28** | **93,381.54** |
| | මුද්දර ගාස්තු | **23,700.00** | **39,750.00** |
| | ජාතිය ගොඩනැගීමේ බද්ද | **132.00** | **3,181,153.00** |
| | | **89,456.28** | **3,314,284.54** |

9අ ආදායම් බදු

2018 අප්‍රේල් 1 වන දින සිට බලපැවැත්වෙන 2017 අංක 24 දරණ නව දේශීය ආදායම් පනත හා එහි පසුව සිදුකරන ලද සංශෝධන අනුව, සංස්ථාවේ මුළු ආදායම ආදායම් බද්දට යටත් වූ අතර මීට පෙර එහි ආයෝජන ආදායම පමණක් ඊට යටත් විය . 2018 ට පෙර සංස්ථාව 28% ක අනුපාතයකින් ආදායම් බදු ගෙවා ඇති අතර නව සංශෝධන සමඟ සංස්ථාව සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක් ලෙස වර්ගීකරණය කර ඇති අතර එහි ප්‍රතිඵලයක් ලෙස 14% ක අඩු අනුපාතයකට බදු ගෙවනු ලැබේ. කෙසේ වෙතත්, මෙම අනුපාත වෙනස 2018 අවසන් ගිණුම් සකස් කිරීමෙන් පසුව සිදු කරන ලද බැවින් එහි ප්‍රතිඵලයක් ලෙස රු.33,270,216/- ක ආදායම් බද්දක් වැඩිපුර වෙන්කර ඇත. 14% අනුපාතයකින් ගණනය කරන ලදුව, 2019 සඳහා ආදායම් බද්ද රු.44,065,981/- ක් වුවද, ඉහත සඳහන් වැඩිපුර කරන ලද වෙන්කිරීම හේතුවෙන් 2019 සඳහා ආදායම් බදු ගාස්තුව රු.10,795,765/- ක් පමණක් විය.

# ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව

## වාර්ෂික මූල්‍ය ප්‍රකාශන - 2020

### 2020 වර්ෂය සඳහා වූ වාර්ෂික මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන්

| සටහන | | 31.12.2020 | 31.12.2019 | 01.01.2019 |
|---|---|---|---|---|
| | | රු. | රු. | රු. |
| 10 | **මුදල් සහ මුදල් සමාන දෑ** | | | |
| | **බැංකුවේ පවතින මුදල්** | | | |
| | හැටන් නැෂනල් බැංකු ජංගම ගිණුම් | 833,186.30 | 2,914,982.32 | 2,952,847.24 |
| | හැටන් නැෂනල් බැංකු ඇමතුම් තැන්පතු ගිණුම | 3,956,769.44 | 4,599,867.42 | 1,039,649.51 |
| | ලංකා බැංකු ජංගම ගිණුම | 303,541.03 | 656,841.87 | 690,569.69 |
| | මහජන බැංකු ජංගම ගිණුම | 193,932.65 | 96,632.25 | 181,466.65 |
| | | 5,287,429.42 | 8,268,323.86 | 4,864,533.09 |
| | අතැති මුදල් | 2,000.00 | 2,000.00 | 2,000.00 |
| | | 5,289,429.42 | 8,270,323.86 | 4,866,533.09 |
| 11 | **විදේශ ව්‍යවහාර මුදල් ඉතුරුම් ගිණුම්** | | | |
| | ලංකා බැංකුව - එ.ජ. ඩොලර් ගිණුම | 427,221.00 | 1,745,301.68 | 1,075,334.60 |
| | මහජන බැංකුව - එ.ජ. ඩොලර් ගිණුම | 219,592.56 | 209,974.03 | 3,683,261.55 |
| | යූරෝ ඉතුරුම් ගිණුම | 36,129.25 | 32,050.82 | 32,911.04 |
| | | 682,942.81 | 1,987,326.53 | 4,791,507.19 |
| 12 | **කෙටි කාලීන ආයෝජන** | | | |
| | එ.ජ.ඩොලර් ස්ථාවර තැන්පතු | 1,094,313,602.04 | 1,002,677,864.30 | 949,327,865.33 |
| | යූරෝ ස්ථාවර තැන්පතු | 44,773,966.24 | 38,773,597.24 | 38,926,247.85 |
| | SLR ස්ථාවර තැන්පතු | 1,238,656,249.70 | 795,200,000.00 | 674,533,380.82 |
| | පාරිතෝෂික ඉතුරුම් ගිණුම | 135,363.49 | 130,500.55 | 125,642.28 |
| | පාරිතෝෂික ඉතුරුම් මත භාණ්ඩාගාර බිල්පත් | 9,670,802.83 | 9,043,104.51 | 8,267,296.74 |
| | | 2,387,549,984.30 | 1,845,825,066.60 | 1,671,180,433.02 |
| 13 | **දීර්ඝ කාලීන ආයෝජන** | | | |
| | ණයකර | 400,000,000.00 | 550,000,000.00 | 550,000,000.00 |
| | ඉන්ග්‍රින් ලිමිටඩ් ආයතනයේ කොටස් | 10.00 | 10.00 | 10.00 |
| | ණය තොරතුරු කාර්යාංශයේ කොටස් | 123,700.00 | 123,700.00 | 123,700.00 |
| | භාණ්ඩාගාර බැඳුම්කර | 45,539,867.72 | 137,010,481.76 | 137,010,481.76 |
| | | 445,663,577.72 | 687,134,191.76 | 687,134,191.76 |
| 14 | **ලැබිය යුතු පොලිය** | | | |
| | භාණ්ඩාගාර තැන්පතු | 67,154,144.92 | 67,154,144.92 | 67,154,144.92 |
| | භාණ්ඩාගාර බිල්පත්/බැඳුම්කර | 6,326,427.81 | 7,709,193.46 | 6,870,522.91 |
| | ණයකර | 53,438,003.40 | 56,494,629.12 | 53,909,759.62 |
| | එ.ජ.ඩොලර් ස්ථාවර තැන්පතු | 24,318,212.96 | 21,354,679.38 | 15,766,425.71 |
| | තාවකාලික අතිරික්ත භාර අරමුදල | 0.00 | 733,819.26 | 688,299.12 |
| | පාරිතෝෂික අරමුදල් - භාණ්ඩාගාර බිල්පත් | 49,096.94 | 67,500.21 | 87,691.78 |
| | SLR ස්ථාවර තැන්පතු | 35,380,690.24 | 31,367,543.22 | 41,066,576.19 |
| | යූරෝ ස්ථාවර තැන්පතු | 0.00 | 0.00 | 2,279.59 |
| | | 186,666,576.27 | 184,881,509.57 | 185,545,699.84 |

ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව

වාර්ෂික මූල්‍ය ප්‍රකාශන - 2020

## 2020 වර්ෂය සඳහා වූ වාර්ෂික මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන්

සටහන

| | | | 31.12.2020 | 31.12.2019 | 01.01.2019 |
|---|---|---|---|---|---|
| | | | රු. | රු. | රු. |
| 15 | **විවිධ ණයකරුවන්, තැන්පතු සහ පූර්ව ගෙවීම්** | | | | |
| | අපනයන බිල්පත් වට්ටම් කිරීමේ පහසුකම් මත අත්තිකාරම් | | 34,958,636.11 | 34,958,636.11 | 34,958,636.11 |
| | අඩුකිරීම්: අඩමාන ණය සඳහා වෙන්කිරීම් | | 34,958,636.11 | 34,958,636.11 | 34,958,636.11 |
| | | | 0.00 | 0.00 | 0.00 |
| | කාර්ය මණ්ඩල ණය සහ පොදු අත්තිකාරම් | | 2,927,151.71 | 3,971,796.65 | 2,672,837.08 |
| | විවිධ තැන්පතු | 15 (අ) | 108,837.50 | 108,837.50 | 108,837.50 |
| | රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු තැන්පතු | | 614,833.29 | 591,040.49 | 570,371.07 |
| | ආපසු ලබාදෙන තැන්පතු | | 56,500.00 | 56,500.00 | 56,500.00 |
| | විවිධ ණයකරුවන් | | 770.00 | 770.00 | 770.00 |
| | රැඳවුම් බදු ලැබීම් | | 0.00 | 249,081.23 | 5,828,686.32 |
| | පූර්ව ගෙවීම් | | 329,692.71 | 1,069,012.47 | 582,046.46 |
| | ලැබිය යුතු බිස්ඉන්ගො ආදායම | | 2,101,545.68 | 363,012.00 | 636,134.40 |
| | අගරු වූ චෙක්පත් | | | 89,913.06 | 0.00 |
| | ලැබිය යුතු මූල්‍ය සේවා මත VAT | | 2,185,511.00 | 2,185,511.00 | 2,185,511.00 |
| | | | 8,324,841.89 | 8,685,474.40 | 12,641,693.83 |
| 15 (අ) | **විවිධ තැන්පතු** | | | | |
| | ශ්‍රී ලංකා ටෙලිකොම් | | 57,700.00 | 57,700.00 | 57,700.00 |
| | සීමාසහිත ලංකා පුවත්පත් සංගමය | | 27,625.00 | 27,625.00 | 27,625.00 |
| | දත්ත ජාල විද්‍යුත් විදුලි සංදේශ පද්ධතිය | | 15,000.00 | 15,000.00 | 15,000.00 |
| | ICLP බේරුම්කරණ මධ්‍යස්ථානය | | 8,512.50 | 8,512.50 | 8,512.50 |
| | | | 108,837.50 | 108,837.50 | 108,837.50 |
| 16 | දේපළ, පිරියත හා උපකරණ - ඇමුණුම (පිටු අංක 13) | | | | |
| 17 | **ගෙවීමට නියමිත හිමිකම්** | | | | |
| | විශේෂිත වෙන්කිරීම් | | 264,467,319.79 | 209,762,232.23 | 212,590,775.48 |
| | **හිමිකම් සඳහා අවිනිශ්චිත වෙන්කිරීම්** | | | | |
| | ජනවාරි 01 වන දිනට ශේෂය | | 33,853,473.30 | 34,090,829.67 | 35,909,810.15 |
| | වසර තුළදී උපයෝජනය කිරීම් | | 8,276,684.51 | 36,500,544.00 | 971,135.84 |
| | වසර සඳහා ගාස්තු | | 5,029,675.58 | 36,263,187.63 | -847,844.64 |
| | දෙසැම්බර් 31 දිනට පවතින වෙන්කිරීම් ශේෂය | | 30,606,464.37 | 33,853,473.30 | 34,090,829.67 |
| | හිමිකම් සඳහා මුළු වෙන්කිරීම් | | 295,073,784.16 | 243,615,705.53 | 246,681,605.15 |

## ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව

## වාර්ෂික මූල්‍ය ප්‍රකාශන - 2020

### 2020 වර්ෂය සඳහා වූ වාර්ෂික මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන්

| සටහන | | 31.12.2020 | 31.12.2019 | 01.01.2019 |
|---|---|---|---|---|
| | | රු. | රු. | රු. |
| 18 | **විවිධ ණය හිමියන්, උපචිත වූ වියදම් සහ වෙන්කිරීම්** | | | |
| | **විවිධ ණය හිමියන්** | | | |
| | සාමාන්‍ය VAT බදු (රක්ෂණ ඔප්පු වාරිකයෙන් අය කරන ලද) | | 32,662.00 | 190,455.06 |
| | කාර්ය මණ්ඩල වෛද්‍ය අරමුදල | 612,978.00 | 570,378.00 | 397,073.00 |
| | ආපසු ගෙවනු ලබන තැන්පතු | 1,465,700.00 | 1,574,900.00 | 1,535,000.00 |
| | **උපචිත වූ වියදම්** | | | |
| | සේවා නියුක්තියන්ගේ අර්ථසාධක අරමුදල | 1,170,380.98 | 1,030,753.26 | 1,089,079.04 |
| | සේවා නියුක්තියන්ගේ භාර අරමුදල | 115,701.35 | 100,050.21 | 104,928.03 |
| | ඉපැයුම් මත බද්ද | 0.00 | 5,617.00 | 13,290.00 |
| | මුද්දර ගාස්තු | 8,525.00 | 12,000.00 | 12,450.00 |
| | ජාතිය ගොඩනැගීමේ බද්ද | 0.00 | 1,221,854.00 | 4,275,815.00 |
| | වෙනත් ගෙවීම් | 8,728,879.49 | 6,901,608.66 | 7,568,784.17 |
| | තත්ත්ව වාර්තා සඳහා ගාස්තු | 1,790,343.30 | 1,868,712.17 | 1,839,170.16 |
| | **වෙන්කිරීම්** | | | |
| | ගෙවිය යුතු විගණන ගාස්තු | 1,440,000.00 | 1,853,280.00 | 2,137,633.92 |
| | ගෙවිය යුතු ආදායම් බදු | 23,425,901.65 | 16,402,302.65 | 61,741,771.20 |
| | මූල්‍ය සේවා මත වැට් බදු | 6,045,659.00 | 9,163,903.00 | 19,358,928.00 |
| | වාර්ෂික වාර්තා මුද්‍රණ ගාස්තු | 1,825,000.00 | 950,000.00 | 945,000.00 |
| | ගෙවිය යුතු විශේෂ බදු | | 5,000,000.00 | 20,000,000.00 |
| | | 46,629,068.77 | 46,688,020.95 | 121,209,377.58 |
| 19 | **ගෙවිය යුතු පාරිතෝෂික** | | | |
| | ගිණුමේ හැසිරීම | | | |
| | ජනවාරි 01 වන දිනට ශේෂය | 11,571,417.60 | 9,848,687.00 | 13,488,109.75 |
| | වසර තුළ ගෙවන ලද මුදල් | 187,250.00 | 159,300.00 | 263,500.00 |
| | වසර සඳහා වෙන්කිරීම් | 1,844,826.56 | 1,882,030.60 | 625,168.00 |
| | පොදු සංචිතයට මාරු කරන ලද අතිරික්ත වෙන්කිරීම් | 0.00 | 0.00 | 4,001,090.75 |
| | දෙසැම්බර් 31 දිනට ශේෂය | 13,228,994.16 | 11,571,417.60 | 9,848,687.00 |

නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම - පාරිතෝෂිකය: නිශ්චිත ප්‍රතිලාභ සැලැස්මට අදාළව සංස්ථාවේ ශුද්ධ වගකීම ගණනය කරනු ලබන්නේ වර්තමාන කාල සීමා
සේවකයින් සිය සේවයට ප්‍රතිලාභ වශයෙන් උපයා ඇති අනාගත ප්‍රතිලාභ ප්‍රමාණය තක්සේරු කිරීමෙන් සහ එහි වර්තමාන වටිනාකම තීරණය කිරීම සඳ
ලබා දීමෙනි. 2018 සිට LKAS 19 - සේවක ප්‍රතිලාභ, යොදා ගැනීමත් සමඟ වර්තමාන සේවා පිරිවැය රු.770,207/-ක් සහ නිශ්චිත ප්‍රතිලාභ වගකීම්වල
වටිනාකම රු.13,228,994/- ක් ප්‍රක්ෂේපිත ඒකක ණය ක්‍රමය යටතේ හඳුනාගෙන ඇත .
ආයුගණක ගණනය කිරීම 2018 සිට බලපැවැත්වෙන පරිදි ආරම්භ කරන ලද අතර , ප්‍රමිතියට අනුව ආයුගණක තක්සේරු කිරීම වසර තුනකට වරක් සිදු
බැවින් මුල් ගණනය කිරීමේදී සලකා බැලූ වට්ටම් සාධකය මගින් ඉහළ නැගුණු 2019 ප්‍රමාණයන් භාවිතා කිරීමෙන් 2020 සඳහා අගයන් ව්‍යුත්පන්න ක

| සටහන | | 31.12.2020 | 31.12.2019 | 01.01.2019 |
|---|---|---|---|---|
| 20 | **යොදවන ලද ප්‍රාග්ධනය** | | | |
| | දායක කරන ලද ප්‍රාග්ධනය - භාණ්ඩාගාර | 30,000,000.00 | 30,000,000.00 | 30,000,000.00 |

21 සංචිත - ඇමුණුම (පිටු අංක 14)

22 **විනිමය අනුපාතිකය**

2020 දෙසැම්බර් අවසානයේදී විදේශ ව්‍යවහාර මුදල් පරිවර්තනය කිරීම සඳහා පහත දැක්වෙන විනිමය අනුපාතික භාවිතා කර ඇත .

| | | |
|---|---|---|
| එ.ජ.ඩොලර් | - | 184.12 |
| යූරෝ | - | 225.54 |

ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව

වාර්ෂික මූල්‍ය ප්‍රකාශන - 2020

2020 වර්ෂය සඳහා වූ වාර්ෂික මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන්

23 ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය පිළිබඳ අනාවරණය කිරීම

ප්‍රත්‍යාගණනය බලාත්මක වන දිනය

| | |
|---|---|
| ගොඩනැගිලි | 01.01.2018 |
| මෝටර් වාහන | 31.12.2016 |
| පරිගණක සහ මුද්‍රණ යන්ත්‍ර | 31.12.2016 |
| කාර්යාල උපකරණ | 31.12.2016 |
| ගෘහභාණ්ඩ සහ උපාංග | 31.12.2016 |

- රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව විසින් තක්සේරු කිරීම සිදුකරන ලදි.
- පරීක්ෂා කිරීමෙන් හා නිරීක්ෂණය කිරීමෙන් අනතුරුව, වටිනාකමට බලපාන සියලු සාධක සැලකිල්ලට ගනිමින් හැකිතාක් නිවැරදිව තක්සේරු කිරීම සිදු කර ඇත.
- ප්‍රත්‍යාගණනය මගින් ලැබුණු වටිනාකම වත්කම්වල වෙළඳපළ වටිනාකමයි.
- පිරිවැය ආදර්ශකය යටතේ ප්‍රත්‍යාගණන වත්කම් වල ධාරණ වටිනාකම

| | |
|---|---:|
| ගොඩනැගිලි | 3,327.35 |
| මෝටර් වාහන | 0.00 |
| පරිගණක සහ මුද්‍රණ යන්ත්‍ර | 0.00 |
| කාර්යාල උපකරණ | 0.00 |
| ගෘහභාණ්ඩ සහ උපාංග | 8,951.62 |

24 අවිනිශ්චිත වගකීම්

(අ) සංස්ථාවට එරෙහිව ගොණු කරන ලද නඩු

ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාවට එරෙහිව සදරින් සන් වීස් (පුද්) සමාගම ; HC (සිවිල්) 193 2004 (I) රු.මි.17.02ක වටිනාකමින් යුත් හිමිකමක් ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් අපනයනකරුවෙකු විසින් කොළඹ වාණිජ මහාධිකරණයේදී මෙම නඩුව ගොණු කරන ලදි .
වත්මන් තත්ත්වය : අපනයනකරුට වාසි සහගත ලෙස තීන්දුව ප්‍රකාශයට පත්කරන ලද අතර , වන්දි මුදල ලැබීමට පෙර අපනයනකරු විසින් ඇතැම් කොන්දේසි සම්පූර්ණ කිරීමට අවශ්‍ය විය . මේ වනතුරු අපනයනකරු විසින් නියම කරන ලද කොන්දේසි සපුරා ලීමට අසමත් වීම නිසා ගෙවීම් අත්හිටුවා තිබේ .

(ආ) 2020 දෙසැම්බර් 31 දිනට බලාත්මකව පවතින සංස්ථාවේ මුළු වගකීම්

| | | |
|---|---|---:|
| - වලංගුව පවත්නා අපනයන ගෙවීම් රක්ෂණ ඔප්පු | රු. | 12,677,000,000.00 |
| - වලංගුව පවත්නා ණය ඇපකර | රු. | 1,635,323,479.00 |
| උපරිම වගකීම | රු. | 14,312,323,479.00 |

25 ආයෝජන අරමුදල් ගිණුම

මූල්‍ය සේවා මත 8%ක VAT සහ ආදායම් බද්දෙන් 5%ක එකතුවට සමාන මුදලක් භාණ්ඩාගාර නියෝගයක් මත වාර්ෂික පදනමින් මාරු කිරීම සඳහා 2011 නොවැම්බර් මස ආයෝජන අරමුදල් ගිණුමක් පිහිටුවන ලදි . සංස්ථාව අරමුදල් ණය වශයෙන් ලබාදීමේ නිරත නොවන බැවින් , ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද උපදෙස් අනුව , ආයෝජන අරමුදල් ගිණුමේ මුදල් වසර 7ක කාලයකට භාණ්ඩාගාර බැඳුම්කර වල ආයෝජනය කර ඇත .
සංස්ථාව වසර 7ක භාණ්ඩාගාර බැඳුම්කර සඳහා රු .මි.51ක ප්‍රකාශිත අගයක් සහිතව රු .මි.45.54ක මුදලක් ආයෝජනය කර ඇති අතර, මෙම ආයෝජන දීර්ඝ කාලීන ආයෝජන යටතේ ලැයිස්තු ගත කර ඇත .

26 ආශ්‍රිත පාර්ශ්වවල බැඳියාව

2020 වර්ෂය තුළදී ආශ්‍රිත පාර්ශ්වවල බැඳියාවන් නොමැත .

## ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව

### දේපළ පිරියත සහ උපකරණ - 2020

| අයිතමය | 2020.01.01 දිනට පිරිවැය මත වත්කම් රු. | 2020.01.01 දිනට ප්‍රත්‍යාංගණනය මත වත්කම් රු. | එකතු කිරීම 2020 රු. | බැහැර කිරීම 2020 රු. | 2020.12.31 දිනට ශුද්ධ අගය රු. | 2020.01.01 දිනට ක්ෂයවීම් රු. | 2020 වර්ෂයේ ක්ෂයවීම් රු. | 2020.12.31 දිනට සමුච්චිත ක්ෂයවීම් රු. | 2020.12.31 දිනට සඳහන් වටිනාකම රු. |
|---|---|---|---|---|---|---|---|---|---|
| ගොඩනැගිලි | 0.00 | 176,500,000.00 | 0.00 | 0.00 | 176,500,000.00 | 17,650,000.00 | 8,825,000.00 | 26,475,000.00 | 150,025,000.00 |
| මෝටර් වාහන | 0.00 | 13,400,000.00 | 0.00 | 0.00 | 13,400,000.00 | 8,040,000.00 | 2,680,000.00 | 10,720,000.00 | 2,680,000.00 |
| මෘදුකාංග | 6,672,949.77 | 0.00 | 0.00 | 0.00 | 6,672,949.77 | 6,613,066.77 | 59,871.00 | 6,672,937.77 | 12.00 |
| පරිගණක සහ | 0.00 | 2,846,500.00 | 0.00 | 0.00 | 2,846,500.00 | 2,134,875.00 | 711,625.00 | 2,846,500.00 | 0.00 |
| මුද්‍රණ යන්ත්‍ර | 2,576,952.33 | 0.00 | 0.00 | 0.00 | 2,576,952.33 | 1,694,167.07 | 644,238.07 | 2,338,405.14 | 238,547.19 |
| ගෘහභාණ්ඩ සහ | 64,059.75 | 0.00 | 0.00 | 0.00 | 64,059.75 | 15,779.53 | 6,403.00 | 22,182.53 | 41,877.22 |
| උපාංග | 0.00 | 1,345,200.00 | 0.00 | 0.00 | 1,345,200.00 | 403,560.00 | 134,520.00 | 538,080.00 | 807,120.00 |
| කාර්යාල | 0.00 | 668,750.00 | 0.00 | 0.00 | 668,750.00 | 501,562.50 | 167,187.50 | 668,750.00 | 0.00 |
| උපකරණ | 437,187.49 | 0.00 | 84,056.00 | 0.00 | 521,243.49 | 265,385.24 | 129,029.87 | 394,415.11 | 126,828.38 |
| එකතුව | 9,751,149.34 | 194,760,450.00 | 84,056.00 | 0.00 | 204,595,655.34 | 37,318,396.11 | 13,357,874.44 | 50,676,270.55 | 153,919,384.79 |

# ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව
## වාර්ෂික මූල්‍ය ප්‍රකාශන - 2020
## 2020 දෙසැම්බර් 31 දිනට සංචිත

| | පොදු සංචිත<br>රු. | ප්‍රත්‍යාගණන සංචිත<br>රු. | ආයෝජන අරමුදල<br>රු. | උපයා නොගත් වාරික<br>රු. | එකතුව<br>රු. |
|---|---|---|---|---|---|
| 2019 ජනවාරි 01 දිනට ශේෂය | 2,131,527,483.35 | 141,710,389.74 | 58,507,949.05 | 23,859,701.05 | 2,355,605,523.19 |
| ප්‍රත්‍යාගණන සංචිත වලින් පැවරීම | 7,888,946.00 | -7,888,946.00 | | | 0.00 |
| 2019 වර්ෂය සඳහා ශුද්ධ ලාභය | 242,250,845.43 | | | | 242,250,845.43 |
| 2019 වසර තුළ පැවරීම් | | | | -3,678,463.98 | -3,678,463.98 |
| | | | | | 0.00 |
| | | | | | 0.00 |
| **2019 දෙසැම්බර් 31 දිනට ශේෂය** | 2,381,667,274.78 | 133,821,443.74 | 58,507,949.05 | 20,181,237.07 | 2,594,177,904.64 |
| ප්‍රත්‍යාගණන සංචිතයෙන් පැවරීම | 8,154,758.82 | -8,154,758.82 | | | 0.00 |
| 2020 වර්ෂය සඳහා ශුද්ධ ලාභය | 223,348,932.03 | | | | 223,348,932.03 |
| 2020 වර්ෂය තුළදී පැවරීම් | | | | -1,987,999.94 | -1,987,999.94 |
| 2020 සඳහා විශේෂ අයකිරීම් | -19,848,076.25 | | | | -19,848,076.25 |
| **2020 දෙසැම්බර් 31 දිනට ශේෂය** | 2,593,322,889.38 | 125,666,684.92 | 58,507,949.05 | 18,193,237.13 | 2,795,690,760.48 |

# ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව (SLECIC)

## සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති

**සාමාන්‍ය තොරතුරු**

ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව 1978 අංක 15 දරන ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථා පනත මඟින් පිහිටවනු ලැබූ අතර 1979 පෙබරවාරි 8 දින වාණිජ මෙහෙයුම් කටයුතු ආරම්භ කරන ලදී. සංස්ථාවේ ලියාපදිංචි කාර්යාලය 4 වන මහළ, NDB-EDB කුළුණ, අංක 42, නවම් මාවත, කොළඹ 02 ලිපිනයේ පිහිටා ඇත.

**සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති පිළිබඳ සාරාංශය**

මෙම මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේදී අදාල කරගනු ලබන මූලික ගිණුම්කරණ ප්‍රතිපත්ති පහත දක්වා ඇත.

### 01. සකස් කිරීමේ පදනම

### 1.1 මූලික කටයුතු හා මෙහෙයුම් කටයුතු වල ස්වභාවය

වාණිජ හා දේශපාලන හේතූන් මත විදේශීය ගැනුම්කරුවන් විසින් නොගෙවීමේ අවදානම ආවරණය කරමින් අපනයනකරුවන්ට අපනයන ගෙවීම් රක්ෂණ ඔප්පු නිකුත් කිරීම මඟින් අපනයන වෙළඳාමේ අවදානම් දැරීම සහ අපනයනකරුවන්ට ඔවුන්ගේ අපනයන ව්‍යාපාර සඳහා අරමුදල් අවශ්‍යතා සපුරාලීම සඳහා ප්‍රධාන වශයෙන් ලිහිල් මූල්‍ය ප්‍රදානයන් සිදු කිරීමට පහසුකම් සැලසීම සඳහා බැංකුවලට සහ වෙනත් මූල්‍ය ආයතනවලට ඇපකර නිකුත් කිරීම සංස්ථාවේ ප්‍රධාන ක්‍රියාකාරකම් වේ.

### 1.2 ගණනය කිරීමේ පදනම

2020 දෙසැම්බර් 31 දිනට සහ අවසන්වූ වර්ෂය සඳහා සංස්ථාවේ ගිණුම් ප්‍රතිපත්ති සහ නිවේදන සමගින් (මූල්‍ය ප්‍රකාශ) සංස්ථාවේ ශේෂ පත්‍රය, ආදායම් සහ වියදම් ගිණුම, සමකොටස් වෙනස්වීම සහ මූල්‍ය ප්‍රවාහයන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල වන්නේ ය. මෙම මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කරනු ලැබේ. පැරණි පිරිවැය පදනම මත මූල්‍ය ප්‍රකාශ සකස් කරනු ලබන අතර මූල්‍ය ප්‍රකාශ සඳහා බලපාන උද්ධමන සාධක සඳහා ගැලපීම් කිරීමක් නොමැතිව එම මූල්‍ය ප්‍රකාශ නිතරම අදාල කරගනු ලැබේ.

### 1.3 ඇස්තමේන්තු සහ තීන්දු භාවිත කිරීම

මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රතිපත්ති (LKAS) වලට අනුකූල වන අතර ඒ සඳහා වත්කම් හා වගකීම්, ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රතිපත්ති සහ වාර්තාගත මුදල් අදාළ වීමට බලපානු ලබන තීන්දු, ඇස්තමේන්තු සහ උපකල්පන ලබාදීම සඳහා වූ කළමනාකරණයක් අවශ්‍ය වන්නේය. අවස්ථානුගත කරුණු යටතේ සාධාරණ බවට විශ්වාස කරනු ලබන ඓතිහාසික අත්දැකීම් සහ වෙනත් විවිධ සාධක මත ඇස්තමේන්තු සහ ආශ්‍රිත උපකල්පන පදනම් වන අතර එම ඇස්තමේන්තු සහ ආශ්‍රිත උපකල්පන වල ප්‍රතිඵල වෙනත් මූලාශ්‍ර වලින් පහසුවෙන්ම වෙන්කොට දෘශ්‍යමාන වන්නාවූ වත්කම් සහ වගකීම් වල පවත්වාගෙන යන අගය මත තීරණ ගැනීමේ පදනම් සංයුක්ත වන්නේය. ඇස්තමේන්තු සහ නිශ්චිතව දක්වන ලද උපකල්පන අඛණ්ඩව ක්‍රියාත්මක වන පදනමක් යටතේ අධීක්ෂණය කරනු ලැබේ. ගිණුම්කරණ ඇස්තමේන්තු ප්‍රතිශෝධනයන් එම කාලසීමාව සඳහා පමණක් බලපාන්නේ නම්, ගිණුම්කරණ ඇස්තමේන්තු සඳහා වූ ප්‍රතිශෝධන එම ඇස්තමේන්තුව ප්‍රතිශෝධනය කරනු ලබන කාලසීමාව තුළදී පිළිගනු ලබන අතර එම ප්‍රතිශෝධනයන් වර්තමාන සහ අනාගත කාලසීමා සඳහා බලපාන්නේ නම්, ප්‍රතිශෝධන කාලසීමාව සහ අනාගත කාලසීමා වලදී එම ගිණුම්කරණ ඇස්තමේන්තු සඳහා වූ ප්‍රතිශෝධන පිළිගනු ලැබේ.

**1.4 ප්‍රවර්තන ව්‍යාපාරය**

මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේදී, පූර්වේක්ෂිත අනාගතයේදී ප්‍රවර්තන ව්‍යාපාරයක් ලෙස අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා අප විසින් ආයතනයේ වගකීම් පිළිබඳ තක්සේරුවක් සකස් කරන ලදී. අනාගතය පිළිබඳ පවතින සියලු තොරතුරු සැලකිල්ලට ගැනීමෙන් පසුව, ඇවර කිරීමේ හෝ ව්‍යාපාරය අවසන් කිරීමේ අවශ්‍යතාවයක් අපි නොදකිමු.

**02. සංසන්දනාත්මක තොරතුරු**

සංස්ථාව විසින් ගිණුම්කරණ ප්‍රතිපත්ති නිත්‍ය වශයෙන් අදාළ කරගෙන ඇති අතර පසුගිය වසරේ භාවිත කරන ලද ගිණුම්කරණ ප්‍රමිති සමඟ එම ගිණුම්කරණ ප්‍රතිපත්ති අනුරූප වන්නේ ය.

**03. සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති**

පහත දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති මෙම මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කරන ලද සියලු කාලසීමා සඳහා ස්ථිරව අදාළ කරගෙන ඇති අතර සංස්ථාව විසින් එම ප්‍රතිපත්ති නිරන්තරයෙන්ම අදාළ කරගෙන ඇත.

**3.1 විදේශ ව්‍යවහාර මුදල් ගණුදෙනු**

මූල්‍ය ප්‍රකාශවල ඇතුලත්කරන ලද අයිතම ශ්‍රී ලංකා රුපියල් (LKR) භාවිත කරමින් ගණනය කරන ලදී. ගණුදෙනු සිදුකරනු ලබන දිනවලදී පවතින අනුපාතික භාවිතා කරමින් විදේශ ව්‍යවහාර ගණුදෙනු, වාර්තාකර ඇති ව්‍යවහාර මුදල් බවට පරිවර්තනය කරනු ලැබේ. එවැනි ගණුදෙනු නිරාකරණය කිරීමෙන් උපචිතවන විදේශ විනිමය ලැබීම් සහ පාඩු, ආදායම් ප්‍රකාශයේදී හඳුනාගනු ලැබේ. ශේෂ පත්‍ර දිනයේ දී විදේශ ව්‍යවහාර මුදලින් විස්තර කරනු ලබන මූල්‍ය වත්කම් සහ වගකීම්, එම දිනයේ දී ක්‍රියාත්මක වන විනිමය අනුපාතිකය යටතේ ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කරනු ලැබේ. 2018 මුදල් වර්ෂයේ සිට බලපැවැත්වෙන පරිදි, LKAS 21 ප්‍රකාර, විදේශ ව්‍යවහාර මුදලින් විස්තර කරනු ලබන මූල්‍ය වත්කම් සහ වගකීම් පරිවර්තනය කිරීමෙන් ලැබෙන විදේශ විනිමය ලැබීම් සහ පාඩු, ලාභ සහ අලාභ ගිණුමෙහි හඳුනාගනු ලැබේ.

2018 වර්ෂයට පෙර ශුද්ධ විදේශ විනිමය ලැබීම්/පාඩු වෙනම විනිමය අනුපාතික සමකරණ සංචිතයක් වෙත හඳුනාගනු ලැබූ අතර එය 2018 වර්ෂයේ සිට බලාත්මක වීම අවසන් කර ඇත.

**3.2 දේපළ, පිරියත හා උපකරණ**

**අ) හඳුනාගැනීම සහ ගණනය කිරීම**

දේපළ, පිරියත හා උපකරණ සමුච්චිත ක්ෂයවීම් සහ සමුච්චිත හානි අඩුකිරීමෙන් පසුව පිරිවැය/ප්‍රත්‍යාගණනය අනුව ප්‍රකාශ කරනු ලැබේ. වත්කම් අත්කර ගැනීමට ඍජුවම හේතුවන වියදම්, පිරිවැය යන්නට ඇතුලත් වේ. තමා විසින්ම සකස් කරන ලද වත්කම් වල පිරිවැය යන්නට, අමුද්‍රව්‍ය පිරිවැය, ඍජු කම්කරු හා එම වත්කම් අපේක්ෂිත භාවිතය සඳහා කාර්ය තත්ත්වයට ගෙන ඒමට හේතුවන වෙනත් පිරිවැය, එම අයිතමයන් කොටස් ගැලවීමේ හා ඉවත්කිරීමේ සහ එම අයිතම පිහිටි පරිශ්‍රය යථා තත්ත්වයට පත්කිරීමේ පිරිවැය ඇතුලත්වේ. යම් දේපළ, පිරියත සහ උපකරණ අයිතමයන් විවිධ ප්‍රයෝජනවත් ජීව කාලයන් සහිත ප්‍රධාන උපාංගයන්ගෙන් සමන්විත වන අවස්ථාවකදී ඒවා වෙනමම දේපළ, පිරියත හා උපකරණ අයිතමයන් ලෙස සලකනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ අයිතමයන් බැහැර කිරීමෙන් ලැබෙන ලාභ හෝ පාඩු නිර්ණය කරනු ලබන්නේ දේපළ, පිරියත හා උපකරණ වල ධාරණ වටිනාකම සමඟ ඒවා බැහැර කිරීමෙන් ලැබෙන මුදල සංසන්දනය කිරීමෙන් වන අතර ආදායම් ප්‍රකාශයේ ‘වෙනත් මෙහෙයුම් ආදායම්’ තුළ පවතින ශුද්ධ ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

**ආ) ක්ෂය වීම**

සින්නක්කර ඉඩම් හැර අනෙකුත් සියලු දේපළ, පිරියත හා උපකරණවල ඇස්තමේන්තුගත ඵලදායී ජීවකාලය තුළ ඒවායේ අවශේෂ වටිනාකමට පිරිවැය හෝ ප්‍රත්‍යාගණන ප්‍රමාණයන් වෙන් කිරීම සඳහා ඍජු රේඛීය ක්‍රමය භාවිතා කරමින් ක්ෂයවීම් සඳහා ප්‍රතිපාදන ගණනය කරනු ලබයි.

භාවිතා කරන ලද ප්‍රධාන වාර්ෂික අනුපාතික පහත දැක්වේ.

| | |
|---|---|
| 1. ගොඩනැගිලි | 5% |
| 2. කාර්යාල උපකරණ | 25% |
| 3. මෝටර් වාහන | 20% |
| 4. මෘදුකාංග | 25% |
| 5. ගෘහ භාණ්ඩ හා උපකරණ | 10% |

එම වත්කම්වල කාල්පනික ඓතිහාසික පිරිවැය ක්ෂයවීම් ගාස්තුව සම්බන්ධයෙන් වූ ප්‍රත්‍යාගණන වත්කම් මත වූ වාර්ෂික ක්ෂයවීම් ගාස්තුවේ අතිරික්තයට සමාන වූ මුදලක් ප්‍රත්‍යාගණනයේ අතිරික්තයෙන් සමුච්චිත ලාභය සඳහා වාර්ෂිකව පවරනු ලැබේ. වත්කම් වල ධාරණ වටිනාකම එහි ඇස්තමේන්තුගත අයකර ගත හැකි මුදලට වඩා වැඩි වේ නම්, එම වත්කම්වල ධාරණ වටිනාකම එහි අයකර ගත හැකි මුදල දක්වා වහාම අඩුකරනු ලැබේ.

**ඇ) බැහැර කිරීම**

බැහැර කිරීම් වලින් ලබන මුදල එහි ධාරණ වටිනාකම සමඟ සංසන්දනය කිරීම මඟින් බැහැර කිරීම් මතවූ ලැබීම් සහ පාඩු තීරණය කරනු ලබන අතර ආදායම් ප්‍රකාශයේ මෙහෙයුම් ලාභ හෝ පාඩු තීරණය කිරීමේදී එම ලැබීම් සහ පාඩු පිළිගනු ලැබේ. ප්‍රත්‍යාගණන වත්කම් විකුණනු ලබන අවස්ථාවකදී, ප්‍රත්‍යාගණන සංචිතයේ ඇතුළත් කරන මුදල රඳවාගත් ඉපැයුම් වෙත පවරනු ලැබේ.

**ඇ) දුබල කිරීම**

දේපළ, පිරියත හෝ උපකරණ වල ධාරණ වටිනාකම, වාර්ෂිකව හෝ ඒවායේ ධාරණ වටිනාකම නැවත අයකර ගත නොහැකි ලෙස දක්වනු ලබන අවස්ථා වලදී හෝ වෙනස් වූ සිදුවීම් වලදී හෝ දුබල කිරීම් සඳහා පරීක්ෂා කරනු ලැබේ. එවැනි දර්ශකයක් පවතීනම් සහ ධාරණ වටිනාකම, ඇස්තමේන්තුගත අයකර ගත හැකි මුදල ඉක්මවා යන විට ආපසු අයකරගත හැකි ප්‍රමාණයට එම වත්කම් වල අගය අඩුකරනු ලැබේ. එම වත්කම සඳහා පූර්ව ප්‍රත්‍යාගණන අතිරික්තයක් ඉතිරිව තිබේ නම් මිස, දුබල කිරීමේ හානි ආදායම් ප්‍රකාශයේ හඳුනාගනු ලැබිය හැකිවේ.

**ඉ) දේපළ, පිරියත හා උපකරණ විකිණීමෙන් ලැබෙන ලාභ/පාඩු**

දේපළ, පිරියත හා උපකරණ ඉවත්කිරීම හෝ බැහැර කිරීම මතවූ ලැබීම් හෝ පාඩු, විකිණීම් සිදුවන කාලයේදී පිළිගනු ලබන අතර වෙනත් ආදායමක් වශයෙන් වර්ගීකරණය කරනු ලබයි.

**3.4 ප්‍රාග්ධන කාර්යය ප්‍රගතිය**

ශේෂ පත්‍ර දිනයේදී සම්පූර්ණ කර නොමැති වර්ෂය තුළදී දරන ලද ප්‍රාග්ධන වියදම්, අත්තිකාරම් ගෙවීම් වශයෙන් පෙන්වා ඇති අතර වර්ෂය තුළදී සම්පූර්ණ කර ඇති සහ භාවිතයට යොදවා ඇති ප්‍රාග්ධන වත්කම්, දේපළ, පිරියත හා උපකරණ වලට මාරු කර ඇත.

**3.5 අස්පෘශ්‍ය වත්කම්**

සංස්ථාව විසින් අත්පත් කර ගනු ලැබූ ප්‍රමාණවත් ඵලදායී ජීවකාලයකින් යුත් අස්පෘශ්‍ය වත්කම් වල පිරිවැය, සමුච්චිත ක්‍රමක්ෂය සහ සමුච්චිත දුබල කිරීමේ හානි අඩුකිරීමෙන් ගණනය කරනු ලැබේ. පරිගණක මෘදුකාංග වැඩසටහන් නඩත්තු කිරීම හා සම්බන්ධිත පිරිවැය දරන ලද වියදමක් වශයෙන් පිළිගනු ලැබේ.

සංස්ථාව විසින් ක්‍රියාත්මක කරනු ලබන සහ පාලනය කරනු ලබන හඳුනාගත හැකි සහ අද්විතීය මෘදුකාංග නිෂ්පාදන සැලසුම් කිරීමට සහ පරීක්ෂා කිරීමට සෘජුවම අදාළවන සංවර්ධන පිරිවැය අස්පෘශ්‍ය වත්කම් වශයෙන් පිළිගනු ලබයි.

**අ) පිළිගැනීමේ පදනම**

වත්කම් වලට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ අස්තිත්වය සඳහා ගලා යන්නේ නම් සහ පිරිවැය විශ්වසනීය ලෙස ගණනය කල හැකි නම් සහ සමුච්චිත ක්‍රමක්ෂය හා සමුච්චිත හානි අඩුකිරීමෙන් අස්පෘශ්‍ය වත්කමක් හඳුනාගනු ලැබේ.

**ආ) පශ්චාත් වියදම්**

පශ්චාත් වියදම් ප්‍රාග්ධනීකරණය කරනු ලබන්නේ එය අදාළවන නිශ්චිත වත්කම්වල අනාගත ආර්ථික ප්‍රතිලාභ වැඩිවන අවස්ථාවලදී පමණි. අභ්‍යන්තරව උත්පාදනය වූ කීර්ති නාමය සහ සන්නම මතවූ වියදම් ඇතුළු වෙනත් සියලු වියදම්, දරන ලද වියදම් වශයෙන් ආදායම් ප්‍රකාශයේ පිළිගනු ලැබේ.

**ඇ) ඉවත් කිරීම හා බැහැර කිරීම**

යම් වත්කමක් බැහැර කිරීමේදී හෝ එම වත්කම් භාවිතයෙන් සහ පශ්චාත් බැහැර කිරීම් වලින් කිසිදු අනාගත ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂා නොකරන අවස්ථාවකදී එය අස්පෘශ්‍ය වත්කමක් ලෙස පිළිගනු ලැබේ.

**ඈ) ක්‍රමක්ෂය**

අස්පෘශ්‍ය වත්කම් භාවිතය සඳහා පවතින දින සිට, එම වත්කම් වල ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයු කාලය තුලදී සෘජු රේඛීය පදනමක් මත ආදායම් ප්‍රකාශනයේ ක්‍රමක්ෂය පිළිගනු ලැබේ.

**ඉ) දුබල කිරීම**

දුබල වීම පිළිබඳ සලකුණු පවතීද යන්න තීරණය කිරීම සඳහා සංස්ථාවේ වත්කම්වල ධාරණ වටිනාකම් සෑම ශේෂ පත්‍ර දිනයකදීම සමාලෝචනය කරනු ලැබේ. එවැනි හැඟවීමක් පවතී නම්, වත්කමේ ආපසු අයකරගත හැකි මුදල ඇස්තමේන්තු කරනු ලැබේ. වත්කමක ධාරණ වටිනාකම හෝ එහි මුදල් උත්පාදන ඒකකය එහි ආපසු අයකරගත හැකි වටිනාකම ඉක්මවා යයි නම්, දුබල වීමේ පාඩුව පිළිගනු ලැබේ. දුබල වීමේ හානිය ආදායම් ප්‍රකාශය තුළ පිළිගනු ලැබේ.

## 3.6 ආයෝජන දේපළ

දීර්ඝකාලීන ඉපැයීම් සඳහා හෝ ප්‍රාග්ධන වටිනාකම වැඩිකිරීම සඳහා ඇති දේපළ, ආයෝජන දේපළ වශයෙන් වර්ගීකරණය කරනු ලැබේ. මූලික හඳුනාගැනීමෙන් පසු, ආයෝජන දේපළ යම් පිරිවැයක් යටතේ පවත්වාගෙන යනු ලබයි.

## 3.7 කෙටිකාලීන ආයෝජන

**අ) දේශීය ව්‍යවහාර මුදලින් පවතින කෙටි කාලීන ආයෝජන**

සංස්ථාව විසින් රජයේ භාණ්ඩාගාර බිල්පත්වල සහ වෙනත් ස්ථාවර ආදායම් ආයෝජනවල කෙටි කාලීන අතිරික්ත අරමුදල් පිහිටුවා ඇති අතර ශේෂ පත්‍ර දිනයේදී පවතින විනිමය අනුපාතිකය යටතේ තක්සේරු කරන ලද විදේශ ව්‍යවහාර මුදලින් පවත්වාගෙන යන ස්ථාවර තැන්පතු සඳහා හැර පිරිවැය යටතේ එම මුදල් ගිණුම්කරණය කර ඇත. මෙම ආයෝජන මත උපචිතවන පොළිය ආදායම් ප්‍රකාශයේ පිළිගෙන ඇත.

**ආ) විදේශ ව්‍යවහාර මුදලින් පවතින කෙටි කාලීන ආයෝජන**

විදේශ ව්‍යවහාර මුදලින් අනාගත හිමිකම් වගකීම් සපුරාලීම සඳහා අවශ්‍යවන අරමුදල් වෙන්කර ඇති අතර පොළිය උපචිතවන විදේශ ව්‍යවහාර ගිණුමේ තැන්පත් කර ඇත. උපචිත වූ පොළිය, ගනුදෙනුව සිදුවූ දිනයේදී පැවති අනුපාතිකය යටතේ පරිවර්තනය කර ආදායම් ප්‍රකාශයේ පිළිගෙන ඇත. මූල්‍ය ප්‍රකාශයේ

පිළිගෙන ඇති ආයෝජනවල වටිනාකම ශේෂ පත්‍ර දිනයේදී පවතින අනුපාතිකය යටතේ පරිවර්තනය කරනු ලැබේ.

### 3.7.1 මූල්‍ය ආයෝජන: කල් පිරීම

භාණ්ඩාගාර බිල්පත්, භාණ්ඩාගාර බැඳුම්කර, ස්ථාවර තැන්පතු සහ ණයකර වල සිදුකරන ලද සියලුම කෙටි කාලීන සහ දිගු කාලීන ආයෝජන කල් පිරෙන අතර ලැබුණු පොළිය සහිතව පිරිවැය වල ප්‍රකාශකර ඇත.

### 3.7.2 මූල්‍ය සාධන පත්‍ර වලින් ඇතිවන අවදානම

භාණ්ඩාගාර බිල්පත්, භාණ්ඩාගාර බැඳුම්කර, රාජ්‍ය බැංකු ස්ථාවර තැන්පතු හා ණයකර මත සිදු කරන ලද ආයෝජනයන්ගෙන් කෙටි කාලීන සහ දිගු කාලීන ආයෝජනයන් සමන්විත වේ. ණයකර සඳහා පොළී අනුපාතික අවදානම, ප්‍රතිආයෝජන අවදානම, පැහැර හැරීමේ අවදානම සහ ඇවර කිරීමේ අවදානම පවතී. ස්ථාවර තැන්පතු කල් පිරීම දක්වාම පවත්වාගෙන යනු ලබන බැවින්, දේශීය ව්‍යවහාර මුදල් ස්ථාවර තැන්පතු සඳහා පවතින වෙනත් අවදානම් වලට අමතරව, ව්‍යවහාර මුදල් උච්චාවචනය වීම් අවදානම සඳහා විවෘතව පවතින විදේශීය ව්‍යවහාර මුදලින් පවතින ස්ථාවර තැන්පතු සඳහා හැර, එමඟින් පැහැර හැරීම් සහ ඇවර කිරීම් අවදානම පමණක් දරනු ලබයි. රාජ්‍ය බැංකුවල මෙම ආයෝජන පවත්වා ගැනීමේ සන්දර්භය තුළ, විදේශීය ව්‍යවහාර මුදල් වටිනාකම උච්චාවචනය වීමේ අවදානම හැර සියලුම ප්‍රකාශිත අවදානම් අවම මට්ටමක පවතී.

### 3.8 වෙළඳ සහ වෙනත් ලැබීම්

වෙළඳ සහ වෙනත් ලැබීම්, උපලබ්ධ වීමට නියමිත ඇස්තමේන්තුගත මුදල සඳහා ප්‍රකාශකර ඇත. වසර තුනකට අධික කාලයක් සඳහා හිඟව පවතින බොල් ණය සහ අඩමාන ණය සඳහා මූල්‍ය ප්‍රකාශ වල වෙන් කිරීම් සිදුකර ඇත.

### 3.9 භාණ්ඩ ලේඛන

ලිපිද්‍රව්‍ය තොග සහ පාරිභෝගික අයිතම භාණ්ඩ ලේඛන වල අඩංගු වේ. අභාවිත සහ අලුත්වැඩියා කරනු ලැබිය හැකි අයිතම සඳහා වෙන්කිරීම් සිදුකිරීමෙන් පසුව, පිරිවැයෙන් අඩු අගයක් සඳහා හෝ ශුද්ධ උපලබ්ධ අගය සඳහා භාණ්ඩ ලේඛන තක්සේරු කරනු ලැබේ. ශුද්ධ උපලබ්ධ අගය යනු සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු වලදී භාණ්ඩ ලේඛන විකුණනු ලැබිය හැකි මිල ගණන් වේ.

### 3.10 මුදල් සහ මුදල් සමාන දෑ

අතැති මුදල් සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අරමුණු සඳහා දන්නා මුදල් ප්‍රමාණයකට පහසුවෙන් පරිවර්තනය කල හැකි කෙටි කාලීන ඉහළ ද්‍රවශීල ආයෝජන, මුදල් සහ මුදල් සමාන දෑ යනුවෙන් අර්ථනිරූපණය කල හැකි අතර මුදල් සහ මුදල් සමාන දෑ තුළ අතැති මුදල් සහ බැංකු අයිරාවල නොගෙවූ ශුද්ධ අගය, කෙටි කාලීන ණය සහ කෙටි කාලීන ආයෝජන අන්තර්ගත වේ.

### 3.11 මුදල් ප්‍රවාහ ප්‍රකාශ

ලංකා ගිණුම්කරණ ප්‍රමිති (LAKAS) අංක 09 - මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශ අනුව වක්‍ර ක්‍රමය භාවිතා කරමින් මුදල් ප්‍රවාහ ප්‍රකාශ සකස් කර ඇත.

## 04. සේවා නියුක්ති ප්‍රතිලාභ

### අ) නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම – විශ්‍රාම පාරිතෝෂිකය

නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම යනු නිශ්චිත දායක සැලැස්මක් හැර පශ්චාද් රැකියා ප්‍රතිලාභ සැලැස්මකි. අවශ්‍ය ප්‍රතිපාදන තීරණය කිරීම සඳහා ප්‍රක්ෂේපිත ඒකක බැර ක්‍රමය භාවිතා කරමින්, ශුද්ධ ප්‍රතිලාභ සැලැස්ම සම්බන්ධයෙන් සංස්ථාවේ ශුද්ධ බැඳීම ගණනය කරනු ලැබේ. සුදුසුකම් ලත් ස්වාධීන ආයුගණකවරයෙකු මගින් වසර තුනකට වරක් ගණනය කිරීම සිදු කෙරේ. ආයු ගණක ලාභ සහ පාඩු වලින් සමන්විත ශුද්ධ

නිශ්චිත ප්‍රතිලාභ බැඳීම් ඇගයීම ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ වහාම හඳුනා ගනු ලැබේ.

1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීමේ පනත යටතේ සේවකයෙකු සඳහා බැඳීම පැන නගින්නේ වසරක අඛණ්ඩ සේවය සම්පූර්ණ කිරීමෙන් පසුව පමණි. බැඳීම බාහිරව අරමුදල් සැපයීමක් සිදු නොකෙරේ.

**ආ) නිශ්චිත දායක සැලැස්ම**

සේවා නියුක්තිකයන්ගේ අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල මින් අදහස් වේ. අදාළ ප්‍රඥප්ති සහ නියෝග වලට අනුව සේවා නියුක්තිකයන්ගේ අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල ලබා ගැනීම සඳහා සේවා නියුක්තිකයන් සුදුසුකම් ලබයි.

## 05. වගකීම් සහ මුදල් වෙන්කිරීම්

ආර්ථික ප්‍රතිලාභ මූර්තිමත් කරනු ලබන සම්පත් පිටතට ගලා යාමක් අපේක්ෂා කරනු ලබන නිරාකරණය කිරීමක් වන්නාවූ අතීත සිදුවීම් වල ප්‍රතිඵලයක් වශයෙන් වූ වර්තමාන නෛතික/අනුමිත වගකීමක් සහිත අවස්ථාවකදී, ශේෂ පත්‍රයේ වගකීම් සහ වෙන්කිරීම් හඳුනාගනු ලැබිය හැකිවේ. ණය හිමියාගේ ඉල්ලීම අනුව ගෙවිය යුතු වගකීම් හෝ ශේෂ පත්‍ර දිනයේ සිට එක් අවුරුද්දක් ඇතුළත ගෙවිය යුතු වගකීම්, ශේෂ පත්‍රයේ සඳහන් වර්තමාන වගකීම් වශයෙන් සලකනු ලැබේ. ශේෂ පත්‍ර දිනයේ සිට එක් අවුරුද්දකින් පසුව ගෙවිය යුතු වගකීම්, ශේෂ පත්‍රයේ සඳහන් ජංගම නොවන වගකීම් වශයෙන් සලකනු ලැබේ.

**අ) වෙළඳ සහ වෙනත් ගෙවීම්**

වෙළඳ සහ වෙනත් වගකීම් ස්වකීය පිරිවැය යටතේ ප්‍රකාශ කරනු ලැබේ.

**ආ) හිමිකම් සඳහා අවිනිශ්චිත ප්‍රතිපාදන**

ගමන් ගාස්තු ආවරණය වන පරිදි ලබා දෙන ඇපකරය සඳහා වූ හිමිකම් ගෙවීම් අනුපාතය පිළිබඳ අපගේ පසුගිය අත්දැකීම් අනුව, එය ලැබී ඇති රක්ෂණ වාරික වලින් 30%ක පරාසයක් තුළ පවතී. රක්ෂණ වාරික ලැබීමේ දින සිට වසර 03ක කාලසීමාවක් සඳහා පැතිරී පවතින පරිදි ලැබෙන රක්ෂණ වාරික සඳහා හිමිකම් වගකීමක් පවතියි. පසුගිය අත්දැකීම් සමඟ සලකා බැලීමේදී, ගමන් ගාස්තු ආවරණය වන පරිදි ලබා දෙන ඇපකර පිරිවැය සඳහා පිළිවෙලින් 15%, 10% සහ 5% අනුපාතික යටතේ පසුගිය වසර තුනක කාලය සඳහා ලැබී ඇති රක්ෂණ වාරික වලින් 30% දක්වා වෙන්කිරීමක් අවිනිශ්චිත හිමිකම් සඳහා වූ වෙන්කිරීමක් වශයෙන් සපයා ඇත.

වසර අවසානයේදී පෙන්නුම් කරනු ලබන ශේෂ සමඟ ගැළපීම සඳහා ප්‍රතිපාදන සෑම වසරකම ගළපනු ලැබිය හැකි වේ.

පහත දැක්වෙන පදනම අනුව වෙනත් නිෂ්පාදන සඳහා ප්‍රතිපාදන සකස් කර ඇත.

| | |
|---|---|
| විකුණුම්කරුගේ අවදානම් රක්ෂණ ඔප්පුව | 15% |
| ATA කාර්නෙට් පද්ධතිය මත සෘජු ඇපකරය | 2% |
| පූර්ව නැව්ගත කිරීම් ණය ඇපකරය | 12% |
| පශ්චාත් නැව්ගත කිරීම් ණය ඇපකරය | 5% |

**ඇ) වාර්තා කරන ලද හිමිකම් සඳහා ප්‍රතිපාදන**

මෙම ප්‍රතිපාදන සකස් කිරීමේදී වාර්තා කරන ලද හිමිකම් හඳුනාගෙන ඒවා සැලකිල්ලට ගෙන තිබේ. සාධාරණ අවස්ථාවලදී, ශේෂ පත්‍ර දිනයේ පවත්නා තත්ත්වයන් මත හිමිකම් සඳහා විශේෂ ප්‍රතිපාදන සලසා ඇත. හිමිකම් පෑමක් සිදු කළ යුතු බවට සම්භාවිතාවක් පැවතීම පිළිබඳ සාක්ෂි සහ සහතික කිරීම් පවතී. හිමිකම් ගෙවීම් වෙන් කරන ලද ප්‍රතිපාදන වලට එරෙහිව පසුව හිලව් කරනු ඇත. හිමිකම් සඳහා වන වගකීම්වල සසම්භාවී සිදුවීම් පැවතීම මත පදනම්ව ප්‍රතිපාදන අඛණ්ඩව වෙන් කිරීම සිදු කරනු ලබයි.

**ඈ) අවසන් නොවූ අවදානම් මත උපයා නොගත් වාරික සඳහා සංචිතය**

සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළදී ලිඛිතව ප්‍රකාශ කරන ලද හා ලැබී ඇති වාරික සහ එසේ එකතු කරන ලද වාරික මත අවසන් නොවූ අවදානම, වාරික අදාළ වන්නාවූ ඉදිරි මුදල් වර්ෂයේ යම් ආවරණ කාලසීමා කොටසක් සඳහා පැතිර පවතින්නේ ය. වර්තමාන මුදල් වර්ෂය අවසාන වීමෙන් පසු, කර්මාන්ත සම්මති ප්‍රකාරව ආවරණ කාලය සඳහා සමානුපාතික රක්ෂණ වාරික වෙන් කිරීම මගින් සංචිතයක් නිර්මාණය කර ඇත. සංචිතය නිර්ණය කිරීමේදී 1/365 ක්‍රමවේදය භාවිතා කර ඇත.

සංචිතය හඳුනාගැනීම සඳහා, අපනයන ගෙවීම් රක්ෂණ ඔප්පු මත එකතු කළ වාරික මත අවසන් නොවූ අවදානම සඳහා සැබෑ ආවරණ කාලය සැලකිල්ලට ගෙන තිබේ. ආවරණ කාලසීමාව තුළ අදාළ වන අවදානම් වල සංකීර්ණභාවය, ස්වභාවය සහ ප්‍රමාණය පිළිබඳ සලකා බලමින් සමාලෝචනයට භාජනය වූ වසර තුළදී ඇපකර මත එකතු කරන ලද රක්ෂණ වාරික වලින් 15%ක අවසන් නොවූ අවදානම් සඳහා සංචිතයක් වශයෙන් වෙන් කර ඇත.

## 06. ආදායම

### 6.1 වාරික ආදායම

වසර අවසානය දක්වා භාරදී ඇති සියලුම ප්‍රකාශ සැලකිල්ලට ගනිමින් 'උපාර්ජන පදනම' මත වාරික ආදායමෙන් ලැබෙන ආදායම හඳුනාගෙන ඇත. ගිවිසුමේ තනි පුද්ගල කොන්දේසි මත පදනම්ව අවදානම් සහ ප්‍රතිලාභ පැවරීම වෙනස් වේ. සියළුම වියදම් අයිතම 'උපාර්ජන පදනම' මත ගිණුම්ගත කරනු ලබයි. අදාළ කරගනු ලැබූ ගිණුම්කරණ ප්‍රතිපත්ති පෙර වර්ෂයන් වලදී අදාළ කරගනු ලැබූ ප්‍රතිපත්ති සමඟ අනුකූල වේ.

### 6.2 වෙනත් මෙහෙයුම් ආදායම

**අ) දේපළ, පිරියත හා උපකරණ විකිණීමෙන් ලැබෙන ලාභ සහ පාඩු**

දේපළ, පිරියත හා උපකරණ අවසන්වීමෙන් හෝ බැහැර කිරීමෙන් ලැබෙන ඉපැයීම් හෝ පාඩු, විකිණීම සිදුවන කාලසීමාව තුළදී හඳුනාගනු ලබන අතර වෙනත් මෙහෙයුම් ආදායම් වශයෙන් වර්ගීකරණය කරනු ලබයි.

### 6.3 වියදම් හඳුනාගැනීම

**අ) ආදායම් වියදම්**

හඳුනාගත් සියලු වගකීම් සහ දේපළ පිරියත හා උපකරණ ක්ෂයවීම් සඳහා මුදල් වෙන්කිරීමෙන් පසුව ආදායම් ප්‍රකාශයේ පෙන්නුම් කරනු ලබනුයේ සංස්ථාව විසින් උපයාගනු ලැබූ ලාභය වේ.
ආදායම් ප්‍රකාශ ඉදිරිපත් කිරීමේ කාර්යය සඳහා වියදම් ක්‍රමය ක්‍රියාත්මක කිරීම මගින් ව්‍යාවසායේ කාර්යසාධනයේ මූලිකාංග සාධාරණ ලෙස ඉදිරිපත් කරනු ලබන බව අධ්‍යක්ෂවරුන්ගේ අදහස වේ. ඒ අනුව මෙම ඉදිරිපත්කිරීමේ ක්‍රමය අනුගමනය කරනු ලබයි.

**ආ) ප්‍රාග්ධන වියදම**

ව්‍යාපාරයක් පවත්වාගෙන යෑම මගින් හෝ ව්‍යාපාරයේ ඉපැයීම් ධාරිතාවය වැඩිකිරීමේ කාර්ය සඳහා, ස්ථිර ස්වභාවයේ වත්කම් දීර්ඝ කිරීමේ හෝ ප්‍රවර්ධනය කිරීමේ කාර්ය සඳහා දරනු ලබන වියදම් ප්‍රාග්ධන වියදම් වශයෙන් සලකනු ලැබේ.
දේපළ, පිරියත හා උපකරණ බැහැර කිරීම මත ආදායම් ස්වභාවයේ ලාභ හෝ පාඩු, ආදායම් ප්‍රකාශනයේ ගිණුම්ගත කර ඇත.

### 6.4 බදු අයකිරීම

**ආදායම් බදු වියදම්**

වසර සඳහා වන ආදායම් බදු වියදම්, සංස්ථාවේ සමස්ත මෙහෙයුම් මත වූ බදු වලින් සමන්විත වේ. වාර්තාකිරීමේ දිනය මත පනවනු ලබන හෝ පසුව පනවනු ලබන බදු අනුපාතික භාවිතා කරමින් හෝ

පසුගිය වර්ෂය සම්බන්ධයෙන් ගෙවිය යුතු බදු ගැලපීමෙන්, වර්ෂය සඳහා වූ බදු අයකළ හැකි ආදායම මත ගෙවිය යුතු අපේක්ෂිත බදු, ආදායම් ප්‍රකාශයේ හඳුනාගනු ලැබේ. 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ සහ එහි යම් සංශෝධනවල සඳහන් විධිවිධාන ප්‍රකාරව, බදු සඳහා වූ වෙන්කිරීම්, බදු කාර්යය සඳහා ගලපන ලද වර්ෂය සඳහා වූ ශුද්ධ ලාභය මත පදනම් වේ.

## 6.5 ණයට ගැනීම් පිරිවැය

යම් වර්ෂයක් තුළ දී දරන ලද වියදමක් ණයට ගැනීම් පිරිවැය ලෙස පිළිගනු ලැබේ.

## 6.6 සංසන්දනාත්මක තොරතුරු

වර්තමාන වර්ෂයේ ඉදිරිපත් කිරීම් තහවුරු කිරීම සඳහා අවශ්‍යවන අවස්ථාවලදී සංසන්දනාත්මක තොරතුරු ප්‍රතිවර්ගීකරණය කර ඇත.

## 6.7 බැඳීම් සහ අහඹු සිදුවීම්

අහඹු සිදුවීම් යනු අතීත සිදුවීම්වලින් පැන නගින භව්‍ය වත්කම් හෝ වගකීම් වන අතර, සංස්ථාවේ පාලනයෙන් පරිබාහිරව පවතින අවිනිශ්චිත අනාගත සිද්ධි සිදුවීම හෝ සිදුනොවීම මත පමණක් එම සිදුවීම් තහවුරු කරනු ලැබේ.

## 6.8 ශේෂ පත්‍ර දිනයට පසුව සිදුවන සිදුවීම්

සියලු වැදගත් පශ්චාත් ශේෂ පත්‍ර සිදුවීම් අදාළ අවස්ථාවල දී හෙළිදරව් කරන ලද හා ගලපන ලද සිදුවීම් ලෙස සලකා ඇත.

2021 අගෝස්තු මස 04 වන දින.

ටීසීඑම්/ඒඑෆ්/එස්එල්ඊසීඅයිසී/20/14

සභාපති,
ශ්‍රී ලංකා අපනයන ණය රක්‍ෂණ සංස්ථාව.

## ශ්‍රී ලංකා අපනයන ණය රක්‍ෂණ සංස්ථාවේ 2020 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ සහ අනෙකුත් නීතිමය සහ රෙගුලාසි ප්‍රකාර අවශ්‍යතාවයන් පිළිබඳව 2018 අංකඃ 19 දරන ජාතික විගණන පනතේ 12 වගන්තිය ප්‍රකාර විගණනකාධිපති වාර්තාව

1. **මූල්‍ය ප්‍රකාශ**

1.1. **මතය**

ශ්‍රී ලංකා අපනයන රක්‍ෂණ සංස්ථාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වු ලාභ හෝ අලාභ සහ අනෙකුත් විස්තීර්ණ අදායම් ප්‍රකාශය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ සාරාංශ ගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති ඇතුලත් වූ මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංකඃ 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු මාගේ වාර්තාව යථාකාලයේදී සභාගත කරනු ඇත.

සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශ තුලින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ එහි මූල්‍ය කාර්ය සාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

1.2 **මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට (ශ්‍රී.ල.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශ විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3. සංස්ථාවේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

2020 සංස්ථාවේ වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති, නමුත් මූල්‍ය ප්‍රකාශයන් හි ඒ පිළිබඳව මාගේ විගණනකගේ වාර්තාවේ සඳහන් නොවන; එහෙත් මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා විසින් ලබාගත් තොරතුරු "වෙනත් තොරතුරු" තුලට ඇතුළත් වේ. අනෙකුත් තොරතුරු සඳහා කළමණාකරණය වගකීමට බැඳී සිටී.

මෙම "වෙනත් තොරතුරු" මූල්‍ය ප්‍රකාශයන් පිළිබඳ මාගේ මතයෙන් ආවරණය නොවන අතර, ඒ පිළිබඳ තහවුරුවක් හෝ නිගමනයක්ද නොකෙරේ.

මූල්‍ය ප්‍රකාශ පිළිබඳ මාගේ විගණනය සම්බන්ධයෙන් මාගේ වගකීම වනුයේ හඳුනාගත් "වෙනත් තොරතුරු" පිළිබඳව යම් අදහසක් ඇති කර ගැනීම සහ එසේ කිරිමේදී මෙම "වෙනත් තොරතුරු" මූල්‍ය ප්‍රකාශ සමඟ ප්‍රමාණාත්මකව නොගැලපෙන්නේද යන්න හෝ විගණනයේදී මා ලබාගත් දැනුම හෝ වෙනත් අයුරකින් ප්‍රමාණාත්මකව සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් යුතුද යන්න විමසීමයි.

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා විසින් ලබාගත් "වෙනත් තොරතුරු" පිළිබඳව මා විසින් සිදුකරන ලද කාර්යයන් මත පදනම්ව මෙම "වෙනත් තොරතුරු" පිළිබඳ සාවද්‍ය ප්‍රකාශයක් සිදුවී ඇතැයි මා නිගමනය කරන්නේ නම් ඒ බව මා විසින් වාර්තා කළ යුතුව ඇත. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නොමැත.

## 1.4. මූල්‍ය ප්‍රකාශ සම්බන්ධයෙන් කළමනාකරනයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම.

මෙම මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ ලෙස පිළියෙල කිරිම, වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකශ පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරිමේදී, සංස්ථාවේ අඛන්ඩව පවත්වාගෙන යමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සංස්ථාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛන්ඩව පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංස්ථාවේ අඛන්ඩව පැවැත්මට අදාල කරුණු අනාවරණය කිරිමද කළමනාකරණයේ වගකීමකි.

සංස්ථාවේ මූල්‍ය වාර්තාකරන ක්‍රියාවලිය සම්බන්ධව පාලනය කිරීමේ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංකඃ 19 දරණ ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව සංස්ථාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමට හැකි වන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා වගකීම් පිළිබඳ නිසි පරිදි පොත් පත් හා වාර්තා පවත්වාගෙන යාම සංස්ථාව විසින් සිදුකළ යුතුය.

## 1.5. මූල්‍ය ප්‍රකාශ විගණනය සඳහා විගණකගේ වගකීම්

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශ වංචා සහ වැරදි නිසා ඇති වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරිම මාගේ අරමුණද වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමත් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී, එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමුහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශ පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රදා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්;

- ★ ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශ වල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. යම් වරදක් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන බලපෑම ප්‍රබල වන්නේ ඒවා වංචාවක් සඳහා සන්ධානගතවීම, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාත්මකව මග හැරීම, සාවද්‍ය නියෝජනයන් හෝ අභ්‍යන්තර පාලනය නොසලකා හැරීම, වැනි හේතු නිසාවෙනි.

- ★ අවස්ථාවෝචිත ලෙස විගණන පටිපාටි සකස් කරනු හැකිවන පිණිස විගණනයට අවශ්‍යවන්නා වු අභ්‍යන්තර පාලනය පිළිබඳ යම් අවබෝධයක් ලබාගනු පිණිස මිස සංස්ථාවේ අභ්‍යන්තර පාලනයේ ඵලදායිතාවය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම අරමුණු නොකරන ලදී.

- ★ ගිණුම්කරණ ප්‍රතිපත්ති වල උචිත භාවය, ගිණුම්කරණය සඳහා යොදාගත් ඇස්තමේන්තු වල සාධාරණ භාවය සහ කළමණාකරණය විසින් කරන ලද අදාල හෙළිදරව් කිරීම්වල සාධාරණ භාවය ඇගයීමට භාජනය කරන ලදී.

- ★ අඛන්ඩව පැවැත්ම පදනම්ව ගිණුම්කරණය යොදා ගැනීමේ කළමනාකාරිත්ව භාවිතයේ උචිත භාවය සහ අඛන්ඩ පැවැත්ම සම්බන්ධයෙන් සංස්ථාවේ හැකියාව පිළිබඳව සැලකිය යුතු සැකයක් ඇතිවීමට අදාල වන සිදුවීම් හෝ තත්ත්වයට තුඩුදෙන ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයන් පවතීද යන්න නිශ්චය කිරීම සඳහ මා ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව මාගේ නිගමනය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයන් පවතින්නේ යැයි මා නිගමනය කරන්නේ නම්, ඒ සඳහා අදාළව මූල්‍ය ප්‍රකාශයන්හි ඇති හෙළිදරව් කිරීම් පිළිබඳව මාගේ විගණන වාර්තාවේ අවධානය යොමුකරනු ලැබේ. එවැනි හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවෙන්නේ නම් මාගේ මතය වෙනස් කිරීම් වලට භාජනය කරනු ලැබේ. මාගේ විගණන වාර්තාවේ දින දක්වා ලබාගත් විගණන සාක්ෂි පදනම්ව මාගේ නිගමනයන් රදා පවතී. කෙසේ වුවද, අනාගතයේ මුහුණ පෑමට සිදුවන සිද්ධීන් හා තත්ත්වයන් සංස්ථාවේ අඛන්ඩ පැවැත්ම වලක්වාලීමට හේතු විය හැකිය.

- ★ මූල්‍ය ප්‍රකාශ වල හෙළිදරව් කිරීම් ද ඇතුළුව, සමස්ථ ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගත කිරීම් සහ ඒ සඳහා පාදක වූ මූලික ගනුදෙනු සහ සිද්ධීන් සාධාරණ ලෙස මූල්‍ය ප්‍රකාශයන්හි නියෝජනය වී ඇතිද යන්න ඇගයීමට භාජනය කරන ලදී.

  අභ්‍යන්තර පාලනයේ යම් සැලකිය යුතු අඩුපාඩු පවතී නම් එම කරුණුද ඇතුළු වැදගත් විගණන නිරීක්ෂන සහ අනෙකුත් අදාල කරුණු පිළිබඳව මා විසින් පාලක පාර්ශවය සමඟ අදහස් හුවමාරු කරගන්නා ලදී.

2. **<u>වෙනත් නීතිමය සහ රෙගුලාසීමය අවශ්‍යතා පිළිබඳ වාර්තා කිරීම.</u>**

2.1. පහත සඳහන් අවශ්‍යතාවයන් සඳහා 2018 අංකඃ 19 දරන ජාතික විගණන පනතේ විශේෂිත ප්‍රතිපාදන ඇතුළත් වී ඇත.

2.1.1. විගණනය සඳහා අවශ්‍ය වු සියළු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණ වලදී අනාවරණය වූ පරිදි සංස්ථාව විසින් 2018 අංකඃ 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය පරිදි නියමිත ගිණුම් වාර්තා පවත්වා තිබුණි.

2.1.2. ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශයන්, 2018 අංකඃ 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය පරිදි ඉකුත් වර්ෂයට අනුරූපව සකස් කර තිබුණි.

2.1.3. 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ අවශ්‍යතාවය පරිදි, මා විසින් ඉකුත් වර්ෂයට කරන ලද සියළුම නිර්දේශයන්, ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශනයන්හි ඇතුළත් කර ඇත.

2.2. අනුගමනය කරන ලද පටිපාටි සහ ලබාගත් සාක්ෂි ප්‍රමාණාත්මක කරුණු වලට සීමාවූ අතර, පහත දැක්වෙන කරුණු සඳහන් කිරීමට අදාළ කිසිවක් මාගේ අවධානයට යොමු නොවීය.

2.2.1. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඇ) වගන්තියේ අවශ්‍යතාවය පරිදි; සාමාන්‍ය ව්‍යාපාර හැසිරීම් රටාවට බාහිරව සංස්ථාව විසින් එළඹෙන ලද කිසිදු කොන්ත්‍රාත්තුවක් සම්බන්ධයෙන් ඍජුව හෝ වක්‍රව, සංස්ථාවේ පාලන මණ්ඩලයේ කිසිදු සාමාජිකයෙකුගේ කිසිදු සම්බන්ධතාවයක් තිබුනේද යන්න සඳහන් කිරීමට.

2.2.2. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ අවශ්‍යතාවය පරිදි; සංස්ථාව අදාල කිසිදු ලිඛිත නීතියක්, සංස්ථාවේ පාලන මණ්ඩලය නිකුත් කළ සාමාන්‍ය සහ විශේෂ නියෝගයන් ( පහත සඳහන් අවස්ථා හැර ) අනුගමනය කර නොතිබුනේද යන්න සඳහන් කිරීමට).

| <u>නීතිය/නියෝගයට යොමුව</u> | <u>විස්තරය</u> |
|---|---|
| **(අ). ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | |
| (i). ii පරිච්ඡේදයේ 13.3 ඡේදය | - තාවකාලික පත්වීමක් පැවතිය යුත්තේ ස්ථිර පත්වීමක් කරන තුරු පමණක් වුවද, කළමනාකරු (අලෙවි) තනතුර වර්ෂ 10 කට වැඩි කාලයක් සිට පුරප්පාඩුව තිබුණු අතර, 2020 දෙසැම්බර් 31 දින දක්වා වැඩ බැලීමේ දීමනා ලෙස එකතුව රු 1,054,900.00 වූ මුදලක් සංස්ථාව විසින් ගෙවා තිබුණි. |
| (ii).viii. පරිච්ඡේදයේ 10 ඡේදය | - විධායක නිලධාරීන් සඳහා නිවාඩු දින වැටුප් ගෙවීම පිණිස අවම වශයෙන් පැය 8 ක් වැඩ කළ යුතු වුවද, පැය 8 කට අඩුවෙන් වැඩ කිරීම වෙනුවෙන් නිවාඩු දින වැටුප් ලෙස 2019 සහ 2020 වර්ෂ සඳහා පිළිවෙලින් රු 789,247.00 ක් සහ රු 462,076.00 ක් වූ මුදලක් සංස්ථාව විසින් ගෙවා තිබුණි. |

(ආ). රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ

| | |
|---|---|
| (i). 2015 අගෝස්තු 17 දිනැති අංක 21/2015 | - වාර්ෂික උත්සව සඳහා නැවත අයකර ගැනීමේ පදනම මත සේවකයන්ට රුඃ 10,000.00 ක අත්තිකාරමක් දිය හැකි වුවද, සංස්ථාව විසින් උත්සව සමය සඳහා නැවත අයකර ගැනීමේ පදනමින් තොරව මූල්‍ය ආධාරයක් ලෙස එක් සේවකයෙකුට රුඃ 52,000.00 බැගින් ගෙවා තිබුණි. සංස්ථාව විසින් භාණ්ඩාගාර අනුමැතිය පවා නොමැතිව 2019 වර්ෂය සඳහා වු ඉතිරි ගෙවීම් ලෙස රුඃ 879,2750.00 ක් ද, 2020 වර්ෂය සඳහා රුඃ 1,716,000.00 ක් ද ගෙවා තිබුණි. |
| (ii). 2008 දෙසැම්බර් 31 දිනැති අංක 30/2008 | - ආපදා ණය වශයෙන් ගෙවිය යුත්තේ උපරිම වගකීම වු රුඃ 250,000.00 හෝ මාස 10 ක මූලික වැටුප යන දෙකෙන් අඩු වටිනාකම වුවද, සංස්ථාව විසින් වලංගු සීමාවන් ඉක්මවා සේවකයන් හට ණය ලබාදී තිබුණි. |

2.2.3. 2018 අංකඃ 19 දරන ජාතික විගණනපනතේ 12(උ) වගන්තියේ අවශ්‍යතාවය පරිදි; සංස්ථාව එහි බලතල, ක්‍රියාකාරකම් සහ රාජකාරි ප්‍රකාරව කටයුතු කර නොතිබුනේද යන්න සඳහන් කිරීමට.

2.2.4. 2018 අංකඃ 19 දරන ජාතික විගණනපනතේ 12(ඌ) වගන්තියේ අවශ්‍යතාවය පරිදි; නියමිත කාල රාමුව තුළ, අදාල නීතිවලට අනුකූල වෙමින් අරපිරිමැස්මෙන් යුතුව, කාර්යක්ෂමව සහ ඵලදායීව සංස්ථාවේ සම්පත් මිලදී ගෙන, උපයෝජනය කර නොතිබුනේද ( පහත සඳහන් අවස්ථා හැර) යන්න සඳහන් කිරීමට.

(අ). සංස්ථාවේ ගිණුම්කරණ පද්ධතිය සහ මෙහෙයුම් පද්ධතිය අතර අන්තර් සම්බන්ධතාවයක් නොතිබුණි. එම පද්ධති දෙක අනුව හිඟහිම් ගනුදෙනුකරුවන් ප්‍රමාණය එකිනෙකට වෙනස් විය.

(ආ). 2020 දෙසැම්බර් 31 දිනට ලෙජර්ය අනුව ගනුදෙනුකරුවන්ගේ හිඟහිට තිබූ ශේෂය සහ මෙහෙයුම් අංශය විසින් පවත්වා තිබූ ඊපීආයිපී ගොනුව අනුව ශේෂය අතර රුඃ 1,157,360.00 වෙනසක් ඇති බව ආදර්ශ විගණන පරීක්ෂණයේදී නිරීක්ෂණය විය.

(ඇ). වට්නාකම පිළිවෙලින් රු: 1.518,436.00 ක් හා රු: 82,310.00 අතිරික්ත 32 ක් සහ ඌණතා 05 ක් නිරවුල් කිරීමට අවශ්‍ය කටයුතු කිරීමෙන් තොරව වර්ෂ 3 කට අධික කාලයක් පැවතුනි.

**2.2.5. වෙනත් කරුණු**

(අ). මූල්‍ය සේවා මත අගය එකතු කළ (VAT) බදු ලෙස අයකර ගතයුතු රු: 2,185,511.00 ක මුදලක් වර්ෂ 03 කට අධික කාලයක් අයකර නොගෙන පවැතුනි.

(ආ). සංස්ථාව 2019 සහ 2020 වර්ෂ සඳහා සේවකයින්ගේ නිවාඩු මුදල් කිරීම් ලෙස සේවකයින් හට පිලිවෙලින් රු: 1,245,556.00 ක් සහ රු: 1,520.509.00 ගෙවා තිබුණි. කෙසේ වුවද, එම කාල පරිච්ඡේදය සඳහා සංස්ථාව විසින් පැමිණීමේ දිරිගැන්වීමේ දීමනා ලෙස 2019 සහ 2020 වර්ෂ සඳහා පිළිවෙලින් රු: 208,969.00 සසහ රු: 121,984.00 ක් ගෙවා තිබුණි. ඒ අනුව සංස්ථාව එකම අරමුණක් සඳහා ප්‍රතිලාභ දෙකක් ගෙවා තිබුණි.



ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති